# කරාබු නැටි

## *Syzygium aromaticum*

## Myrtacea



| කරාබුනැටි | **Syzyygium aromaticum** |
| --- | --- |
| **පර්යාය** | Eugeina Caryophyllus Thumb |
| **කුලය** | Myrtacea |
| **වැවෙන ස්ථාන** | උඩරට තෙත් බිම්වල සරුවට වැඩෙන මධ්‍යම ප්‍රමාණයේ මීටර් 15 ක් පමණ උස ගසකි. |
| **ස්වභාවික ලක්ෂණ** | ශාඛා දසත විසිරී පවතී. පිරමීඩයක හැඩය ගනී. කුඩා පත්‍ර රැසකි. සාමාන්‍ය වෙනසකින් යුක්තය. දිලිසෙන සුළුය. මේරූ පත්‍ර කළු කොළ පැහැයක් ගනී. පුෂ්පයෝ අක්‍රමවත්‍ය. |
| **ඖෂධ සඳහා යෙදිය හැකි අංග** | ගෙඩි, මල්, නැටි, මනිපත්‍ර |
| **සුවකළ හැකි රෝග** | පණ්ඩු රෝග, අජීර්ණය, වමනය, පිපාසය, ඇදුම, අරුචිය, අග්නිමාන්දය, අම්ල පිත්ත. |
| **නිෂ්පාදිත ඔසු** | ලවංගාදී ක්වාතය, ලවංගාදී චූර්ණය, කරාබු අර්කය |

# ඇහැල

## *Cassia fistula*

## Leguminosae



| ඇහැල | **Cassia Fistula WILLD** |
|---|---|
| **පර්යාය** | Cathartocarpus Fisttula PER<br>Crhombifolia SBENT TRIM |
| **කුලය** | Leguminosae |
| **සංස්කෘත නාමය** | ආරග්වද-රාජවෘක්ෂ |
| **ඉංග්‍රීසි නාමය** | Aragwada-Raja |
| **දෙමළ නාමය** | තිරුකොණ්ඩයි |
| **වැවෙන ස්ථාන** | වියලි කලාපයට අයත් වනාන්තරවල වැවෙන වෘක්ෂයක් ලෙස දැක්විය හැක. අනුරාධපුරය, කුරුණෑගල, රක්වාන වැනි පෙදෙස්වල මෙම අහැල ශාකය සුලභව දක්නට ලැබේ. |
| **ස්වභාවික ලක්ෂණ** | මධ්‍යම ප්‍රමාණයේ ගසකි. පොත්ත මටසිලුටුය. අළු පැහැතිය. ළපටි කාළයේ සුඹුල බොර පැහැතිය. ගොරෝසුය. වැඩුණු ගසක ශාඛා රැසකි. දසත විසිරී පවතී. මීටර් 9 සීමාව නොඉක්මවයි. දිගැති පත්‍ර වියලි කාලයේ හැලීයයි. නැවත දළු ලන්නේ සීත ඍතුවේදීය. මල් පොහොට්ටු හට ගන්නේ අප්‍රේල් මාසයේ වන අතර මල් පොකුර සිලින්ඩරාකාරය. අහැල කරලක් තුල බීජ 25-100 දකවා පුමාණයක් ඇත. |
| **ඖෂධ සඳහා යෙදිය හැකි අංග** | මුල්, කඳේ පොතු, කරල්, කොළ, මල්, සහ බීජ |
| **සුවකළ හැකි රෝග** | උණ,හෘද රෝග, ආමාශගත රෝග |
| **උඳුගෝච්චෝ කැමට/ පණු කැවිල්ලට** | අමු ඇහැල පොතු අඹරා ගෑම |
| **විරේකය පිණිස** | නොමේරූ කොළ උනුකර රාත්‍රී නින්දට පෙර පානය කිරීම |
| **නිෂ්පාදිත ඔසු** | ආර්ගවදාදිය , කීරමලාදී ඝෘතය |

# කජු

## *Anacardium oceidentale*

## **Anacardiaceae**



| | |
|---|---|
| **කජු** | **Anacardium Occidentale LINN** |
| **පර්යාය** | Aeajuba Oceidentalis |
| **කුලය** | Anacardiacae |
| **ස්වභාවික ලක්ෂණ** | මධ්‍යම ප්‍රමාණයේ ගසකි. කඳ එතරම් විශාල නැත. වක ගැසී ඉහලට වැඩේ. ස්ව් දෙසට විහදී යන ශාඛා පවතී. පත්‍ර දිගට නොවැඩේ.කෙලවර රවුම්ය. මල් පොකුරු වශයෙන් වැඩේ. කොළ පැහැතිය. ඵලය පිහිටන්නේ පුහුලමේ කෙලවරය.කජු බීජය තුල ඇති මදය සුදු පැහැයක් ගනී. |
| **ඖෂධ සඳහා යෙදිය හැකි අංග** | මද, පුහුලම, (පුහුලම මිරකාගත් යුෂ) තෙල් |
| **සුවකළ හැකි රෝග** | ක්‍රිමි රෝග<br>ආමවාත<br>මුත්‍රාබාධ<br>හමේ රෝග |

# කරපිංචා

## *Murraya koenigii*

## Rutaceae



ලංකාවේ බොහෝ ගෙවතුවල දක්නට ලැබෙන අඩි 10-20 අතර උසැති සුලභ ශාකයකි. ඖෂධයක් සේම ආහාර රස ගන්නවන්නක් සේද ඉතා වැදගත්ය.

අළු පාට පොත්තක් සහිත මෙම ශාකයේ ළපටි දලුවල යාන්තමින් බූව ඇත. මෙහි පත්‍ර ලං ලංව පිහිටා තිබේ. පත්‍ර පිහිටීම අසමපක්ෂය. පත්‍රයක් හෙවත් කිනිත්තක් අඟල් 5-10 දක්වා දිගය. පත්‍රයේ ප්‍රාක්ෂය මදක් බූව සහිතයි. එක කිනිත්තක පත්‍රිකා 15-25 අතර සංඛ්‍යාවක් ඇත. පත්‍රිකාවක් අඟල් 1 1/2 පමණ දිගය. ඒවායේ නටු කෙටි වන අතර හැඩය අයතලංසාකාරය. පත්‍රිකාවල උඩ පැත්ත සිනිඳුය.

මල අඟල් 1/2 ක් පමණ වේ. සුදු පාට මල් සුවඳවත්ය. මල් පිහිටා ඇත්තේ බෙදුනු අග්‍රස්ථ බහු-අක්ෂවලයි. නිපත්‍රිකා ඉතා කුඩාය. දල විවෘතයි. ඒවයේ තැන් තැන්වල තිත් වැනි ගැට ඇත.

මාංසල මඩලක් මත රේණු තිබේ. ඩිම්බ කෝෂය ද්වීකෝෂ්ඨය. ජායංගදරයක් නොමැත. දිගු කීලයක් සහිත වන අතර කලංකය විශාලය. ඵලය අඟල් 1/3 පමණ වූ කළු පාට බදරියකි. එහි බීජ දෙකක් ඇත.

කරපිංචා කොළවල හා නටුවල ප්‍රබල සුවඳක් ඇත. ව්‍යංජන රසවත් කිරීම පිණිස කරපිංචා කොළ හා නටු ගනු ලැබේ. කරපිංචා ගසේ ලීය තදය. දුඹුරු පාටට හුරු ළා කහ පාටය. එය කල්පවත්නා ලීයකි.

- ❖ කරපිංචා බහුවාර්ෂික ශාකයක් වන අතර RUTACEAE කුලයට අයත්ය.

**ඖෂධීය වටිනාකම**

- කරපිංචා සිසිල්ය. කසටය.
- අර්ශස්, දාහ, පණු හා කුරුමිණි රෝග, දැවිල්ල, කුෂ්ට, ලේ දෝෂ, ඉදිමුම්, වණ ආදී රෝග සමනය කරයි.
- හෘදයාබාධ හට ගන්වන කොලෙස්ටරෝල් අඩුකරලීමට කරපිංචා ඉවහල් වන බව අනාවරණය වී තිබේ.
- එහෙයින් දේශීය වෛද්‍යවරු හෘදයාබාධ වළක්වා ගනු කැමති අයටත්, හෘද රෝගීන්ටත් කරපිංචා කොළ ඉස්ම යෙදූ කැඳ බීමට නිර්දේශ කරති.
- කරපිංචා දලු සම්බෝල වශයෙන් හෝ මැල්ලුම් වශයෙන් කෑමට ගැනීමද ගුණදායකය. දේශීය වෛද්‍යවරුන්ට අනුව ව්‍යංජනවලට දමන කරපිංචා ව්‍යංජනය සමගම ආහාරයට ගත යුතුය.
- කරකැවිල්ල හා වමනය ආදිය ඇති අයටත්, විෂ ශරීරගත වූ අයටත්, කුසගිනි නොමැති, අජීර්ණාබාධ නිතර වැලඳෙන අයටත්, සුළු උමතු ගති ඇති පුද්ගලයින්ටත් කරපිංචා කැඳ ප්‍රශස්ථ ඔසුවක් බව දේශීය වෛද්‍යවරුන්ගේ පිළිගැනීමයි.

| **කරපිංචා** | **Murraya Koenigil (L) Spreng** |
|---|---|
| **පර්යාය** | සුරභිනිම්බ , සුරභී , කාලශාක |
| **කුලය** | Rutaceae |
| **ස්වභාවික ලක්ෂණ** | අග්නිදිග ආසායාකරයේ බොහෝ රටවල වැවෙන මෙය ලංකාවේ නොයෙක් ප්‍රෙද්ශවල වැවේ. වියලි කලාපයේ බහුලව දක්නට ඇත ආහාර රසවත් කිරීමට මෙන්ම අත්බෙහෙතක් හා ඖෂධයක් ලෙස අවශ්‍යවන නිසා සෑම ගෙවත්තකම වගාකරගතයුතු ශාකයකි. |
| **ඖෂධ සඳහා යෙදිය හැකි අංග** | පංචාංගයම භාවිතා කරයි |
| **සුවකළ හැකි රෝග** | සෙම සහ වාතය සමනය කරයි. අජීර්ණය, වමනය, බඩගින්න වැඩීම. |
| **අධික රුධිර පීඩනය හා ලේවල මේදය අඩුකිරීමට/ සර්ප විෂ සමනයට** | පොල් කිරි රහිතව කරපිංචා කොලවලින් පමණක් සකසාගත් කැඳ  දිනපතා උදේ හිස්බඩ  පානය කිරීම |

# කෝමාරිකා

## *Alovera Linn.*

## **Liliaceae**



### ශාකයේ ස්වාභාවය -

මෙය ඉතා ප්‍රකට ඖෂධයක් වන අතර අඩි 1-2 අතර උසට වැඩෙන ශාකයකි. එහි පත්‍ර නිර්වෘන්තකය. ඒවා සෙව්වන්දියක හැඩයට පිහිටා ඇත. පත්‍ර ඉතාම මාංසලය. සාමාන්‍යයෙන් සෙ.මී. 38 පමණ දිගය. පත්‍රයක් සෙ.මී. 7 1/2 පමණ පළලය. මී.මී. 19 ක් පමණ ඝනකම්ය. පාදයේ සිට අග්‍රය දක්වා පත්‍ර ක්‍රමයෙන් පටුවී යයි. පත්‍ර අග්‍රය උල්ය. දාරය සකණ්ටක ලෙස දන්තුරය. ශාකයේ පුෂ්ප එල්ලෙමින් ඒකාක්ෂකවල ඇත. පුෂ්ප කහ පාටය. පරිපුෂ්පයේ කොටස් සිලින්ඩරාකාර නළයක් වශයෙන් ඒකාබද්ධ වෙයි. ඵලය ස්ඵෝටිකාවකි.

### ප්‍රභේද

1. වෙරා : කිනෙන්සීස් (vera : kinensis)

2. වෙරා : ලිටොරාලිස් (vera : litoralis) යනුවෙනි.

මුලින් කී ප්‍රභේදයේ පත්‍ර පාදවල පැහැදිලි දම් පාටක් දක්නට ලැබේ. දෙවනුව කී ප්‍රභේදය වෙරළබඩ පෙදෙස්හි හමුවේ. එය මුලින් කී ප්‍රභේදයට වඩා කුඩාය. ලංකාවේ වැඩි වශයෙන් දක්නට ලැබෙන්නේ මේ දෙවැනි ප්‍රභේදයයි.

කෝමාරිකාවල ලක්ෂණ අනුව එය ශුෂ්ක ශාකයක් බව කිව හැකිය. එය උතුරු අප්‍රිකාවට දේශීය වූ ශාකයකි. බටහිර ඉන්දීය කොදෙව්, ඉන්දියාව, ලංකාව හා චීනය ආදී රටවල වැවේ. ශාකයේ ප්‍රචාරණය සිදු වන්නේ මොටෙයියන් මඟිනි.

### ඖෂධීය වටිනාකම

- මෙම ශාකයේ පත්‍ර ඖෂධයක් ලෙස භාවිතා කෙරේ.
- මාංසල පත්‍රවල අධික ලෙස නානු ඇත. මේවා ඉතා සිසිල්ය. අර්ශස් රෝග හා ගුද මාර්ගය වේළීමේ ආබාධවලදී මේ නානු යොදා පිළියම් කෙරේ.
- ඇස් රෝගවලදී ඇසට දැමීමටද යොදා ගැනේ.

- කෝමාරිකා කසට රසය, සිසිල්ය, ඇසට හිතය, මල බුරුල් කරයි.
- රසායන ගුණයෙන් ඉහළයි.
- පෙනහලු තුවාල, වාත, පිත හා සෙම කිපීමෙන් ඇතිවූ රෝග, ඉදිමුම්, රුජා, ඇවිල්ල, දද, කුෂ්ට, ලේ ගෙඩි හා විවිධ සමේ රෝග නැති කරයි.
- සෙංගමාල, ගුල්ම, පිලීහා රෝග හා උමතු රෝග ආදියෙන් පෙළෙන අයට හිසේ දැමීම සඳහා පිළියෙළ කෙරෙන තෙල් වර්ගවලට වෙනත් ඖෂධ සමග කෝමාරිකා යොදනු ලැබේ.
- නූතනයේ රූපලාවණ්‍ය ශිල්පීන්ට කෝමාරිකා නැතිවම බැරි ද්‍රව්‍යයකි. සම පැහැපත් කිරීම, සමේ ලප පැල්ලම් මැකීම, බිබිලි හා කුරුලෑ සුව කිරීම, සමේ තෙතමනය ඇති කිරීම ආදිය සඳහා කෝමාරිකා මදය හා නානු බහුලව භාවිතා කෙරේ.

| කෝමාරිකා | **Aloevera  LINN** |
|---|---|
| **පර්යාය** | Alove indica  ROYLE<br>Alove barbadensis  LINN<br>Alove Perfolazata WILLD |
| **කුලය** | Lilaceae |
| **වැවෙන ස්ථාන** | ගෙවතුවල මෙන්ම මිදුලේ මල් පෝච්චි වලද වවනු ලබන්නකි. යාපනය, මන්නාරම, ආදී වියලි ප්‍රෙද්ශවල සුලභව ඇත. ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රෙද්ශයකද මෙම ශාකය දක්නට ලැබේ. |
| **ස්වභාවික ලක්ෂණ** | පඳුරු විශේෂයකි.උසට නොවැඩේ. අඩි ½ පමණ වන්නේද කලාතුරකිනි. කෙඳි සහිත මූලයකින් යුක්තය. වසර ගණනාවක් පවතී. මසින් පිරුණු ඝන පත්‍ර නටු රහිතය. පළලින් එය අඟල් 3 ක් පමණ වෙයි. පටන් ගැන්මට කෙළවර උල් සහිතය. තියුණු නොමැති කටු පත්‍රයේ දෙපසෙහිම පිහිටා ඇත. සිනිඳුය. අක්‍රමවත් පුල්ලි දෙපසෙහිම පිහිටයි. මල්වල නටුව රත් පැහැයක් ගනී. |
| **සුවකළ හැකි රෝග** | උණ, අක්ෂි රෝග, ශූල, අර්ශස්, පිත්තාශය ගත අක්මා රෝග, අග්නිමාන්දය, ගුල්ම, දාහ, කාමලා, රත්පිත්, පිත්තාශ්මරී, ඇසේ නගනයට, අක්ෂි ශොථය<br>තුවාල හේතුකොටගෙන අවට ඇතිවන ඉදිමුව දුරලීම පිණිස ඇඹුල් දොඩම් අඹරා ගනු ලබන තික්තාබින් ඉදිමුව පවතින ස්ථානයේ ගෑම යහපත්ය. |
| **නිෂ්පාදිත ඖසු** | කුමාරි ආසවය,  කුමාරි පද්ම තෙල,  කුමාරිකා වටී,<br>රජස් ප්‍රවර්තිනී වටී |

# අන්නාසි

## *Ananas sativus*

## **Bromeliaceae**



| | |
|---|---|
| **අන්නාසි** | **Ananas Sativus,** LINN |
| **පර්යාය** | Synonym – Bromelia amanas, WILL |
| **කුලය** | Bromeliaeae |
| **ස්වභාවික ලක්ෂණ** | ආයු කාලය වසර 2 කි. ශාඛා නොමැත.<br>ශාබ කොලයක් අඩි 3 ක් හෝ 4 ක් පමණ දිගට වැඩේ.<br>පෙති තුනකින් සමන්විත පුෂ්ප ගභියක් ද පවතී.<br>අධික ඉස්මෙන් හා රසයෙන් පිරුණු ඵලයක් දරයි. |
| **ඖෂධ සඳහා යෙදිය හැකි අංග** | ගෙඩි සහ කොළ ඉස්ම |
| **සුවකළ හැකි රෝග** | මාස් ශුද්ධියේ දී ඇතිවන අවහිරතා මග හරවයි.<br>ගර්භාෂය සංකෝචනය කරවයි.<br>ස්කැචිරෝගයට හිතකරය.<br>සෙංගමාලය, ඉක්කාව<br>විරේක කිරීමට කොළ ඉස්ම යොදා ගනී.<br>බඩ පිපුමට නොමේරූ අන්නාසි යුෂ විනාකිරි සමග මුසු කර භාවිතා කරයි. |
| **කොළ ඉස්ම** | ප්‍රබල කෘමිනාශකයකි.<br>පලතුරු විරේචන ගුණ ඇත්තකි. |

# ඉඟුරු

## *Zingiber officinale*

## Zingiberaceae



| | |
|---|---|
| **ඉඟුරු** | **Zingiber officinale Roscoe** |
| **පර්යාය** | නාගර , ශුණ්ඨි , විශ්ව |
| **කුලය** | Zingiberacea |
| **ස්වභාවික ලක්ෂණ** | වගාකරන රටවල් අනුව ඉඟුරු වර්ග රාශියකි. චීන ඉඟුරු, කොචින් ඉඟුරු, අප්‍රිකා ඉඟුරු ආදී වශයෙනි. ශ්‍රී ලංකාවේ ඖෂධ පිණිස යොදාගනු ලබන්නේ කුඩා අල සහිත වර්ගයයි. |
| **ඖෂධ සඳහා යෙදිය හැකි අංග** | අල |
| **සුවකළ හැකි රෝග** | අරුචි, බඩගින්න වැඩවීම, අජීර්ණය, වමනය, අතීසාරය, වියලි අර්ශස්, පීනස, කාස, ශ්වාස, හික්කා හා උණ නසයි., |
| **උල් කටු ඇනුන විට** | ඉඟුරු , සීනි සමග තලා උණු අළුවේ තම්බා බැඳීමෙන් ඇණුන කටු ඉවත්කල හැකිය. |

# කහ

*Curcuma longa*

**Scitaminaceae**



| | |
|---|---|
| කහ | **Curcuma Longa L.** |
| **පර්යාය** | හරිද්‍රා , රජනි , නිශා , පීතා |
| **කුලය** | Scitaminaceae |
| **ස්වභාවික ලක්ෂණ** | ශ්‍රී ලංකාවේ මෙන්ම ඉන්දියාවේ සියළුම ප්‍රදේශවල වැවෙන ශාඛයකි |
| **ඖෂධ සඳහා යෙදිය හැකි අංග** | අල සහ කොළ ඖෂු පිණිස යොදා ගනී |
| **සුවකළ හැකි රෝග** | ජීවානු නාශකයක් මෙන්ම විෂ නාශකයකි. ලේ පිරිසිදු කිරීම සඳහා යොදා ගනී. බාහිර ආලේපය මගින් වේදනා ඉදිමුම් හා තුවාල සඳහා යොදා ගනී. පීනස සඳහා ඉඟුරු සමග යොදා ගනී. සමේ රෝග සඳහා |
| **මුළුතැන්ගෙය සඳහා** | ආහාර වර්ණ ගැන්වීමට හා රස ගැන්වීමට යොදා ගනී. |

# හාතාවාරිය

## *Asperagusra cemosus*

## Liliaceae



| | |
|---|---|
| හාතවාරි | **Asparagusracemosus** |
| පර්යාය | ශතාවරි , සුපත්රා , භීරු |
| කුලය | Liliaceae |
| වැවෙන ස්ථාන | මධ්‍යම දේශගුණයක් සහිත උස් බිම්වල පහතරට තෙත් කලාපයේත් වැවේ. |
| ඖෂධ සඳහා යෙදිය හැකි අංග | අල සහ කොළ |
| සුවකළ හැකි රෝග | අතීසාරය, අග්නිමාන්දය, මුත්‍රාබාධ, ප්‍රෙමහ, වකුගඩු හා සම්බන්ධ  රෝග, ගොනෝරියාව, අර්සස්, මලබද්ධය |
| නිෂ්පාදිත ඔසු | ශතාවරී ඝෘතය, ශතාවර්යයාදි චූර්ණය |
| | |

# කටරොලු

## *Clitoriya ternatea*

## Leguminosae



| | |
|---|---|
| කටරොලු | **Clitoriya Ternatea LINN** |
| **පර්යාය** | Flos Caeruleus RUMP |
| **කුලය** | Leguminosae |
| **වැවෙන ස්ථාන** | කැලෑබදව වැඩෙන්නක් වුවත් අලංකාරය සඳහා ගෙවතුවලද වගාකරනු ලබන පැලෑටියකි. |
| **ස්වභාවික ලක්ෂණ** | වර්ෂාධික ආයුකාලයක් පවත්නා යමක එතී වැඩෙන ශාකයකි. කඳ සිලින්ඩරාකාරය. දීර්ඝය. ඒ වටා කෙඳි පවතී. ඉත්තක ඇත්තේ පෙති 5 කි. |
| **සාමාන්‍ය ප්‍රතිකාර විධි** | නාසයෙන් ලේ ගැලීම නැවැත්වීම පිණිස නිල් කටරොලු මුල් යුෂ බිංදු කීපයක් නාසයට දැමීම සුදුසුය.<br>ජලෝධරයට කටරොලු ඇට චූර්ණය අවුරුදු ½ ක් පමණ උදේ සවස කිරීම සුවදායකය. |

# ගොටුකොළ

*Hidrocotyle asitica*

**Umbelliferae**



අඩි 2-3 පමණ දිගට බිම දිගේ ඇදී යන ශාකයකි. එහි ඇති ගැටවලින් මුල් හටගනී.

රවුම් හැඩයෙන් යුක්ත පත්‍ර කුඩාය. සෙන්ටි මීටර් 2-4 දක්වා දිගයි. පත්‍රයේ අග කොටස දන්තුරය.

මල් ඉතා කුඩාය. රෝස පැහැයට හුරු රතු පාටය. ඵලය කුඩාය.

ගොටුකොළ ඉන්දියාවේ සහ ලංකාවේ අඩි 7000 දක්වා උස් ප්‍රදේශයන්හි තෙතමනය සහිත බිම්වල සරුවට වැවේ.

**ඖෂධීය වටිනාකම**

- ගොටුකොළ නැණ නුවණ වඩන, ධාරණ ශක්තිය සරු කරන, කුසගිනි වඩවන ඖෂධයක් ලෙස ආදියේ සිටම ප්‍රසිද්ධය.
- උගුරේ සෙම පහ කොට කටහඬ මිහිරි කරයි.
- හදවතට හිතකරය.
- රුධිරය පිරිසිදු කරයි.
- පීනස සුව කරයි.
- ඉදිමුම් හා මලබද්ධය පහ කරයි.
- ගොටුකොළ සංස්කෘත ග්‍රන්ථවල හැඳින්වෙන්නේ මණ්ඩූකපර්ණී යන නමිනි.
- මෙරට හීන් ගොටුකොළ සහ මහ ගොටුකොළ යයි දෙවර්ගයකි. මින් හීන් ගොටුකොළ වඩා ගුණදායකය.
- කුඩා දරුවන්ගේ පණු අමාරුවලට ගොටු දඬු හා වළඟසාල් තම්බා බොන්නට දීම මෙරට අනාදිමත් කාලයක සිට පැවති ගෘහස්ත ප්‍රතිකාරයකි.
- ගොටුකොළ තන කිරි වඩවයි.
- හොරි, වණ ආදියේ කුණ කපා මස ලියලවයි.

- පාණ්ඩුව හා කැස්ස සුවකරයි.
- ගොටුකොළ කාම ශක්තිය වඩවන ඔසුවකැයි පැවසේ.
- ගොටුකොළ යුෂ රතුළු ූණු හා වෙනත් ඖෂධ වර්ග සමග එකට යොදා බීමෙන් පීනස, අර්ශස් හා බාලක අතීසාරය හා තොල කට වණ වීම සුව වේ.
- ධාරණ ශක්තිය ලැබීමට ගොටුකොළ චූර්ණයත්, උළුක්කුවට ගොටුකොළ අමු කහ සහ මැල්ල පොතු යොදා තැනූ මැල්ලුමත්, දිවි මකුළු විෂට ගොටුකොළ යුෂයත් ප්‍රත්‍යක්ෂ ඔසු වේ.

| ගොටුකොළ | **Hidrocotyle Asitica  LINN** |
|---|---|
| **කුලය** | Umbelliferae |
| **සංස්කෘත නාමය** | බ්‍රාහ්මී/ මණ්ඩූකපර්ණී |
| **ඉංග්‍රීසි නාමය** | Indian Penny Wort |
| **දෙමළ නාමය** | වල්ලාටිකේරාය |
| **වැවෙන ස්ථාන** | තෙත පස ප්‍රිය කරයි. කඳු මුදුනෙහි මෙන්ම බෑවුම්වල සරු පසෙහිද වැවේ. තණකොළ හා මිශ්‍රව පැවතුණත් පහසුවෙන් හඳුනාගතහැකි ශාකයකි. |
| **ස්වභාවික ලක්ෂණ** | බිම දිගේ ඇදී යයි. කඳේ තැනින් තැන ගැටිති පවතී. එම ස්ථානවලින්ව මුල් විහිද පොළොව බදා ගනී. එසේම එම ගැටිති පවතින සෑම ස්ථානයකම දීර්ඝ නටුවක් සහිත පත්‍ර දෙපසට පිහිටයි. පත්‍ර වෘත්තාකාරය. විශ්කම්භය අඟල් ½ -2 දක්වා විහිදිය හැක. ළපටි කොළා යටිපැත්තේ සියුම් කෙඳි පවතී. පත්‍රවල මෙන්ම නටුවේත් පවතින්නේ සිත් ඇදගන්නාසුළු සුවඳකි. මල් සුදු පාටය. |
| **ඖෂධ සඳහා යෙදිය හැකි අංග** | මුළු පැලෑටියම |
| **සුවකළ හැකි රෝග** | රුධිරගත රෝග, නාඩිගත රෝග, කෂ්ඨ, ක්ලාන්තය, අතක වීම, සමාජ රෝග,  උණ, අරුචිය, මුත්‍රාබාධ, බරවා |
| **මතකය අවදි කරවීමට** | ගොටුකොළ යුෂට එළකිරි අවැසි පණ මිශ්‍රකර සති ගණනක් නොකඩවා පාවිච්චියට ගැනීම |
| **ළදරුවන්ගේ කැස්සට** | ගොටුකොළ හොඳින් අඹරා පපුවේ තවරන්න.( සෙම බුරුල්වීම සඳහා) |
| **නිෂ්පාදිත ඔසු** | බ්‍රාහ්ම ඝෘත |
| **රසායනික සංයෝග** | මැලියමක් පවතී. ටැනින් අම්ලයද ඇත. එපමණක් නොව සීනි, ලුණු, ඇල්බියුමින්, නයිට්‍රජන් මිශ්‍රිත ඇල්කලොයිඩයකුත් , බ්‍රාහ්මින් හර්පෙස්ටින්ද, සුට්‍රිචිනින් සමග ඩිමැනින්ටල හා බී සිටොස්ටෙරොල සංයෝගය පවතී. |

# රසකිඳ
*Coccolus cordifolius*
**Memispermaceae**



| | |
|---|---|
| රසකිඳ | **Tinospora** |
| පර්යාය | Coccolus Cordifolius |
| කුලය | Memispermaceae |
| සංස්කෘත නාමය | ගුඩුචි |
| ඉංග්‍රීසි නාමය | Heart Leaved / Moon Seed |
| වැවෙන ස්ථාන | ශ්‍රී ලංකා භූමියේ සෑම කැලෑවකින්ම සොයාගත හැකි වැල් විශේෂයකි. විශ්ෂය ගනයේ ඖෂධ ශාකයක් වන රසකිඳ මධ්‍යම පළාතේ, උතුරු සහ නැගෙනහිර පළාතේත් වගාකරනු ලබන්නකි. |
| ඖෂධ සඳහා යෙදිය හැකි අංග | මුල්, කොළ, කඳ |
| සුවකළ හැකි රෝග | උණ, ආම වාත, මුත්‍රා දැවිල්ල, කුෂ්ඨ, ශෘද රෝග, සෙංගමාලය |

# ඉරමුසු

*Hemidesmus idicus*

**Asclepiadaceae**



| | |
|---|---|
| **ඉරමුසු** | **Hemidesmus Idicus Br.** |
| **පර්යාය** | ශාරිවා , ගෝප කන්යා , ගෝපි , ගෝපවල්ලි |
| **කුලය** | Asclepiadaceae |
| **ස්වභාවික ලක්ෂණ** | ඉන්දියාවේ මෙන්ම ලංකාවේ සෑම ප්රදේශයන්හීම වැවේ. |
| **ඖෂධ සඳහා යෙදිය හැකි අංග** | පැලෑටිය හා මුල භාවිතා කරයි. විශේෂ ක්‍රියාකාරීත්වයක් මුලේ පොත්තේ ඇත. |
| **සුවකළ හැකි රෝග** | තුන්දොස් සමනය කරයි.කුෂ්ඨ, දද,උණ, දේහ දුගඳ, ගිනි මද බව, ශ්වසනය, කාසය, අරුචි, ආම, පිපාසය, දාහය ලේ දොස් ප්‍රදර රෝගය සඳහා, තුවාල සේදීම සඳහා |
| **මී විසට** | ඉරමුසු මුල් කසාය ගිතෙල් සමග පෙවීම |

# කෙකටිය

## *Aponogeton natans*

## Aponogetonaceae



Aponogeton නම් උද්භිද ගණයට අයත් ශාක විශේෂ හයක් ලංකාවෙන් හමුවන අතර ඒ සියල්ල පොදුවේ කෙකටිය නමින් හඳුන්වයි. එයින් විශේෂ හතරක් ලංකාවට ආවේණික මෙන්ම දුර්ලභ ද වේ. මෙහිදී විස්තර කරන විශේෂය දේශීය වන අතර එය ද තර්ජනයට ලක්විය හැකි අවධියක පසුවන බව උද්භිද විද්‍යා මූලාශ්‍රවල සඳහන්ව ඇත.

**ශාකයේ ස්වාභාවය -**

කශේරු යනුවෙන් ද හඳුන්වන කෙකටිය සෙ.මි. 5 පමණ විශ්කම්භයක් සහිත පත්‍යණ්ඩාභ අලයකියන් යුත් නිමග්න ජලජ පැලෑටියකි.

අනෙක් විශේෂ තුනට වඩා මෙහි විස්තර කරන විශේෂයේ අලය විශාලවට වැඩීම අනෙක් වර්ගවලින් වෙන්කර ගැනීම පහසු කරවයි.

සෙ.මි. 50 දක්වා දිගට සහ සෙ.මි. 4.5 පළල පත්‍රවල හැඩය බොහෝ විට පටු ලංසාකාර හෝ පටු අණ්ඩභ වේ. පත්‍ර දාරය තරංගී හෝ රැලි සහිත ආකාරයකි. පත්‍ර බොහෝමයක් ජලය තුල ගිලී පවතී.

කුඩා මල් සහිත අලංකාරවත් පුෂ්ප මංජරිය සෙ.මි. 13 පමණ වන දිගු වන අතර අක්ෂය සෙ.මි. 75 පමණ දිගට වැඩේ. සුවඳැති මල් සුදු, රෝස හෝ ළා දම් පැහැති ය.

Aponogeton natans නම් දේශීය කෙකටිය විශේෂයේ පත්‍ර ජලය මත වැඩෙන අතර පත්‍රවල ප්‍රමාණය කුඩා මෙන්ම හැඩය ද තරමක් වෙනස් ආකාරයක් ගනී.

කෙකටිය Aponogetonaceae උද්භිද කුලය අයත් ශාක විශේෂයන් ය.

**යොදාගත හැකි රෝග අවස්ථා -**

අක්ෂි රෝග, ජර්දි, අතිසාර, ග්‍රහණි, විසූචිකා, රක්ත අතිසාර, රක්ත අර්ශස්, ප්‍රදර රෝග, සෝම රෝග, ප්‍රමේහ, වමනය, ශරීර දුර්වලතා, විසර්ප ආදියට ප්‍රතිකාර කිරීම සඳහා විශේෂයෙන් කෙකටිය ශාකයේ අල සහ මල් භාවිතා කරයි.

කෙකටිය ඇසට හිතකර, වණවල ඉදිමුම් සමනය කරන, දාහය සංසිඳුවන, වමනය වලක්වන, ශුක්‍ර වඩවන, ආහාර රුචිය ඇති කරවන, හෘදය බලගන්වන, මව්කිරි ජනනය කරන ආදී ගුණයන් රැසකින් සමන්විතයි.

**යෝග -**

- විසර්පවලට කෙකටිය අල ගිතෙලින් අඹරා ආලේප කරයි.
- අතීසාරයට අල තැම්බූ ජලය හෝ කෂාය බොන්නට දෙයි.
- ඇස් රෝගවලට වැල්මී සමඟ අඹරා පුරවලියන් යොදයි.
- කහ උණ සඳහා කෙකටිය මල්වලින් කැඳ සාදා බොන්නට දෙයි.
- කෙකටිය අල තම්බාගත් ජලය, මී පැණි සහ වී පොරි සමඟ කලවම් කොට බීමෙන් වමනයට සහනය ලැබේ. තෘෂ්ණ හෙවත් පිපාසයට මල් හෝ අල තැම්බූ වතුර පානය කිරීම ගුණ ය.
- අම්ලපිත්ත හෙවත් ගැස්ට්‍රයිටීස් රෝගයෙන් පීඩා විඳින අයට කැඳ පිණිස පානයට දීම හෝ සම්පූර්ණ පැළයම තම්බා පානයට දීම හිතය.
- ගර්භනී මව්වරුන්ට ගර්භය නිසිලෙස ස්ථාපනය වීමට කෙකටිය අල බැද තම්බා කෑමට දෙයි.
- ප්‍රමේහ රෝගීන්ට ආහාරයක් ලෙස අල හෝ මල් කුමන ආකාරයකින් හෝ සකසා දීමත්, කෂය ලෙස සකසා දීමත් සිදු කරයි.
- දරුවන් ලැබූ මව්වරුන්ට ලේ වහනය වැලැක්වීමටත්, කිරිදෙන මව්වරුන්ට මව්කිරි වැඩීමටත් අල සහ මල් කැඳ සහ ව්‍යංජන ලෙස සකසා දීම ගුණදායක ය.
- කෙකටිය අල ව්‍යංජනයක් ලෙස සකසා ආහාරයට ගනී.
- එමෙන්ම අල තම්බා පොල් සමඟ ආහාරයට එක්කර ගත හැකිය. එය ශරීර ශක්තිය වඩවන ආහාරයක් ලෙස සැලකේ.
- කෙකටිය මල් ද (මල් සහ මල් නටුව) කිරට සහ තෙල් දමා ප්‍රනීත ව්‍යංජනයක් ලෙස පිස ගත හැකිය. කෙකටිය ආහාරයට ගැනීමෙන් පිත කෝප වී හට ගන්නා ඇඟපත දැවිල්ල, මුත්‍රා දැවිල්ල, බඩ දැවිල්ල, මල මාර්ගයේ දැවිල්ල ආදී පීඩාකාරී අවස්ථාවන් මඟ හරවා සහනයක් සලසා ගැනීමට හැකි වේ.

# බිං කොහොඹ

## *Andrographia paniculata*

## **Meliaceae**



**ශාකයේ ස්වාභාවය**

බිංකොහොඹ සෙ.මී 15 පමණ උසට වර්ධනය වන කුඩා පැළෑටියකි. බොහෝ විට අතු බෙදීමක් දක්නට නොලැබේ.

පත්‍ර තරමක් ගණව කිරුලක් මෙන් ඇසිරී ඇත. අසම පක්ෂවත් සංයුක්ත පත්‍රවල පත්‍රිකා විවිධ හැඩයන් ගනී. පත්‍රවල හැඩය අනුව ප්‍රභේද 10 ක් හෝ ඊට වැඩි සංඛාවන් දැකිය හැකිය.

පෙති 5 ක් සහිත සුදු පැහැති මල් ඉතා අලංකාරවත් මෙන්ම සුවඳවත් ය. ඒ ඒ ප්‍රභේදවල මල් ද තරමක විවිධත්වයකින් ගනී.

ස්ඵෝටිකාවක් වන ඵලය පිපිරී යෑමෙන් විසිරෙන බීජ මඟින් ශාකයෙහි ව්‍යාප්තිය සිදු වේ. බිංකොහොඹ වානිජව වගා කීරීමෙන් ඉහල ආර්ථික ප්‍රතිලාභ ලබ ගත හැකිය.

වඳවී යාමේ තර්ජනයටද ලක්ව ඇති වටිනා දේශීය ඖෂධ පැළෑටියක් වන බිං කොහොඹ ශාකය Meliaceae උද්භිද කුලයට අයත් ය.

❖ බිංකොහොඹ දේශීය වෙදකමට අනන්‍ය ඖෂධයක් ලෙස සැලකේ. ඉන්දීය වෛද්‍ය නිඝණ්ඩුවල දේශීය බිංකොහොඹ ශාකය ගැන සඳහනක් නොමැත. අතීතයේ සිටම භූනිබ්බ ලෙස සඳහන්ව ඇති විට දේශීය වෛද්‍යවරු බිංකොහොඹ ශාකය ඖෂධ සඳහා භාවිතයට ගෙන ඇත. බිංකොහොඹ නාමය සහිත නම් තවත් දේශීය ශාකයක් හමුවන අතර එය "හීං බිංකොහොඹ" (Andrographis paniculata) නම් වේ. දේශීයව එයට වල් බිංකොහොඹ සහ ඇතැම් විට කිරාත යන නම ද භාවිතා කරයි.

සංස්කෘතෙන් භූනිම්බ, කාලමෙඝ ආදී නම් වලින් හඳුන්වන එම ශාකය දේශීයව සහ විදේශීයව බෙහෙවින් ඖෂධ සඳහා භාවිතා කරන්නකි.

දේශීය වෛද්‍යවරු බිංකොහොඹ වෙනුවට මෙම හීං බිංකොහොඹ ශාකය ද භාවිතයට ගනී. මෙම ශාක විශේෂ 2 හා බැඳෙන තවත් පැළෑටියක් ඇති අතර එය කිරාත හෝ කිරාතතික්ත යනුවෙන් හඳුන්වයි.

Swertia chirata නම් උද්භිද නාමය සහිත එය මෙරටදී හමු නොවන ඉන්දියාවේදී පවා දුර්ලභව හමුවන්නකි. මෙම උද්භිද ගණයට අයත් Swertia zeylanica නම් හෝර්ටන් තැන්න වැනි පතන් ආශ්‍රිතව වැවෙන මෙරටට ආවේනික ශාකයක් ඇති අතර එහි ඖෂධීය භාවිතාවක් ගැන දැන ගන්නට නැත.

කිරාතතික්ත වෙනුවට ඉන්දීය වෛද්‍යවරු හීං බිංකොහොඹ භාවිතා කරතත් එය නිවැරදි නොවන බවත් කාලමේස ලෙස සඳහන්ව ඇති විට කිරාතතික්තම භාවිතා කළ යුතු බවටත් ඇතැම් ඉන්දීය වෙදැදුරන් අතර මතයක් පවතී.

**යොදාගත හැකි රෝග අවස්ථා**

- බිංකොහොඹ ආයුර්වේදයේ සඳහන් කිරාතතික්ත තරමටම හෝ ඊටත් වැඩි තරමින් උණ නසන, රුධිරය පිරිසිදු කරන, තික්තබලකාරක ගුණයෙන් යුක්ත බව සඳහන්.
- දේශීය වෙදකමේදී උණ, අතීසාරය, අජීර්ණය, කුසගිනි මදිකම, මලබද්ධ, වාතරක්ත, කුෂ්ඨ, වණ, වේදනා, ඉදිමුම්, රක්ත අර්ශස්, චර්ම රෝග, එක්සිමා හෙවත් කඩුවේගන්, ඇදුම, කැස්ස, රුධිර සංසරණ පද්ධතියේ රෝග, වමනය ආදී රෝග තත්වයන්ට ප්‍රතිකාර කිරීම සඳහා බිංකොහොඹ සම්පූර්ණ ශාකයම භාවිත කරයි.
- බිංකොහොඹ කුසගිනි වඩවන, මුත්‍ර කාරක, වණ ශෝධනය කරන, ඉදිමුම් නසන, රුධිරය පිරිසිදු කරන ආදී ගුණයන් සහිතයි.

**යෝග** -

- හික්කාවට (ඉක්කාවට) බිංකොහොඹ සහ කොත්තමල්ලි ග්‍රෑම් 15 පමණ ගෙන තලා වතුර පත 2 ක් දමා, පත භාගයට සිඳුවා මී පැණි ප්‍රක්ෂේප කොට බීමට දිය යුතුය.
- වියළි බිංකොහොඹ චූර්ණය ග්‍රෑම් 6 ක් මී පැණි සමඟ ලේහ කිරීමෙන් වමනය සුවවේ.
- උණට ප්‍රතිකාර කිරීමට යොදා ගන්නා ප්‍රකට ඖෂධයක් වන සුදර්ශන චූර්ණයේ වැඩි වශයෙන් ඇත්තේ බිංකොහොඹ ය.

❖ **වඳවෙමින් පවතින වටිනා දේශීය ඖෂධ පැලෑටියක් වන බිංකොහොඹ ශාකයක් බඳුනක හෝ වවා ගැනීමට උනන්දු වීම දේශීය වෙදකමට හිතැති කාගේත් යුතුකමකි.**

# මොණරකුඩුම්බිය
## *Cyanthillium cinereum*
## Asteraceae

පිපුණු මල් මොණරකුගෙ හිසමත පිහිටි ශිඛාව මෙන් දිස්වන හෙයින් මෙම පැළෑටිය මොණරකුඩුම්බිය ලෙස හඳුන්වා ඇත.
එයට අමතරව මඟුල්කුඹුරුවන්න, වතුපලා, කොබෙයි කොළ, දුටුසපුටු ආදී නම්ද විවිධ ප්‍රදේශවල මෙම ශාකය හැඳින්වීමට භාවිතා කරයි.



**ශාකයේ ස්වාභාවය**

මොණරකුඩුම්බිය සෙ.මී. 30 පමණ උසට වැඩෙන කුඩා වාර්ෂික පැළෑටියකි. සිලින්ඩරාකාර කඳේ මඳ බූවක් දක්නට ලැබේ.

අණ්ඩාකාර හැඩැති සරල පත්‍ර ඒකාන්තරව පිහිටයි. පත්‍රයක් දිගින් සෙ.මී 5 සහ පළලින් සෙ.මී. 2 දක්වා වර්ධනය වේ. පත්‍ර දාරයේ කොටසක් හෝ සම්පූර්ණ වශයෙන් කඩතොළු සහිත ය.

පුෂ්ප මංජරිය ශීර්ෂක රැසකින් සෑදුන සමතලයකි. මල් නිල් හෝ සුදු පැහැතිය. ඵලය තද දුඹුරු හෝ කළු පැහැති චර්මලයකි.

දේශීය ශාකයක් වන මොණරකුඩුම්බිය Asteraceae උද්භිද කුලය අයත් ශාකයකි.

**යොදාගත හැකි රෝග අවස්ථා**

- උණ රෝග, පාණ්ඩු, වණ, මුත්‍ර හෝ පිත්තාශ ගල්, සෙංගමාලය ඇතුළු අක්මා රෝග, පණු රෝග ආදියට ප්‍රතිකාර කිරීමට මොණරකුඩුම්බිය සම්පූර්ණ ශාකයමත් ඇට සහ මල් වෙන වෙනමත් භාවිතයට ගනී.
- මොණරකුඩුම්බිය ඉදිමුම් සහ වේදනාවන් නසන, ශරීරය තුල ඇතිවන ගල් දියකර හරින, මුත්‍රකාරක, රුධිරය පිරිසිදු කරන ආදී ගුණ සහිතයි.

- ❖ නූතන පර්යේෂණවලට අනුව මිනිසාගේ ප්‍රතිශක්තිය වර්ධනය කිරීමට ඉවහල්වන ඖෂධීය ගුණ රැසක් සහිත ශාකයක් ලෙස මොණරකුඩුම්බිය හඳුනාගෙන ඇත.
- ❖ කැඳ සඳහා පැරැන්නන් මෙම ශාකය සුලභව භාවිතා කර ඇත්තේ මෙය රුධිරය පිරිසිදු කිරීමේ ගුණයෙන් අනූන බව දැනසිටි නිසා විය යුතුය.

**යෝග -**

- ළදරු මාන්දමට මොණරකුඩුම්බිය කැඳ හෝ ව්‍යංජනය සකසා දීම ගුණය.
- වණ රෝපණයට කොළ ස්වරසය යොදයි.
- උණට ස්වරස තෛළය හිස ගල්වයි.
- සෙංගමාලයට කැඳ සකසා දෙයි.
- මෙම යුෂ ආලේප කිරීමෙන් අළුහම් නැතිව යයි.
- ශරීරයේ ප්‍රතිශක්තිය වර්ධනය කිරීමට මෙම කැඳ හෝ ව්‍යංජනය හෝ මලවා ආහාරයට ගත යුතුය.
- ඇට චූර්ණය දීමෙන් පණු රෝග සමනය වේ.
- සෙංගමාල අවස්ථාවකදී මොනර කුඩුම්බිය කොළ කොටා ගත් යුෂවලින් සෑදූ කැඳ පානය ඉතාම ගුණය.
- අක්මාව ආශ්‍රිත රෝග සුවයට මෙන්ම ආමාශගත රෝග, මුත්‍රා ආසාදන වැනි රෝගත් එමඟින් සුව වෙයි.
- මොණරකුඩුම්බිය මැල්ලුමක් ලෙස ආහාරයට ගැනීමෙන් අක්මාව ආශ්‍රිත රෝග, අතීසාර රෝග, ආමාශගත රෝග, මුත්‍ර රෝග ආදී රෝග රැසකින් සුවය ලැබිය හැකිය.
- උෂ්ණ කාලවලදී ඇතිවන ආසාදන, රුධිරය පිටවන අතීසාර අවස්ථාවකදී මොණරකුඩුම්බිය කළං 12 කෂාය බොහෝ ප්‍රතිඵලදායක ය.
- එමඟින් උණ, උදර වේදනා, බඩ පුරවාදැමීම, අජීර්ණ වැනි රෝග තත්වන්ද සමනය වෙයි.
- මොණරකුඩුම්බිය මුල් කෂාය මිලිලීටර් 10ක ප්‍රමාණයක් දිනකට දෙවරක් පානය කිරීමෙන් ඉදිමුම් සහ ඇඟ පත වේදනාවන් දුරුව යයි.
- පොල් කිරි දමා පිසගත් මොණරකුඩුම්බිය ව්‍යංජනය ආහාරයට ගැනීමෙන් ශරීරයේ ඇති වන දැවිල්ල, සමේ ඇතිවන දුර්වර්ණවීම්, පිත් දෝෂ ආදිය සමනය වෙයි.
- උගුර ආශ්‍රිතව සහ මුඛය තුළ හටගන්නා සෙම් ගෙඩිවලට මොනරකුඩුම්බිය ළපටි දලු හොඳින් තම්බා එම ඖෂධීය දියරයෙන් විටින් විට උගුර සහ කට සේදිය යුතුය.
- සිරුරේ උෂ්ණ ආසාදන නිසා සැරව බිබිළි හටගත් විට මෙම ශාකයේ මුල් කොටස ගෙන හොඳින් පිරිසුදු කර කොටා ඒ ද්‍රාවණය උෂ්ණ බිබිළිවල සැරව ගෙඩිවල ආලේප කිරීමෙන් සැරව ගෙඩි වේදනා රහිතව පිපිරී යෑම මෙන්ම ඉක්මනින් සුව වීමත් සිදුවේ.
- එමෙන්ම මුත්‍රාශය ආශ්‍රිත වේදනා සහ මුත්‍රා දැවිල්ල ඇති විටදී මේ ශාකයේ ඇට කෂාය කර බීම ගුණය.

- කල්ගත වූ කැස්සට මෙම සම්පූර්ණ ශාකයම වියළා හොඳින් කුඩුකර නටන උණුවතුර කෝප්ප භාගයකට එම කුඩු ස්වල්පයක් දමා වසා තබා විනාඩි විස්සක් පමණ ගිය පසුව එය පෙරා පානය කළ යුතුය.
- ඇස් රතු වීම, ඇහෙන් කබ කඳුළු ගැලීම, ඇස් දැවිල්ල ආදී විවිධ ඇස් ආශ්‍රිත රෝගවලදී මොණරකුඩුම්බිය මල් තම්බා ඒ දියරින් ඇස් සහ මුහුණ විටින් විට සේදීමෙන් ඉක්මන් සුවයක් ලැබෙයි.
- මොණරකුඩුම්බිය ගසේ කොළ ඉවත් කර කඳ කොටස හොඳින් ගලේ අඹරා තලපයක් ලෙස සාදා ගෙන එම ප්‍රමාණය මෙන් කොටස් තුනකට තිප්පිලි කොටස් එකක් දමා තම්බා පානය කිරීමෙන් ඕනෑම අර්ශස් රෝගයකට ගුණය.
- මොණරකුඩුම්බිය ඇට ස්වල්පයක් ගෙන එය තල තෙලින් අඹරා සුදු කබරවල දිනපතා වරින්වර ආලේප කිරීමෙන් ක්‍රම ක්‍රමයෙන් සුදු කබර රෝගයෙන් සුවය ලැබිය හැකිය.
- ඉකිලි, කිසිලි වැනි ස්ථානවල අහිතකර දද වැනි පුස් වර්ගයක් ඇතිවීමෙන් තදබල කැසීම් ඇති වේ. එවැනි විට මොණරකුඩුම්බිය ශාකය අරගෙන එයට කලුදුරු ස්වල්පයක් සහ වියළි පොල් ස්වල්පයක් මිශ්‍ර කර ඒ වර්ග තුනම හොඳින් අඹරා ඉකිලි, කිසිලිවල හටගත් පුස් සහිත දදයේ ආලේප කර පැය තුනක් පමණ ගිය පසු සේදිය යුතුය. මෙය දිනපතා දිනකට දෙවරක් බැගින් කිරීමෙන් ඉක්මනින් සුවයක් දකින්න හැකි වේ.
- කුෂ්ඨ රෝග ඇති විට මොණරකුඩුම්බිය කොළ තල තෙල් සමඟ මිශ්‍ර කර හොඳින් අඹරා මඳක් රත් කර කල්කයක් මෙන් සාදාගෙන මඳ රස්නෙ පිට කුෂ්ඨ මත, සැරව බිබිළි මත ආලේප කළහොත් කුෂ්ඨ සහ සැරව බිබිළි සුව කිරීමේ හැකියාවක් වගේම සර්ප දෂ්ටනවල විස ඇද ගැනීමේ හැකියාවකුත් මේ ඖෂධීය ආලේපයේ පවතී.
- මොණරකුඩුම්බිය කොළ කෂාය කිරි ස්වල්පයක් සමඟ දිනපතා උදේ සවස පානය කිරීමෙන් ශරීරය ශක්තිමත් කිරීමේ විශේෂ ගුණයක් අත්දැකිය හැකිය. එය සිරුරට විශේෂ පෝෂණීය ගුණයක් ලබා දෙයි.
- වියළි මොණරකුඩුම්බිය ශාකය හොඳින් කුඩුකර බෝතලයකට දමා සුළං නොවදින්න තබා ගෙන වරකට ඒ කුඩු ග්‍රෑම් 60ක් වතුර කෝප්ප 7ක් සහ කිරි කෝප්ප 1ක් සමඟ මිශ්‍ර කර එය හොඳින් තම්බා පත එකක් ලෙස සිඳුවා ගන්න. ඒ ආකාරයට සිඳුවා ගත් පත එක උදේට පත භාගයයි සවසට පත භාගයයි බැගින් සති දෙකක් පමණ දිනපතා පානය කළ යුතුය. මෙම ප්‍රතිකර්මය ශරීර ශක්තිය වර්ධනය කරගැනීමටත්, දේහධාරී සිරුරක් ලබා ගැනීමටත් සම පැහැපත් කර ගැනීමටත් මනා පිහිටුවහලක් වනු ඇත.

# කපු
## *Gossypium arboreum*
## Malvaceae



**ශාකයේ ස්වාභාවය**

කපු මීටර් 1.5 පමණ උසට පඳුරක් ආකාරයෙන් වැඩෙන කුඩා ශාකයකි. කඳ සහ සුළු සංඛාවක් පවතින අතු අකාෂ්ඨීය වන අතර මඳ බූවක් සහිත හෝ කලාතුරකින් සුමට වේ.

පුළුල් ලෙස හෘදයාකාර සරල පත්‍ර කෙටි තිව්‍ර ඛණ්ඩිකා 5-7 සංඛාවකට බෙදී පවතී. පත්‍ර තලයේ ග්‍රන්ථිමය තිත් දැකගත හැකිය.

විශාල කහ පැහැති ද්විලිංගික මල් අලංකාරවත් ය. මල්වල මධ්‍යය දම් පැහැයෙන් දැකගත හැකිය. ඵලය කොළ පැහැති, වටකුරු හැඩැති ස්ඵෝටිකාවකි.

කුටීරවලට බෙදුණු ඵලය තුල පුලුන්වලට මැදිවූ අළු හෝ සුදු පැහැති බීජ පිහිටා තිබේ.

ඖෂධ ලෙස භාවිතා කිරීමටත් වඩා රෙදිපිළි කර්මාන්තයේදී ප්‍රකටව භාවිතා කරන කපු Malvaceae උද්භිද කුලයට අයත් ශාක විශේෂයකි.

දේශීය උද්භිද මූලාශ්‍රවලට අනුව Gossypium විශේෂ 5ක් ලංකාවෙන් හමුවන අතර ඒ සියල්ල මෙරටට හඳුන්වාදෙන ලද විශේෂයන් වේ.

නමුත් වසර දෙදහස් ගණනකට පෙර විජය කුමරු ලංකාවට පැමිණෙන විට කුවේණිය කපු කැටමින් සිටි බව ඓතිහාසික මූලාශ්‍රවල සඳහන් වේ. මෙයින් කියවෙන්නේ කපු විශේෂ ලංකාවට හඳුන්වාදීමේ ඉතිහාසය විජය-කුවේණී යුගයටත් පෙර සිදුවූවක් බවද? නැති නම් වෙනත් යමක්දැයි සොයා බැලීම සිත්ගන්නා සුළු කරුණක් වනු ඇත.

වෙදකමට සම්බන්ධ මූලාශ්‍රවල කපු වර්ග කීපයක් ගැන සඳහන්ව ඇත. නියම කපු සහ වල් කපු යනුවෙන් එක් වර්ගීකරණයක සඳහන්ව ඇති අතර තවත් වර්ගීකරණයකට අනුව මලේ පැහැය අනුව කහ, රතු සහ කළු යනුවෙන් කපු වර්ග තුනක් දක්වා ඇත. ගුණය අතින් මෙම සෑම කපු වර්ගයක්ම සමාන බව ඒවායෙහි සඳහන් වේ.

**යොදාගත හැකි රෝග අවස්ථා**

- වාත රෝග, ගර්භාෂගත රෝග, ආර්තව ගැටළු, මුත්‍ර අඩස්සිය, ප්‍රදර රෝග, පාණ්ඩුව, ගෝනුසු විෂ ආදියට ප්‍රතිකාර කිරීම සඳහා කපු ශාකයේ කොළ, මුල්, මල්, ගෙඩි සහ ඇට භාවිතා කරයි.

- කපු වේදනා ස්ථාපන, වණ රෝපණය කරන, ස්නායු උත්තේජනය කරන, කපු කොළ ලේ වඩවන, ඇට හා කොළ මුත්‍ර කාරක ආදී ගුණ සහිත බව සඳහන්.

- එමෙන්ම විශේෂයෙන් කපු මල්වල අක්මාව උත්තේජනය කරන සහ විෂ නාශක ගුණ සහිත බවත්, මුලේ පොතුවල ගර්භාෂය සංකෝචණය කරන සහ ආර්තවය ඇති කරවන ගුණ සහිත බවත්, ඇටවල මද ශුක්‍රවර්ධනය කරන හා මව්කිරි වර්ධනය කරන ගුණ සහිත බවත් දක්වා ඇත.

**යෝග -**

- වේදනාකාරී ආර්තවයට සහ ආර්තවය ඇති නොවන විට කපු මුලේ පොතු චූර්ණය හෝ කෂාය යොදා ප්‍රතිකාර කරයි.

- ප්‍රසවයේදී මුල් කෂාය යොදයි.

- මුත්‍ර අඩස්සියට බීජ චූර්යණය හෝ පත්‍ර ස්වරසය භාවිතා කරයි.

- පාණ්ඩුවට කපු මල් හාල්පානු වතුරෙන් අඹරා බොන්නට දෙයි.

- අතීසාරය සමඟ එන වමනයට යොදන ජලසන්නිකපාල ගුලිය සෑදීමට කපු ඇට භාවිතා කරයි.

- වල්කපු මුල් හා උක් මුල් විනාකිරෙන් අඹරා බොන්නට දීමෙන් මව්කිරි වර්ධනය වන බව සඳහන්.

- මිනිසුන්ගේ සහ හරකුන්ගේ උල් කටු ඇණුනු විට ඒවා ඇදීමට කපු කොළ, ගොන් කැකිරි අල, කෝවක්කා කොළ, ඔලිඳ කොළ සමව ගෙන කොටා බඳියි.

- ගොනුසු විෂට කපු ගෙඩි අඹරා ආලේප කරයි.

- ඖෂධ සඳහා යොදා ගැනීමට අමතරව පෙරදිග සහ බටහිර වෛද්‍ය ක්‍රමවල තුවාලවලට ප්‍රතිකාර කිරීමේදී සහ සැත්කම් සඳහා කපු පුලුන් සහ කපු පුලුන් භාවිතාකර නිපදවන කපු රෙදි (තුවාල සැරහුම් සහ වෙළුම් පටි ලෙස) සුළබව භාවිතා කරයි.

- මෙරට ගැමියන් ජලය පිරිසිදු කර ගැනීමේ අරමුණෙන් කපු ඇට ළිඳට දමයි. විශේෂයෙන් සිංහල අවුරුදු චාරිත්‍රවලදී ළිඳ සමඟ ගණුදෙනු කිරීමේදී යොදන ද්‍රව්‍ය අතර කපු ඇට ද වෙයි.

- එමෙන්ම මෙරට ජනයා ශාන්තිකර්ම වැනි නොයෙක් අභිචාර ක්‍රම සඳහා කපු ඇට භාවිතා කරයි. ඇස්වහ කටවහ දෝෂ සඳහා, උදෑසන කකුලා හැඬලීමට පෙර කතා නොකර ලබා ගන්නා ජල බඳුනකට කපු ඇට දමා වසා තබා පසුව එය යකදුරකු විසින් මතුරා බොන්නට දෙයි.

- කුඩා දරුවන්ගේ සිරුරෙහි ඇතිවන ඇස්වහ කටවහ බිබිලි සඳහා මෙම වතුර මැතිරීම ප්‍රත්‍යක්ෂ බව ගැමියන්ගේ අත්දැකීමකි.

# ලුණුවරණ

## *Crateva adansonii*

## Capparaceae

**ශාකයේ ස්වාභාවය -**

ලුණුවරණ මීටර් 3-12 පමණ උසට වැඩෙන කුඩා පතනශීලී ශාකයකි. කලාතුරකින් මීටර් 20 පමණ උසට වැඩෙන අවස්ථාද දැක ගත හැකිය.

පිට පොත්ත අළු පැහැතිය. දිගු නටුවක් සහිත ත්‍රිපත්‍රී සංයුක්ත පත්‍ර ඒකාන්තරව පිහිටයි. අග්‍රස්ථ පත්‍රිකාව දිගින් සෙ.මී. 5-12 දක්වා සහ පළලින් 2-6 දක්වා වර්ධනය වේ. පත්‍රිකාවල හැඩය ඉලිප්සීය සිට ලංසාකාර වේ. පාර්ශවික පත්‍රිකාවන් දිගින් සෙ.මී. 3.5-7 පළලින් 1-10 දක්වා වැඩනෙ අතර පත්‍රිකා හැඩය අසමමිතික ස්වරූපයකි.

තරමක් විශාල මල් සුදු හෝ ක්‍රීම් පැහැයට හුරු කහ පැහැති වන අතර අලංකාරවත් මෙන්ම සුවඳවත් ය.

ඵලය සෙ.මී. 2.5 පමණ වන ගෝලාකාර බදරියකි. මි.මී. 5 පමණ වන වෘක්කාකාර හෝ අශ්ව ලාඩම් හැඩැති කුඩා බීජ ඵලයේ මැදි පිහිටි තරලයේ ගිලී පවතී.

❖ ලුණුවරණ Capparaceae උද්භිද කුලය අයත් දේශීය ශාක විශේෂයකි.

**යොදාගත හැකි රෝග අවස්ථා**

- මුත්‍ර ගල්, මුත්‍ර අඩස්සිය, ගුදමාර්ගයේ වේ්දනාවන්, ජලෝදර, අක්මා රෝග, ගුල්ම රෝග, ගණ්ඩමාලා, ව්‍යංග රෝග, වණ නිසා හටගත් ඉදිමුම්, පණු රෝග, ගෙඩි, අර්ශස්, වාත වේදනා, කැඩුම්බිඳුම් ආදියට ප්‍රතිකාර කිරීම සඳහා ලුණුවරණ ශාකයේ පොතු, මුල්, මුලේ පොතු, කොළ , මල් සහ සම්පූර්ණ ශාකයමත් භාවිතයට ගනී.

- ලුණුවරණ රක්ත උත්ක්ලේශක, දීපන, අනුලෝමන, පිත්තසාරක, පණුවන් නසන, රුධිරය පිරිසිදු කරන, මුත්‍රකාරක, මුත්‍රගල් දියකර හරින ආදී ගුණ සහිතයි.

**යෝග**

- ලුණුවරණ යොදා වරුණාදී නාමය යටතේ තෛල, ක්වාත, කල්ක, ලේප, චූර්ණ, ඝෘත ආදී ඖෂධ රැසක් නිපදවයි.
- ලුණුවරණ මුත්‍ර ගල් සඳහා යොදන ප්‍රකට ඖෂධයකි.
- මුත්‍රගල් සෑදී ඇති විට ලුණුවරණ මුල් හා පොතු කෂාය යොදා ප්‍රතිකාර කරයි.
- එහෙන්ම එ් සඳහා ලුණුවරණ පොතු, ගොකටු ඇට සහ ඉඟුරු යෙදූ කෂායට යවකාර ලුණු දමා බොන්නට දෙයි.
- ජලෝදරයට ලුණුවරණ මුල් කෂාය යොදයි.
- විද්‍රධි සඳහා සුදු සාරණ මුල් සහ ලුණුවරණ මුල් කෂාය කර දෙයි.
- ගණ්ඩමාලයට ලුණුවරණ මුල් කෂාය මී පැණියෙන් දෙයි.
- අර්ශස් සඳහා ලුණුවරන මුල් කෂායට කලතෙල් මිශ්‍රකර අවගාහනය කරයි.
- වාත වේදනාවන්ට ලුණුවරණ පොතු, මුරුංගා පොතු විනාකිරෙන් අඹරා ආලේප කළ යුතුය.
- කික්කිස රෝගයේදී මාංස විධාරණයට ලුණුවරණ කොළ ජලයෙන් අඹරා ගිතෙල් සහිතව ආලේප කරයි. උණට ලුණුවරණ පත්‍ර ස්වරසය දෙයි.
- වරුණාදී ඝෘතය මුත්‍ර ගල් සහ දියවැඩියාව නිසා හටගත් මුත්‍ර අඩස්සිය සඳහා ප්‍රතිකාර කිරීමට යොදා ගනී. වරුණාදී තෛලය මුත්‍ර ගල් සහ මුත්‍ර අඩස්සිය නසයි.

# තිප්පිලි

## *Piper longum*

## Piperaceae

තිප්පිලි බුලත් අයත් වන Piper නම් උද්භිද ගණයට අයත් බුලත්වලට සමාන කොළ සහිත ශාකයකි.

ලංකාවේ ඇතැම් පලාත් වලත්, ඉන්දියාවේ උතුරු - දකුණු ප්රදේශ වලත්, නේපාලයේත් බහුලව වැඩේ.

මෙම ශාකයේ මව්බිම ඊසාන දිග ඉන්දියාව හෙවත් මගධ දේශය ලෙස සැලකේ. එබැවින් "මගධෝද්භවා" යන නම තිප්පිලි වලට ව්යවහාර කරයි.

මෙහි සිංහල නම වගපුල්ය. තිප්පිලි යන්න සංස්කෘතයෙන් බිඳී ආවකි.

**ශාකයේ ස්වාභාවය**

තිප්පිලි ශාකය කාෂ්ඨීය මූල පද්ධතියක් සහිත කාෂ්ඨීය නොවන වැල් ශාකයකි. ගැටවලින් මුල් අදිමින් පොළවට සමාන්තරව වරධනය වේ.

පැහැදිළි නාරටි සහිත පත්ර තලය මද වශයෙන් දිළිසෙන සුලුය. බොහෝවිට පත්ර වෘන්ත දක්නට නොලැබේ.

පුෂ්ප මංජරිය ශූකියකි. එය මල් පිපී පරිනත වූ පසු තිප්පිලි කරල ලෙස හඳුන්වයි.

- ❖ තිප්පිලි ශාකයට සමාන එහෙත් ආධාරක ශාක මත වැවෙන සිවිය (Piper chaba) ශාකයේ කරල් ගජ තිප්පිලි ලෙස හඳුන්වා ඇතත් එය මතභේදාත්මක ය.
- ❖ ඇතැම් මූලාශ්රවලට අනුව ගජ තිප්පිලි යනු Araceae කුලයට අයත් Scindapsus officinalis නම් ශාකයේ කරල් ය.
- ❖ මෑතක සිට තිප්පිලි ලෙස ගස් තිප්ලිලි යනුවෙන් හඳුන්වන Piper sarmentosum නම් ශාකයක් බහුලව ඔසු පිණිස භාවිතා කරනු දක්නට ලැබේ. දිළිසෙන, තරමක් විශාල කොළ සහිත ගස් තිප්පිලි ශාකයේ තිප්පිලිවල තිබෙන ඔසු ගුණ නොමැති බවයි ජේෂ්ඨ වෛද්යවරුන්ගේ අදහස. ගස් තිප්පිලි ශාකයේ සේයාරුවක් පහත පල කර ඇත. තිප්පිලි Piperaceae කුලයට අයත් ශාක විශේෂයකි.

**යොදාගත හැකි රෝග අවස්ථා**

- තිප්පිලි සෙම් රෝග සඳහා ගුණදායක ඖෂධයක් බව ඉතා ප්‍රකටය.
- එමෙන්ම ක්ෂය රොෙගය, කැස්ස, උදරාබාධ, කුෂ්ට රෝග, හික්කා, කෘමි රෝග, ප්‍රවාහිකා, අර්ශස්, අම්ලපිත්ත හෙවත් ගැස්ට්‍රයිටීස් ආදී රෝග සඳහා ප්‍රතිකාර කිරීමේදී තිප්පිලි කරල්, මුල්, සහ සම්පූර්ණ ශාකයමත් යොදා නිපදවූ ඖෂධ භාවිතා කරයි.
- තිප්පිලි බඩගිනි ඇති කරයි. දිරවීම පහසු කරයි.
- තරමක් ඌෂ්ණාධික වන අතර කටුක රසයෙන් යුක්ත ය. වාත හා සෙම් රෝග නසයි.
- අමු තිප්පිලි සෙම වඩයි. ශීතය.
- වියලි තිප්පිලි පිත කෝප කරයි.

**යෝග**

- කුඩා දරුවන්ගේ අජීර්ණ රෝග සඳහා, තිප්පිලි, කරපිංචා සහ අරළු සමව ගෙන සිහින්ව කොටා රෙද්දකින් හලා සාදාගත් චූර්ණය උණුදිය සමඟ පෙවීම ගුණදායක ය.
- සෙම් උණට තිප්පි කුඩු ලේහ කිරීම, ක්ෂය රොෙගයට තිප්පිලි ගිතෙලින් බැද සහිඳ ලුණු සමඟ අඹරා කැමට දීම, අම්ලපිත්තයට තිප්පිලි කඩු මැ පැණි සමඟ කැමට දීම තිප්පි භාවිතා කරන ප්‍රතිකාර කිහිපයකි.
- ගැමියන් බුලත් විට රසවත් කර ගැනීම සඳහා තිප්පිලි එකතු කර ගනී.
- තිප්පි මුල් හා ගම්මිරිස් මුල් කුඩුකර ගෙන එළකිරි සමඟ බීමට දීමෙන් තනකිරි වර්ධනය වන බව ගැමියන් සහ දේශීය වෙදැදුරන් අතර ප්‍රචලිතය.
- තිප්පිලි සෙම නසන, රුධිරය පිරිසිදු කරන, කෘමින් නසන, වේදනාව සමනය කරන ආදී ගුණයන් සහිතයි.

# ගොඩපර

*Dillenia retusa*

**Dilleniaceae**




**ශාකයේ ස්වාභාවය**

ගොඩපර මීටර් 20 පමණ උසට සහ සෙ.මී. 70 පමණ විශ්කම්භයක් සහිතව වැඩෙන දේශීය සදාහරිත ශාකයකි.

මඳ බූවක් සහිත සරල පත්‍ර ඒකාන්තරව පිහිටයි. දිගින් සෙ.මී. 8-21 සහ පළලින් සෙ.මී. 5-12 දක්වා වැඩෙන පත්‍ර ප්‍රත්‍යණ්ඩාකාර හැඩයක් ගනී. පත්‍ර දාරය සම්පූර්ණ හෝ මඳ වශයෙන් දන්තුර වේ. පත්‍ර තලය දිළිසෙන සුලු ය.

අග්‍රර්ථීයව හට ගන්නා පුෂ්ප මංජරියෙහි සුදු පැහැති අලංකාරවත් මල් හට ගනී.

ව්‍යාජ ඵලය රතු තැඹිලි පැහැති ය. ව්‍යාජ ඵලය මධ්‍යයේ පිහිටි නානුමය පල්පය තුල අණ්ඩාභ හැඩැති කුඩා බීජ රාශියක් පිහිටයි.

- ගොඩපර Dilleniaceae උද්භිද කුලයට අයත් දේශීය ශාක විශේෂයකි.
- ආයුර්වේදයට අනුව පක්ව ගොඩපර හා අපක්ව ගොඩපර යනුවෙන් වර්ග දෙකක් ගැන සඳහන් වේ.

**යොදාගත හැකි රෝග අවස්ථා**

- පිපාසය, ඇවිල්ල, ඇදුම, උණ, අතීසාර, මුඛ රෝග, හිස කෙස් ගැලවී යාම, හිස් හොරි, කැඩුම් බිඳුම් ආදියට ප්‍රතිකාර කිරීම සඳහා ගොඩපර ශාකයේ කොළ, පොතු හා ගෙඩි භාවිතා කරයි.
- ගොඩපර වාතය සමනය කරන්න, සෙම සහ පිත වර්ධනය කරන, හෘදයට හිතකර, කෘමිනාශක ආදී ගුණ සහිතයි.

**යෝග**

- අතීසාරයට ගොඩපර කොළ සහ පොතු කෂාය බොන්නට දෙයි.
- විදුරුමසින් ලේ යාමේදී පොතු කෂායෙන් කට සේදිය යුතුය.
- ඇදුමට ගොඩපර කොළ යුෂ මී පැණි සමඟ දෙයි.
- උණට, විශේෂයෙන් පිත් කෝපයෙන් හට ගත් උණට සහ ඇදුමට ගොඩපර ගෙඩි යුෂ බීමට දෙයි.
- අස්ථි සන්ධි පැනීමේදී හා අස්ථි බිඳීමේදී ඇති වන අධික වේදනාව සමනය කිරීම සඳහා ගොඩපර ගෙඩි යුෂ ආලේප කරයි.
- හිසකෙස් ගැලවී යාම, හිස්හොරි සහ උකුණන් ආදියට ගොඩපරගෙඩි යුෂ හිස ගල්වා සොදා හැරිය යුතුය.
- ගොඩපර ගෙඩි, දෙහි, උළුහාල් සමඟ තම්බා හිස සේදීමෙන් උකුණන් බෝවීම මර්ධනය වේ.
- ගොඩපර ගෙඩි කීපයක් ගෙන හොඳින් කොටා සබන් මෙන් පෙණ නගින අයුරින් වතුර සමඟ කලවම් කර හිස කෙස්වල අතුල්ලා සේදීම කෙස් පිරිසිදු කර ගැනීමට භාවිතා කළ පැරණි ක්‍රමයකි.

❖ ගොඩපර ලීය නිවාස සෑදීම ආදියේදී දැව අවශ්‍යතා සඳහා යොදා ගනී.
❖ ළපටි ගොඩපර මල් ව්‍යංජනයක් ලෙස සකසා ආහාරයට එක්කර ගත හැකිය.

# දිවිකදුරු

## *Ipomoea pestigridis*

## **Connvoivulaceae**





**ශාකයේ ස්වාභාවය**

දිවිඅඩිය වැල් යනුවෙන් ද හඳුන්වන දිවිපහුරු රළු බූවක් සහිත වැල් ශාකයකි. පත්‍රය අතක ඇඟිලි මෙන් පත්‍රිකා 7-9 අතර ප්‍රමාණයකට බෙදී පවතී. පත්‍රයක් දිගින් සෙ.මී.10.5 ක් සහ පළලින් සෙ.මී. 13ක් පමණ වේ. පත්‍රිකා ප්‍රත්‍යණ්ඩාකාර හෝ ඕවලාකාර වන අතර පත්‍රිකාවල අග සහ මුල පටුය. උඩු හා යටි පෘෂ්ඨ දෙකේම දැඩි බූවක් පිහිටා තිබේ.

පුෂ්ප මංජරිය සුදු,රෝස හෝ දම් පැහැ පුනීලාකාර මල් කීපයකින් සමන්විතයි. කුඩා අණ්ඩාකාර ස්පෝටිකාවක් වන ඵලය තුළ කළු පැහැති සියුම් බූවක් සහිත කුඩා බීජ පිහිටා තිබේ.

❖ දිවිපහුරු Connvolvulaceae උද්භිද කුලයට අයත් දේශීය ශාකයකි.

**යොදාගත හැකි රෝග අවස්ථා**

- දිවිපහුරු විශේෂයෙන් විෂ වෙදකමේදී භාවිතා කරන ප්‍රකට ඔසු ශාකයකි.
- මීට අමතරව උණ, උදර රෝග, පිළිකා ආදී රෝග අවස්ථා වලදී ද විවිධාකාරයෙන් දිවිපහුරු යොදා ගනී.
- එමෙන්ම රස වෙදකමේ දී රසදිය ශෝධනය ට ද දිවිපහුරු භාවිතා කළ බව දක්වා ඇත.

**යෝග**

- දිවි මකුළු විෂට දිවිපහුරු කොළ දියසෙවෙල සමඟ අඹරා ගෑම ද, ඊටම දිවිපහුරු කොළ මකුළුවැන්න කොළ, මුඩමහණ කොළ, තල් කොළ, තල් පොතු, එරබදු පොතු, කිතුල් පොතු, කිතුල් මුල් සමව ගෙන පොල් සමඟ කොටා තෙල් සිඳ ආලේපය ද, බීමට දීමද, එම රොඩු වලින් දුම් ඇල්ලීම ද යහපත් බව සඳහන්.

- එමෙන්ම දිවි මකුළු විෂට  දිවිපහුරු කොළ යුෂ දෙහි ඇඹුලෙන් පෙවීම ද සුදුසු බව දක්වා ඇත.
- නාග විෂට හා මාපිල් විෂට දිවිපහුරු කොළ අඹරා කෑ මුඛයේ බඳිනු ලැබේ.
- පිස්සු බලු විෂට වැල සහමුලින් ගෙන කොට මිරිකා ගත් යුෂ බොන්ට දීම, නස්‍ය කිරීම හා කෑ මුඛයේ ගෑමත් යෝග්‍ය බව සඳහන්.
- ඇස් වෙදකමේදී ඇසේ සුද කැපීමට දිවිපහුරු කොළ දිවිතෙලෙන් මළවා බැඳීම ද, දිවිපහුරු කොළ, පුපුල දළු, එඬරු දළු දොඩම් පැඟිරෙන් හා ගිතෙලින් අඹරා බැඳීම ද සිදු කරයි.
- නිලීකා නම් චර්ම රෝගයට දිවිපහුරු ඇට, පුහුල් කොළ යුෂයෙන් අඹරා ගෑම සුදුසු බව දක්වා ඇත.
- පිළිස්සුම්වලදී හට ගන්නා දිය බබුලුවල මෙම යුෂ ගෑමෙන් සුවය ලැබේ.
- පිළිස්සුම් තුවලවල දිවිපහුරු කොළ අමුකහ සමඟ අඹරා ගෑ යුතුය.
- තවද ඉන්දියාවේ දී, තුවාලය සුව කිරීම සඳහාත්, හිසරදය, ඉදිමීම්, බඹර විෂ, සර්ප දෂ්ට කිරීම්, කුරුළෑ ආදිය සඳහා ප්‍රතිකාර කිරීම සඳහාත් දිවිපහුරු භාවිතා කරයි.

❖ මෙම සම්පූර්ණ ශාකයම ඖෂධ පිණිස ගනී. විෂනාශක ගුණ සහිතයි.

# බිං තඹුරු

## *Ipomoea pescaprae*

## Connvolvulaceae



**ශාකයේ ස්වාභාවය**

බිංතඹුරු මුහුදු වෙරළ අසබඩ සුලබව හමුවන, බිම දිගේ වැඩෙන බහු වාර්ෂික වැල් ශාකයකි.

ඝන වූ මුදුන් මුලක් දරන අතර බොහෝ විට පර්වයන්ගෙන් මුල් හට ගනී.

මාංසල සරල පත්‍ර ඒකාංශ, අණ්ඩාකාර, ප්‍රත්‍යණ්ඩකාර, ඉලිප්සාකාර,වක්‍රාකාර ආදී විවිධ හැඩන් ගනී. පත්‍රයක් දිගින් සෙ.මී. 3-10 පමණ වේ. පත්‍ර පාදය කීලාකාර හෝ ලූප්ත වේ. පත්‍ර අග්‍රය බොහෝ විට නතාග්‍ර වන අතර ඇතැම් විට ලූප්ත විය හැකිය.

පුෂ්ප මංජරියේ බොහෝ විට තනි පුෂ්පයක් දරන අතර ඇතැම් විට බහු අක්ෂයකි. තරමක් විශාල පුනීලාකාර මල් රෝස පාටට හුරු දම් පාට ය. කලාතුරකින් සුදු පැහැති මල් හට ගන්නා ප්‍රභේදයක් හමුවන අතර එය එළ බිංතඹුරු යනුවෙන් හඳුන්වයි.

ඵලය කොටස් හතරකට බෙදුණු ස්ඵෝටිකාවකි. ඒ තුල මි.මී. 6-10 පමණ වන දුඹුරු හෝ කළු පැහැති බීජ පිහිටා තිබේ.

- ❖ මෙවැනිම බිංතඹුරු නමින් හඳුන්වන Ipomoea asarifolia නම් විශේෂයක් ද ලංකාවෙන් හමුවන අතර එය මෙරටට ආගන්තුකව පැමිණි ශාකයක් ලෙස සැලකේ.
- ❖ බිංතඹුරු Connvolvulaceae උද්භිද කුලය අයත් ශාක විශේෂයකි.

**යොදාගත හැකි රෝග අවස්ථා**

- ආමවාත, වාතරක්ත, රක්තවාත, පූයමේහ, අන්ත්‍රශූල, සන්ධිශූල, කුෂ්ඨ, විෂ, කාස, ගුල්ම, උදරරෝග, වණ, වණ සහිත ඉදිමුම්, රක්තප්‍රදර, අර්ශස්, උදරාධ්මාන, අජීර්ණ, ශරීර දාහය, රක්තහීනතාවය, සුප්තවාත, ස්නායු දුර්වලතා, අස්ථි භග්න ආදී රෝග අවස්ථා සඳහා ප්‍රතිකාර කීමට බිංතඹුරු සම්පූර්ණ ශාකයම භාවිතා කරයි.

- බිංතඹුරු වමනකාරක, විරේචක, රක්තශෝධක, මුත්‍රකාරක, ඉදිමුම් සමනය කරන, ශක්තිජනක, විෂනාශක ආදී ගුණ සහිතයි.

**යෝග**

- බිංතඹුරු ක්වාතය, බිංතඹුරු ස්වරසය බිංතඹුරු යොදා නිපදවන ඖෂයන් ය.
- වළලුකර ඉදිමීමට බිංතඹුරු කොළ, අමුකහ, ලුණු සමඟ කොට මලවා බඳී.
- ආමවාත, වාතරක්ත, පූයමේහ, ජලෝදර, සන්ධි ඉදිමුම් ආදියට බිම්තඹුරු කොළ සහ මුල් තැම්බූ කෂාය බොන්නට දෙයි.
- ජලෝදර රෝගය සඳහා මුත්‍රකාරකයක් ලෙස බිංතඹුරු යූෂ යෙදීම හා තලාගත් පත්‍ර ප්‍රලේපය උදරයේ ආලේප කිරීම සිදු කරයි.
- විසර්ප, ආමවාත, ඉදිමුම්, කෙණ්ඩාපෙරලීම්, දියවැඩියාව නිසා හට ගන්නා තුවාල ආදියට බිංතඹුරු කොළ අඹරාගත් ප්‍රලේපය ආලේප කරයි.
- චර්ම රෝගවලට බිංතඹුරු යුෂත්, වාතරක්ත සහ සන්ධි ඉදිමුම් ආදියට පත්‍ර යුෂත් යොදා ප්‍රතිකාර කරයි.
- ගුදභ්‍රංස සහ පාද ආසාදනවලට අදාල ස්ථාන බිංතඹුරු කොළ තැම්බූ ජලයේ බහා තබයි.
- කැඩුම් බිඳුම්වලදී බිංතඹුරු කොළ එළඟිතෙලින් මලවා බඳී.

# වැටකේ

*Pandanus kaida*

**Pandanaceae**

**ශාකයේ ස්වාභාවය**

මෙය බොහෝ දුරට වෙරළබඩ ප්රදේශ ආශ්රිතව සහ දියසීරාව සහිත පහත් බිම්වල වැවෙන දිගු පත්ර සහිත බහුවාර්ෂික ශාකයකි.

මෙහි පිරිමි ශාකය දූනුකෙයියා යනුවෙන්ද ස්ත්රී ශාකය වැටකෙයියා යනුවෙන්ද වර්ග දෙකක් ලෙස හඳුන්වා ඇත.

වැටකේ ශාකයේ කඳෙන් පහලට ඇදෙන ආධාරක මුල් රැසකින් එය පොළවට සම්බන්ධ වී තිබේ.

පත්රයක් අඩි 4-5 දක්වා දිගු වන අතර පත්ර දාරයෙහි කටු වැනි ව්යුහයන් පිහිටා තිබේ.
අලංකාරවත් පුෂ්ප මංජරිය ඉතා සුවඳවත් ය. කොළ පැහැති වැටකේ ඵලය ඉදුණු විට තැඹිලි පැහැයක් ගනී.

වැටකේ Pandanaceae කුලයට අයත් ශාකයකි.

**යොදාගත හැකි රෝග අවස්ථා**


- උණ, අපස්මාරය, ශ්රවණ ආබාධ, අක්ෂි රෝග, අජීර්ණය, කුසගිනි මඳිකම, ඉරුවාරදය, දියවැඩියාව, මානසික රෝග, අර්ශස්, කුෂ්ඨ රෝග, වණ, ආමවාතය, මුත්ර අඩස්සිය, කැඩුම් බිඳුම් ආදී රෝග තත්වයන් සඳහා ප්රතිකාර කිරීමේදී වැටකේ ශාකයේ මුල්, අල, මල්, දඬු, ගෙඩි, ඇට ආදිය යොදා තැනූ ඖෂධ භාවිතා කරයි.

- වැටකේ මොලයට හිතකරයි. රුධිරය පිරිසිදු කරයි. වාජීකරණයි. ස්වේද ජනකයි. වේදනා සමනය කරයි.

# නාගදරණු

## *Martynia annua*

## **Martyniaceae**

**ශාකයේ ස්වාභාවය**

නාගදරණ වැලි මිශ්‍ර පසට ප්‍රිය කරන මීටරයක් දක්වා උසට වැඩෙන කුඩා වාර්ෂික පැළෑටියකි.

මේරූ කඳ කාෂ්ඨීය වේ. ශාකය පුරාම ඇලෙන සුලු බූවක් දක්නට ලැබේ.

තරමක් හෘදයාකාර සරල පත්‍ර සම්මුඛව පිහිටයි. පත්‍රයක් සෙ.මී. 15-23 පමණ දිගට වර්ධනය වේ. පත්‍ර දාරය තරමක් තරංගීමය වන අතර සම්පූර්ණ ය.

ඒකාක්ෂ පුෂ්ප මංජරියක හට ගන්නා සුදු පාටට හුරු දම්පාට මල් අලංකාරවත් ය. සෙ.මී. 2 පමණ දිග කෙලවරික් වක්වූ ඵලය වකුගඩු හැඩැති ය. එය කොළ පාට සිට කහ තැඹිලි පාටට හැරේ. වියළි ඵලය කළු පැහැති ය. එහි තියුණු නබර දෙකක් පිහිටා තිබේ. එය ශාකයේ ප්‍රචාරණය සඳහා වූ අනුවර්තනයක් ලෙස සැලකේ.

❖ නාගදරණ Martyniaceae උද්භිද කුලයට අයත් ශාකයකි.

**යොදාගත හැකි රෝග අවස්ථා**

- ආයුර්වේදයේ කකනශික ලෙස හැඳින්වෙන නාගදරන පැළෑටිය අපස්මාරය, ඉදිමුම්, ක්ෂය රෝගය, උගුරේ ආසාදන සහ තුවාල වලට ප්‍රතිකාර කිරීමේ දී යොදා ගැනේ.
- ඉදිමුම් සහ පිළිස්සුම් සඳහා මෙහි ඵලය ඉතා ප්‍රශස්ත ඔසුවකි.
- ඇට වලින් ලබා ගන්නා තෙල් සමේ කැසිලි ඇති කරන ආසාදන සහ සම මතුපිට වෙනත් රෝග වලට ප්‍රතිකාර පිණිස ගනී.
- නාගදරණ ඵලය නිදි වර්ධනය කරන ඔසුවක් ලෙස භාවිත කරනු ද බහුලව දක්නට ලැබේ.
- වේදනා නාශක සහ ජ්වර නාශක (උණ අඩු කරන) ගුණ දරන නාග දරණ ඉතා ප්‍රකටව එම ගුණ පළ කරයි. එනම් අත්දුටු ප්‍රතිකාරයකි.
- ප්‍රතිඔක්සිකාරක ගුණ සහිත එය කාන්තාවන්ගේ සාඵල්‍යතාව වඩවන අතර පුරුෂයන්ට ද ගුණදායකය. එයින් ශුක්‍රතරලයේ අන්තර්ගත වැඩි කරයි.
- දියවැඩියාව පාලනය සඳහා ද යොදා ගත හැකි ඔසුවකි.

**යෝග**

- තුවාල සුව කරන ගුණ සහිත නාගදරණ ස්වරසය බීමට මෙන්ම ආලේපනයට ද සුදුසු ය.
- එය බැක්ටීරියා ප්‍රතිරෝධී ගුණ පෙන්වයි.
- නිස්සාරණය කරන ලද ස්වරසය බීමෙන් තුවාල වහා සමනය වේ.
- එය ක්ෂුද්‍ර පණුවන් වැනි පරපෝෂිතයන් නසයි.
- කොකුපණු රෝගය සඳහා නොවරදින ඔසුවකි.
- වලිප්පුවට සුව ගෙනෙන මෙම ඔසුව කුඩා දරුවන්ගේ පානයට ඇතුළත් කිරීමට පවා සුදුසුය. වෛද්‍ය උපදෙස් ඇතිව දීම යෝග්‍ය වේ.
- කල් පවතින තුනටියේ වේදනාවට නාගදරණ ගෙඩි එකට අමුණා ඉනේ බැඳීම පැරණි ප්‍රතිකාරයකි.
- මෙරට ගැමියන් කෘමී සහ මඳ විෂ සර්ප දෂ්ඨන ආදී සුලු විෂ සඳහා නාගදරණ ගෙඩියක් ගලගා දෂ්ඨ සථානයේ ආලේප කිරීමට පුරුදුව ඇත.
- යන්ත්‍ර මන්ත්‍ර ආදී ගුරුකම් වැඩ සඳහා ද, නිවාස ආරක්ෂා කිරීම් ආදියටද නාගදරණ ගෙඩි භාවිතා කරයි.
- පැරැන්නන් වියලි නාගදරණ ගෙඩි ගෙමිදුලේ කලාමකව අතුරා තබනුයේ එමඟින් නිවසට සර්පයින් පැමිණීම වලකාලන බවට පවතින විශ්වාසය හේතුවෙනි.

# ඇඹුල් දොඩම්

## *Citrus aurantium*

## Rutaceae






**ශාකයේ ස්වාභාවය**

ඇඹුල් දොඩම් මීටර් 10 පමණ උසට වැඩෙන සිහින් අතු සහිත කුඩා ශාකයකි. ළපටි අතුවල සෙ.මී. 5-8 පමණ දිග තියුණු කටු පිහිටා තිබේ.

ඒකාන්තරව පිහිටන සරල පත්‍ර අණ්ඩාකාර හැඩැති ය. ළපටි පත්‍ර ළා කහ පැහැයට හුරු කොළ පැහැති වන අතර මේරූ පත්‍ර තද කොළ පැහැයක් ගනී.

කක්ෂීය පුෂ්ප මංජරිවල මල් සීමිත සංඛ්‍යාවක් හටගනී. තරමක් විශාල සුදු පැහැති මල් සුවඳවත් ය. ගෝලාකාර හැඩැති බදරියක් වන ඵලය කොළ පැහැති වන අතර ඉදුණු පසු කහ තැඹිලි පැහැයක් ගනී.

ඵලාවරණයේ වාෂ්පශීලී සුගන්ධ තෙල් අඩංගු ය.

ඵලය ඇතුලත මාංශල ආශයිකා රාශියක් සහිත ඛණ්ඩ (බික්) 10-12 සංඛ්‍යාවකට බෙදී පවතී.

යුෂ අතිශ්යය ඇඹුල් රසැති ය. ඵලයේ මධ්‍යයට බරව සුදු පැහැති බීජ පිහිටයි.

- ඇඹුල් දොඩම් Rutaceae උද්භිද කුලයට අයත් ශාකයකි.
- සංස්කෘත භාෂාවෙන් ජම්බීර යනුවෙන් ද හඳුන්වන ඇඹුල් දොඩම්වලට අමතරව තවත් දොඩම් වර්ග කීපයක් ඖෂධ සඳහා බාවිතා කරන බව වෙදකමට සම්බන්ධ මූලාශ්‍රවල දක්වා තිබේ.
- ඒ අතර මධු ජම්බීර හෙවත් පැණි දොඩම්, නාරංග හෙවත් හීං නාරං, බීජපූර හෙවත් මාතුලංග හෙවත් නස්නාරං, මධුකර්කටිකා හෙවත් ලප්නාරං, වනබීජපූර හෙවත් දෙහි, ජම්බීරද්වය හෙවත් ජම්බෝල සහ සීදරන් ද වේ.
- විශේෂයෙන් ඇඹුල් දොඩම් යුෂ දේශීය චිකිත්සාවේදී සුලභව භාවිතා කරන ඔසුවකි.

**යොදාගත හැකි රෝග අවස්ථා**

- පිපාස, ආම දෝෂ, කුසගිනි මදිකම, මුඛ රෝග, හෘද රෝග, පණු රෝග ආදිය සඳහා ප්‍රතිකාර කිරීමේදී ඇඹුල්දොඩම් යුෂ සුලභව භාවිතා වේ.
- ඊට අමතරව ඇඹුල් දොඩම් මුල්, මල්, ගෙඩි, ඇට, ඇටතෙල්, දළු, කොළ, ගෙඩියෙහි පිට පොත්තේ ඇති දොඩම් පැඟිරි ආදිය ද ඔසු සඳහා භාවිතයට ගනී.
- සෙම්ප්‍රතිශ්‍යාව, උණ, කැස්ස, හතිය ආදී සෙම් කෝප රෝග අවස්ථාවල දී මෙන්ම අජීර්ණ ආදී උදර රෝගයන්ට ද මෙය ගුණදායක ය.
- සෙම් රෝග මෙන්ම වමනය ආදී රෝග අවස්ථාවලදී නවරත්න කල්කය ඇඹුල් දොඩම් යුෂයෙන් පානයට දීම දේශීය වෛද්‍යවරුන් සුලබව භාවිතා කරන ප්‍රතිකාරයකි.

**යෝග**

- ජම්බීර කල්කය, ජම්බීර ලවන වටී, ජම්බීරාදී පානකය ආදිය ඇඹුල් දොඩම් යොදා නිපදවන ඖෂධයන් ය.
- එමෙන්ම මහා කෝල දවුණ්ඩය, දියතාරාමය ආදී ගුලි ඇඹරීමේදී මාත්තුවක් ලෙස ඇඹුල් දොඩම් යුෂ යෙදේ.
- සීතාරාම, බුද්ධරාජ, මාත්තු පහ ,චන්ද්‍ර කල්කය, ශර්කරාදි කල්කය, යෂ්ඨි කල්කය ආදී ගුලි කල්කවල අනුපාන ලෙස ඇඹුල් දොඩම් යුෂ මෙන්ම දලු භාවිතා වෙයි.
- දේශීය ගුලි කල්ක බොහොමයක අනුපාන ලෙස ඇඹුල් දොඩම් යෙදන අතර එයින් බුද්ධරාජ කල්කයෙහි මකරන්දන් අනුපානය ඉතා ප්‍රකටය. එනම් ඇඹුල් දොඩම් යුෂ, අමු ඉඟුරු යුෂ හා මී පැණි යන ත්‍රිත්වයේ එකතුවයි.
- දොඩම් ගැට පුලුස්සා ගත් අළු, පරණ ගොරකා සමඟ දොඩම් ඇඹුලින් අඹරා, රත් කර ගැමෙන් බිඳුණු සන්ධි සවිවන බව සඳහන්.
- පොළොං විෂට දෙහි හා දොඩම් කොළ සහ පොතු, ඉඟුරු අල සමග සම සමව ගෙන දුම් අල්ලනු ලබයි.
- අබ ඇට පතක් පමණ දොඩම් ගෙඩියක් තුලට ලා, උණ අළුවෙන් තම්බා එම ඇඹුලෙන් ඇස වටා ගෑම නුවන් පිළිකාවලට ප්‍රතිකාරයකි.
- දොඩම් ඇට මද, තෝර ඇට, දිවුල් මද සමව ගෙන එළකිරෙන් අඹරා ඇස වටා ගෑමෙන් ඇස්වල රත සුවවන බව සඳහන්.
- එමෙන්ම රස ශාස්ත්‍රයේදී චපල, ස්වර්ණ මාක්ෂික, අඤ්ජන කැට, සංඛ ආදී රස ඖෂධ ශෝධනයට ප්‍රධාන වශයෙන්ම ගැනෙනුයේ ඇඹුල් දොඩම් යුෂ ය.

# වල්ලූණු

## *Pancratium zeylanicum*

## Amaryllidaceae



**ශාකයේ ස්වාභාවය**

වල්ලූණු බල්බය නමින් හඳුන්වන ව්‍යාජ භූගත කඳක් හෙවත් අලයක් සහිත කුඩා බහු වාර්ෂික පැළෑටියකි. බල්බයේ හැඩය ගෝලාකාර හෝ උපගෝලාකාර වේ.

මාංසල බවින් යුත් පත්‍රයක දිග සෙ.මී. 15-30 දක්වා විය හැකි අතර පළල සෙ.මී. 1.5-2 දක්වා වේ. පත්‍ර හැඩය පටු ලන්සාකාර හෝ ප්‍රතිලන්සාකාරයි. උඩ පෘෂ්ඨය ඔප සහිත කොළ පැහැ වන අතර යට පෘෂ්ඨය අළු පැහැයට හුරු කොළ පැහැතිය.

පත්‍ර ගොනුවෙන් පැන නගින සෙ.මී. 8.5-25 පමණ දිග සිලින්ඩරාකාර නටුවක් සහිත මල් තනි තනිව හට ගනී. මල් සුදු පැහැති වන අතර අලංකාරවත් ය.

තල 3ක් සහිත බීජ කෝෂය සෙ.මී.2ක් පමණ දිග වන අතර සෙ.මී.1.5ක් පමණ පළලයි. ඒ තුල උප ගෝලාකාර හැඩැති බීජ විශාල ප්‍රමාණයක් පිහිටයි.

විසිතුරු ශාකයක් ලෙස ද වැවිය හැකි වල්ලූණු Amaryllidaceae උද්භිද කුලයට අයත් දේශීය ශාක විශේෂයකි.

ඇතමුන් මෙම ශාකයට තරමක් සමාන සුදු මල් හට ගන්න Hymenocallis littoralis සහ Hymenocallis littoralis නම් විදේශීය විසිතුරු දෙකක් සහ රතු හෝ තැඹිලි පැහැති මල් හට ගන්නා Hippeastrum puniceum නම් විදේශීය විසිතුරු ශාකයක් වල්ලූණු ලෙස සලකා ඖෂධ සඳහා භාවිතා කරනු දැකගත හැකිය. විද්වත් මතයට අනුව එය ඵලදායී නොවන වැරදි භාවිතයකි.

**යොදාගත හැකි රෝග අවස්ථා**

- ගෙඩි, අර්ශස්, කැඩුම් බිඳුම් ආදියට ප්‍රතිකාර කිරීම සඳහා ප්‍රධාන වශයෙන් වල්ලූණු ශාකයේ බල්බය හෙවත් අලය භාවිතා කරයි.
- අස්ථි භග්නයකදී කැඩී ඇති සියුම් ඇට කැබලි එළියට ගැනීම සඳහා වල් ලූණු අල, මුං ඇට සමග පොල් කිරෙන් අඹරා බඳියි.

# ඒකාවේරිය

## *Rauvolfia serpentina*

## **Apocynaceae**

**ශාකයේ ස්වාභාවය**

දේශීය ශාකයක් වන ඒකාවේරිය ඖෂධයක් වශයෙන් පමණක් නොව දේශීයව රත්රං නිස්සාරණය සඳහා යොදාගත් රසායන ද්රව්යයක් ලෙස ද භාවිතා කර ඇති බව "දේශීය වෛද්ය ශබ්ද කෝෂයෙහි" දැක්වේ.

ඒකාවේරිය ශාකය මීටයක් පමණ ඉහලට වර්ධනය වන කුඩා බහුවාර්ෂික පැළෑටියකි.

ලන්සාකා

ර පත්රයක් සෙ.මි. 7-13 පමණ වැඩෙන අතර ළා කොළ පැහැයෙන් යුක්තය. බහු අක්ෂ පුෂ්ප මංජරියක හට ගන්නා මල් සුදු පැහැතිය.

කොළ පැහැති ඵලය ඉදුණු විට දම් පැහැයක් ගනී. ඒකාවේරිය Apocynaceae කුලයට අයත් ශාකයකි.

මෑතක සිට Rauvolfia tetraphylla යන උද්භිද නාමයෙන් හඳුන්වන නිවර්තන ඇමරිකාව ජන්ම භූමිය කරගත් විදේශීය ශාකයක් වල් ඒකාවේරිය නමින් හඳුන්වමින්, ඒකාවේරිය වෙනුවට ඖෂධ සඳහා යොදා ගන්නා මුත් එය කිසිසේත්ම සුදුසු භාවිතයක් නොවේ.

එවැනි නුසුදුසු ආදේශක ශාක භාවිතා කිරීම දේශීය වෛද්ය ක්රමවල ගුණාත්මක භාවයට හානිකර බව අවධාරණය කළ යුතුය.

**යොදාගත හැකි රෝග අවස්ථා**

- බටහිර ජාතීන් ඒකාවේරිය ශාකය අධි රුධිර පීඩනය සඳහා ප්රශස්ථ ඖෂධයක් බවට හඳුනා ගන්නේ 17 වැනි සියවසේදී පමණ වුවද අනාදිමත් කාලයක සිට පෙරදිග ජනයා මෙය ඖෂධ හඳහා භාවිතා කර ඇත.
- ළදරු අතීසාරය, කොළරාව, කුසගිනි මදිකම, ආර්තව වේදනා, ප්රසව වේදනා, අධි රුධිර පීඩනය, සර්ප විෂ, මී විෂ, ගෝනුසු විෂ, මකුළු විෂ, උණ, චර්ම රෝග, මානසික රෝග, මැලේරියාව ආදී රෝග රැසක් සඳහා ප්රතිකාර කිරීමේදී ඒකාවේරිය ශාකයේ මුල් සහ කොළ යෙදූ ඖෂධ භාවිතා කරයි.
- ඒකාවේරිය පණුවන් නසයි.
- උණ නසයි.
- ගර්භාෂය උත්තේජනය කරයි.
- වේදනාව සමනය කරයි. නිද්රාජනකයි.
- රුධිරවාහිනී ප්රසාරණය කරයි.
- කුසගිනි වඩවයි.

**යෝග**

- මකුළු, සර්ප, ගෝනුසු, මීයන්ගේ විෂ ආදියට ඒකාවේරිය මුල් දෙහි ඇඹුලින් හෝ ඇල් දියෙන් උරච්චි කර ගෑම
- සෙම්ගෙඩිවලට ඒකාවේරිය මුල්, එළබටු ගෙඩි දොඩම් ඇඹුලින් අඹරා ගෑම.


❖ මේ ආදී ගුණ රාශියකින් සමන්විත වන ඒකාවේරිය ශාකය යොදාගෙන නිපදවන සර්පගන්ධා නාමය සහිත ඖෂධ වර්ග රාශියකි.

# සුදු හඳුන්

## *Santalum album*

## **Santalaceae**






### ශාකයේ ස්වාභාවය

ශ්වේත චන්දන නමින් හඳුන්වන සුදුහඳුන් මීටර් 6-10 පමණ උසට වැඩෙන, සුගන්ධවත් ලීයක් සහිත බහු වාර්ෂික ශාකයකි.

සිනිඳු පොත්තක් සහිත කඳ කළු පැහැතිය. හොඳින් මේරූ ශාකයක පොත්ත රළු විය හැකිය. කඩා හැලෙන ස්වභාවයකින් යුත් අතු රාශියක් සම්මුඛව පිහිටයි.

ඕවලාකාර, අණ්ඩාකාර-ඕවලාකාර හෝ ලන්සාකාර හැඩැති පත්‍ර සම්මුඛව පිහිටා තිබේ. පත්‍රයක් සෙ.මී. 6 දක්වා දිගු විය හැකිය.

සංයුක්ත ඒකාක්ෂමය බහු අක්ෂයක් වන පුෂ්ප මංජරියක පිහිටන ද්විලිංගික පුෂ්ප රාශියකි. මි.මී. 5 පමණ වන කුඩා පුෂ්ප දම් පැහැති ය.

ගෝලාකාර ඵලය තරමක් මාංසලය. ඉදුණු විට කළු පැහැයක් ගනී.

- ❖ සුදු හඳුන් Santalaceae උද්භිද කුලයට අයත් ශාකයකි.
- ❖ අතීතයේ දඹදිව මියුළු නුවර සිරිවර්ධන සිටුතුමාට දාව උපන් කුමරා මව් කුසින් බිහිවන විට සුදුහඳුන් කැබැල්ලක් මිට මොළවාගෙන උපන් හෙයින් මහා ඖෂධයක් ගෙන ආ තැනැත්තා යන අර්ථයෙන් මහෞෂධ නමින් හැඳින්වූ බව පැරණි සාහිත්‍යයේ සඳහන් වේ.
- ❖ එය පුරාණයේ සිටම සුදුහඳුන් වටිනා ඖෂධයක් බව දැන සිට බවට සාක්ෂියකි.

### යොදාගත හැකි රෝග අවස්ථා

- හිසෙහි වේදනා, දැවිල්ල, විසර්ප, චර්ම රෝග, මානසික රෝග, කෘෂ්ණා, අතීසාර, ප්‍රවාහිකා, පණු රෝග, රක්ත පිත්ත, හෘද රෝග, කල්ගතවූ කැස්ස, මුත්‍ර අඩස්සිය, මුත්‍ර දැවිල්ල, පූයාමේහ, රක්ත ප්‍රදර, ශ්වේත ප්‍රදර, ශුක්‍රමේහ ආදී රෝග රැසක් සඳහා ප්‍රතිකාර කිරීමට සුදුහඳුන් ශාකයේ පිටපොත්ත, දළු, අරටුව සහ තෙල් භාවිතා කරයි.
- සුදුහඳුන් දුඟඳ නසන, දාහය සමනය කරන, පණුවන් නසන, මුත්‍රකාරක, ස්වේද ජනක, රුධිරය පිරිසිදු කරන විෂ නාෂක ආදී ගුණයන් රැසක් සහිතයි.

### යෝග

- හික්කාවට සුදුහඳුන් තන කිරෙන් ගලගා නස්‍ය කරයි.
- ශුක්‍ර මේහයට සුදුහඳුන් ඵාණ්ඨ කෂාය දෙයි.
- වමනයට සුදුහඳුන් ගලගා නෙල්ලි ස්වරසයෙන් හෝ නෙල්ලි කෂායෙන් බීමට දිය යුතුය.
- සුදුහඳුන් චූර්ණය කිරි සහ සීනි සමඟ බීමෙන් මුත්‍ර අඩස්සිය සුව වෙයි.

- සුදුහඳුන්, ඉඟිනි ඇට, සමව ගෙන අඹරා තැඹිලි වතුරේ දියකර සහිඳ ලුණු දමා උදෑසන හිස්බඩ පානය කිරීමෙන් මුත්‍ර දැවිල්ල සමනය වෙයි.
- උරච්චි කරගත් සුදු හඳුන් තැඹිලි වතුරේ දියකර පානය කිරීමද මුත්‍ර දැවිල්ලට ප්‍රතිකාරයකි.
- හිස කැක්කුමට සුදුහඳුන් ඇල් දියෙන් ගල ගා රෙදි කඩක තවරා සඳුන් නොගෑ පැත්ත නළල ප්‍රදේශයේ එළීම සහ කෝමාරිකා යුෂින් ගලගා රෙදි කඩක තවරා නළලේ එළීම ප්‍රතිකාරයන් ය.
- පීනසයට සුදු හඳුන් කුඩු, වියළි ඉඟුරු කුඩු, කහ කුඩු තේ හැන්දක් බැගින් තැඹිලි ගෙඩියකට දමා රාත්‍රී පින්නේ තබා උදෑසන හිස්බඩ පෙරා පානය කළ යුතුය.
- සුදුහඳුන්, පොකුරු වදමල් තැම්බූ වතුර පානය කිරීමෙන් රුධිරය පිරිසිදුවේ.
- සුදුහඳුන් කුඩු ඇල් දියෙන් දියකර එයට සීනි, මී පැණි දමා පානය කිරීමෙන් ශරීර දාහය සමනය වෙයි.
- සුදුහඳුන් ගලගා එළකිරි සමඟ මිශ්‍රකර සමේ ආලේප කිරීමෙන් සම පැහැපත් වෙයි.
- එයින් සම පෝෂණය කර මුහුණේ ඇතිවන කුරුලෑ ලප කැළැල් සුවකර සම රැලි වැටීම පාලනය කරයි. සුදුහඳුන්, සැවැන්දරා මුල්, කළු අගිල්, ඉරිවේරිය කොළ යන මේවා සමව ගෙන කොටා ඇල් දියෙන් අඹරා ශරීරයේ ආලේප කර පැයකින් පසු ජලස්නානය කිරීමෙන් ශරීරයේ දුගඳ නැතිවී සුගන්ධවත් වෙයි.
- සඳුන් තෙල් සුවඳ විලවුන් සහ රූපලාවන්‍ය ද්‍රව්‍ය නිපදවීමටත් යොදා ගනී.
- සඳුන් කිරි පැන් පිරිත් මණ්ඩපවල ඇතුළු බොහෝ සුභ කටයුතුවලදී භාවිතා කරයි.
- ළපටි කොළ මැල්ලුමක් ලෙස හෝ සලාදයක් ලෙස අහාරයට එක් කර ගත හැකිය.

❖ මෙවැනි වටිනාකම් රැසක් සහිත සුදුහඳුන් ශාකයක් නිවසේ වවා ගැනීම ගෙඋයනේ අලංකාරය පිණිසද හේතු වනු ඇත. සුදුහඳුන් පැලයක් වැවීමේදී ඒ අසලම දාස්පෙතියා හෝ නිදිකුම්බා ගසක් වැවීම මඟින් සුදුහඳුන් ගසේ ඉක්මන් වර්ධනයට උපකාරී වෙයි.

❖ Erythroxylum novogranatense යන උද්භිද නාමයෙන් හඳුන්වන විදේශීය ශාකයක් මෑතක සිට සුදු හඳුන් නමින් මෙරට බොහෝ නිවෙස්වල වවා තිබෙනු දැක ගත හැකිය.

❖ කොකේන් (Cocaine) නමින් ද හඳුන්වන විෂ සහිත ශාකයක් වන එය සුදුහඳුන් වෙනුවට ඖෂධ සඳහා භාවිතා කළහොත් අහිතකර ප්‍රතිඵල අත්වනු ඇත. එම නිසා එම ශාකය සහ සුදුහඳුන් ශාකය වෙන්කර හඳුනාගෙන, එම විෂ සහිත ශාකය නිවසේ වවා ඇත් නම් විනාශ කර දැමීමට උනන්දු විය යුතුය.

❖ සුදුහඳුන් කොල පළාවක් ලෙස ආහාරයට ගන්නා විට මේ ගැන විශේයෙන් සොයා බලා සැක හැර භාවිතයට ගත යුතුය. සුදුහඳුන් ශාකයේ පත්‍ර සම්මුඛව පිහිටීමත් මෙම කොකෙන් ශාකයේ පත්‍ර ඒකාන්තරව පිහිටීමත් මෙම වර්ග දෙක පහසුවෙන් වෙන්කර හඳුනා ගැනීමට ඉවහල්වන ප්‍රධානම ලක්ෂණයක් වේ.

# රන්වන් කටුකරඬු

## *Barleria lupulina*

## Acanthaceae






**ශාකයේ ස්වාභාවය**

මෙය මීටර් 1.5 දක්වා උසට පඳුරක් ආකාරයෙන් වැඩෙන ශාකයකි.

දිගැටි හැඩයෙන් යුත් තද කොළ පැහැති පත්‍රවල නාරටි රතු/දුඹුරු පැහැයෙන් යුක්තය. පත්‍ර නටුවෙහි මුල තියුණු කටු සහිතය.

පුෂ්පමංජරියක හට ගන්නා මල් කහ තැඹිලි පැහැතිය.

මෙහි ඵලය උලක් වැනි අවයවයක් සහිත ස්ඵෝටිකාවකි.

❖ රන්වන් කටුකරඬු ශාකය Acanthaceae කුලයට අයත්ය.

**යොදාගත හැකි රෝග අවස්ථා**

- ප්‍රධාන වශයෙන් සර්ප විෂ සහ කෘමි දෂ්ඨන සඳහා ප්‍රතිකාර කිරීමට මෙම ශාක කොටස් භාවිතා කරයි.

- එමෙන්ම මාංශ පේශී ලිහිල් කිරීමට, වාත වේදනා, ගෙඩි, කුරුළෑ, බඩවැල් තුළ හට ගන්නා තුවාල, දියවැඩියාව, ස්නායු ආබාධ අාදිය සඳහා ද රන්වන් කටුකරඬු ශාකයේ කොළ, මුල් ආදිය භාවිතා කරයි.

- වේදනා නාශක සහ විෂබීජ නාශක ගුණ සහිතයි.

# නවහන්දි

*Rhipsalis baccitera*

**Cactaceae**



**ශාකයේ ස්වාභාවය**

නවහන්දි දියසීරාව සහිත ගල් පර්වත ආශ්‍රිතව සහ තෙත්කළාපීය වනනාන්තරවල විශාල ගස් මත පහලට එල්ලා වැටෙමින් වැඩෙන පඳුරු ආකාර අපි ශාකයකි.

තන්තුමය මූල පද්ධතියක් සහිත මෙම පැළෑටියේ කොළ පැහැති මාංසල කඳ සිලින්ඩරාකාර ය. කඳ දෙකට බෙදෙමින් පහලට වර්ධනය වේ.

පත්‍ර ඉතා කුඩා වන අතර ළපටි ශාකවල පමණක් දක්නට ලැබේ.

කුඩා සුදු පැහැති මල් කඳේ තනි තනිව හට ගනී.

සුදු පැහැති මාංසල ඵලය විනිවිද පෙනෙන සුලුය. එ් තුල පිහිටි යුෂමය ද්‍රාවණයක ගිලුණු කළු පැහැති බීජ රාශියකි.

- ❖ නවහන්දි Cactaceae උද්භිද කුලයට අයත් දේශීය ශාක විශේෂයකි.
- ❖ ඇතමුන් තවත් මෙවැනිම පෙනුම සහිත දේශීය ශාකයක් වන මුවකීරිය සමඟ නවහන්දි පටලවා ගනී.
- ❖ Sarcostemma viminale යන උද්භිද නාමයෙන් හඳුන්වන මුවකීරිය පොලවෙහි සිට ඉහලට වර්ධනයවන පඳුරක් හෝ වැලක් වන අතර නවහන්දි ඉහල සිට පහලට එල්ලා වැටෙන අපි ශාකයක් වීම මෙම දෙවර්ගය වෙන් කර හඳුනා ගැනීමට පහසුම ලක්ෂණය ලෙස සැලකිය හැකිය.
- ❖ නවහන්දි ගැන කතාකරන විට පැන නඟින තවත් ගැටළුවක් වන්නේ දේශීය උද්භිද විද්‍යා මූලාශ්‍රවල Euphorbia tirucalli නම් උද්භිද නාමයෙන් හඳුන්වන කිරි බහුල විදේශීය ශාකයක් නවහන්දි ලෙස හඳුන්වා තිබීමයි.
- ❖ ඉතා කුඩා අප්‍රකට පත්‍ර දරන, කොළ පැහැති කඳ ප්‍රකටව පෙනෙන මෙම ශාකය ඇතැම් විට ගස් නවහන්දි , රට නවහන්දි සහ කිරිහන්දි යන නම්වලින් හඳුන්වනු දක්නට ලැබේ.

- ❖ දේශීය ඖෂධ වට්ටෝරුවල නවහන්දි ලෙස සඳහන්ව ඇති විට දේශීය අපි ශාකය මිස මෙම විදේශීය ශාකය භාවිතා කිරීම වැරදි බව අවධාරණය කළ යුතුය.

**යොදාගත හැකි රෝග අවස්ථා**

- වාපිත් රෝග, සංක්‍රමණික රෝග, ජලභීතිකා, ශාරීරික දුර්වලතාවයන්, මානසික රෝග, කැඩුම් බිඳුම්, අස්ථිප්‍රදාහ, කැස්ස, ඇදුම, අහාර අරුචිය, අජීර්ණය, හෘදරෝග, අක්මාරෝග, අර්ශස්, මානසික අවසාදතාව වැනි රෝග සඳහා ප්‍රතිකාර කිරීමට නවහන්දි සම්පූර්ණ ශාකයම භාවිතයට ගනී.
- නවහන්දි රසායන, බලකාරක, නිද්‍රාකාරක, වමනකාරක, මෘදුවිරේචක, මුත්‍රකාරක, උත්තේජක, ක්ෂීරය වර්ධනයකරන ආදී ගුණ සහිතයි.

**යෝග**

- දේශීය කැඩුම් බිඳුම් වට්ටෝරු රැසක නවහන්දි ඇතුලත්ව ඇත.
- අස්භඊග්න හා ප්‍රදාහිත අවස්ථාවලට නවහන්දි සම්පූර්ණ ශාකය, අමුකහ , ලූණු දමා කොටා මලවා බඳී.
- කුඩා දරුවන්ගේ අස්භඊභග්නවලට  හාතාවාරිය කොල, නවහන්දි, බැල තණ, අමුකහ, ලූණු, පොල් දමා කොටා මලවා බඳී.
- හැටපෑ හන්දියට නවහන්දි, හාතාවාරිය කොළ, එලබිංතඹුරු කොළ, ඔලිඳ කොළ, කොබ්බෑ කොළ යන මේවා ගෙන පොල්, කහ, ලූනු දමා කොටා මලවා බඳී.
- වාතරෝග  සඳහා නවහන්දි ශාකය භාවිතාකර වේදු පෑම ගුණදායකය.
- දේශීය කැඩුම් බිඳුම් වෙදකමේදී මැල්ලුම් සහ තෙල් වර්ග සෑදීමටත්, විශේෂයෙන් මෙහි දන්ඩ හන්දි තෙල් සෑදීමටත් යොදා ගනී.
- නවහන්දි තැල්මට ඉතා ගුණ බව සඳහන් වේ.

# ඇඹරැල්ලා
## *Spondias dulcis*
## Anacardiaceae



**ශාකයේ ස්වාභාවය**

ඇඹරැල්ලා ශක්තිමත් නොවන කඳක් සහිත පතනශීලී හෝ පතනශීලී නොවන කුඩා හෝ මධ්‍යම ප්‍රමාණයේ ශාකයකි.

කඳ සහ අතු සිනිඳු වන අතර පොත්තෙන් මැලියම් ස්‍රාවය වෙයි.

ඒකාන්තරව පිහිටන අසම පක්ෂවත් සංයුක්ත පත්‍ර සෙ.මී. 45 දක්වා දිගු විය හැකිය. සංයුක්ත පත්‍රයක පත්‍රිකා යුගල් 3-7 දක්වා පිහිටන අතර එක් පත්‍රිකාවකින් අවසන් වේ.

අග්‍රස්ථිය පුෂ්ප මංජරිය සංයුක්ත බහු අක්ෂයකි. කුඩා ද්වීලිංගික පුෂ්ප කොළ පාටට හුරු කහ පාටය.
ඵලය සෙ.මී. 7 පමණ දිග අණ්ඩාභ හැඩැති මාංසල අෂ්ටිලයකි.

- ❖ සොලමන් දූපත්, ක්‍රිස්මස් දූපත්, මලුකු වැනි ඕස්ට්‍රේලියානු අර්ධද්වීපය අවට දූපත් රාජ්‍යයන් කීපයකට පමණක් දේශීය වන ඇඹරැල්ලා ශාකය මේ වන විට ලෝකයේ රටවල් බොහෝමයකට ව්‍යාප්තව ඇත.
- ❖ මෙකල ගෙවතුවල වගා කරන මිටි ඇඹරැල්ලා නම් කුඩා ශාකය මෙම විශේෂයේම ප්‍රභේදක් ලෙස සැලකේ. එමෙන්ම මෙම උද්භිද ගණයටම අයත් වල් ඇඹරැල්ලා (Spondias pinnata) නම් දේශීය ශාකයක් ඇති අතර එය මෙරට සහ වෙනත් රටවල සාම්ප්‍රදායික වෛද්‍යක්‍රමවල ඖෂධ සඳහා භාවිතා කරයි. ඇඹරැල්ලා වර්ග Anacardiaceae උද්භිද කුලයට අයත් ශාක විශේෂයන් ය.

**යොදාගත හැකි රෝග අවස්ථා**

- ගණ්ඩමාලය, මුත්‍ර මාර්ගයේ ඉදිමුම්, ග්‍රහණී, අතීසාර, අර්ශස්, අහාර අරුචිය, ගර්භාෂයේ ශ්ලේෂ්මල පටල ඉදිමීම, දරු ප්‍රසූතියෙන් පසු ලේ වහනය, අම්ලපිත්තය, දියවැඩියාව, අධි රුධිර පීඩනය, කල්ගතවූ කුෂ්ට, කැස්ස, කක්කල් කැස්ස, උදරාබාධ, ශ්වේත ප්‍රදර, පූය මේහ, රක්තඅතීසාරය, ප්‍රවාහිකා, තුවාල,

පිලිස්සුම්, අක්ෂි රෝග, උගුරේ තුවාල සහ මුඛයේ ආසාදන ආදී රෝග රැසකට ප්‍රතිකාර කිරීමට ඇඹරැල්ලා ශාකයේ පොතු, කොළ, ගෙඩි ආදිය භාවිතා කරයි.

**යෝග**

- සෙම ඉවත් කිරීමට ඇඹරැල්ලා ගසේ පොත්ත පිට කුරුට්ට ඉවත්කර එයට ලුණු, ගම්මිරිස්, අමු ඉඟුරු ස්වල්පය බැගින් දමා කොටා නස්නාරං ඇඹුලෙන් අනා උගුරේ ගෑ යුතුය.
- බෙල්ල ඉදිමීමට ඇඹරැල්ලා පොතු කොටා දෙහි ඇඹුලෙන් අඹරා කකාරා බලේලේ ගෑමට නියම කර ඇත.
- ඇඹරැල්ලා පොතු, අරළු, අමු ඉඟුරු සමව ගෙන දෙහි ඇඹුලෙන් අඹරා කකාරා ගෑම ගණ්ඩමාල රෝ්ගයට ප්‍රතිකාරයකි.
- තැල්මට ඇඹරැල්ලා පොතු ලුණු වතුරෙන් අඹරා කකාරා ගායි.
- කල්ගතවූ කුෂ්ට හා කක්කල් කැස්සට හොඳියෙන් පැසී ඉදුණු ගෙඩි පොතු හැර, ගැරොප්පුවකින් සිදුරු කර මී පැණියේ බහා තබා දිනපතා ගෙඩිය බැගින් කෑමට ගත යුතුය.
- ගර්භාෂයේ ශ්ලේෂ්මල පටල ඉදිමීම. මුත්‍ර මාර්ගය ආශ්‍රිත ඉදිමීම්, දියවැඩියාව, ශ්වේත ප්‍රදර, පූය මේහ, ප්‍රවාහිකා, රක්ත අතීසාර ආදී රෝග අවස්ථා සඳහා ප්‍රතිකාර කිරීමට ඇඹරැල්ලා පොතු කෂාය යොදා ගනී.
- අමු ඇඹරැල්ලා ගෙඩි ව්‍යංජනයක් ලෙසත්, ඉදුණු ගෙඩි පළතුරක් ලෙසත් කෑමට ගත හැකිය.
- ඇඹරැල්ලා දළු සම්බෝලයක් ලෙස සකසා අහාරට එකතු කර ගැනීමට පුලුවන.
- එමෙන්ම ඇඹරැල්ලා යොදා ගෙන ජෑම්, චට්නි, අච්චාරු ආදිය සාදා ගත හැකිය.
- අධික රුධිර පීඩනයෙන් පෙලෙන අයටත්, හෘද රෝගීන්ට හා දියවැඩියා රෝගීන්ටත් එළවළුවක් ලෙස මෙන්ම පළතුරක් ලෙස ද ඇඹරැල්ලා ආහාරයට ගැනීම ගුණදායක ය.

# අලු පුහුල්

## *Benincasa hispida*

## Cucurbitaceae

ඔසු තැනීමට ගනු ලැබේ. අළු පුහුල් කොළ හා දඬු යොදා තනා ගන්නා කෂාය විෂ පෙවුන විට මාහැඟි ප්‍රතිකාරයකි.

යුනානි වෙදකමේ අළු පුහුල් ඇට වලින් සිදින තෙලක් හිස සිසිල් කිරීමට නිර්දේශ කරයි.

ශරීර අභ්‍යන්තරයේ ඇති වන ලේ ගැලීම් නැවත් වීමට අළු පුහුල් යුෂ යොදා ගනී.

**ශාකයේ ස්වාභාවය**

ඉතා ඉක්මනින් වැඩෙමින් පඳුරු වල ආධාරයෙන් ඉහල නගින වැල් වර්ගයකි. හෘදයාකාර පත්‍ර බන්ඩිකා 5 කට බෙදී ඇත.

අඟල් 12 - 18 දක්වා වැඩෙන ඵලය සිලින්ඩරාකාර මාංශල බදරියකි. එහි පිට පොත්තේ සුදු පැහැති ඇලෙන සුලු කුඩක් ඇත.

ඵලය තුළ ලා කහ පැහැති ඇට බොහෝ ය.

ලංකාව, ඉන්දියාව, මලයාව, චීනය, ජපානය හා නිවර්තන අප්‍රිකාව යන රටවල වවනු ලැබේ.

ලංකාවේ හේන් වල වගාකරන අතර ගෙවතු වල ද දක්නට ලැබේ. අළු පුහුල් ව්‍යාංජනයක්, ඖෂධයක් සහ රස කැවිලි සෑදීම සඳහාත් භාවිත කෙරේ.

අළු පුහුල් Cucurbitaceae කුලයට අයත් ශාකයකි.

**ඖෂධීය වටිනාකම**

- සංස්කෘත වෛද්‍ය ග්‍රන්ථ වල අළු පුහුල් හැඳින්වෙන්නේ “කුෂ්මාන්ඩ“ යන නමිනි. කඩා මාස කිහිපයක් ගත වූ අළු පුහුල් ශරීරය නිවා තර කරයි.
- ශක්තිය ලබා දෙයි. රත්, පිත් හා වාත දෝෂ නසයි. කුසගිනි වඩයි.
- අන්ත්‍ර හෙවත් බඩවැල් ශුද්ධ කරයි.
- පිත් දෝෂ සමනය කරයි.
- අළු පුහුල් ඇට මූත්‍රා අඩස්සිය හෙවත් හරිහැටි මූත්‍ර පහ නොවීමට ප්‍රශස්ථ ප්‍රතිකාරයකි.
- එම ඇට අඹරා යටි බඩේ ආලේප කිරීමෙන් මූත්‍රා අඩස්සිය පහව යයි.
- අළු පුහුල් යුෂ ක්ෂය රෝගය, සිහි විකල් වීම, මීමැස්මොරය, පෙණහලුවල වණ, පීනස හා ඇදුම ආදියට ප්‍රතිකාර වශයෙන් යොදනු ලබන වශයෙන් අළු පුහුල් වලින් තනනු ලබන “ඛණ්ඩකුෂ්මාණ්ඩය“, “වාසකුෂ්මාණ්ඩඛණ්ඩය“ සහ“කුෂ්මාණ්ඩඝෘතය“ ශරීරය තරකොට දාහය හෙවත් දැවිල්ල නිවා බලවර්ධනය කරන ඖෂධ රසායනයි.

# පළොල්

## *Stereospermum chelonoides*

## **Bignoniaceae**








වෙදකමට සම්බන්ධ මූලාශ්‍රවල පාටලී යනුවෙන් හඳුන්වා ඇත්තේ පළොල් ය.

ඒවායෙහි පළොල් වර්ග කීපයක් ගැන සඳහන්ව ඇති අතර එක් වර්ගීකරණයකට අනුව රක්ත පාටලා සහ ශ්වේත පාටලා නම් වර්ග දෙකක් දක්වා ඇත.

එයින් රක්ත පාටලා නම් මෙහිදී විස්තර වන ලංකාවේදී පළොල් / රත් පළොල් ලෙස හඳුන්වන දේශීය ශාකය වන අතර ශ්වේත පාටලා නම් එම උද්භිද ගණයටම අයත් දේශීය ශාකයක් වන දුනුමඩලා (Stereospermum tetragonum) ය. දුනුමඩලා මෙරටදී එළ පළොල් යනුවෙන්ද හඳුන්වයි.

**ශාකයේ ස්වාභාවය**

කලකට පෙර Stereospermum suaveolens යන උද්භිද නාමයෙන් හඳුන්වා තිබූ පළොල් මීටර් 20 පමණ ඉහලට වර්ධනය වන මධ්‍යම ප්‍රමාණයේ දේශීය ශාකයකි

පත්‍රිකා යුගල 3-4 සහිත අසම පක්ෂවත් සංයුක්ත පත්‍ර සම්මුඛව පිහිටා තිබේ. පත්‍රයක් සෙ.මී. 30-60 පමණ දිගින් යුක්ත. ඉලිප්සාකාර හැඩැති පත්‍රකාවක දිග සෙ.මී 15 සහ පළල සෙ.මී. 7.5 පමණ දිගු විය හැකිය. පත්‍ර සහ ළපටි කොටස්වල සියුම් බූවක් සහිතයි.

පුෂ්ප මංජරියක හට ගන්නා සුවඳවත් මල් රෝස පාටට හුරු දම් පැහැයක් ගනී. ඵලය සෙ.මී 30-60 පමණ දිගු, හීනි කරලකි. පටලමය පියාපත් සහිත බීජයක් සෙ.මී. 3 පමණ දිගින් යුක්ත වේ.

පලොල් Bignoniaceae උද්භිද කුලයට අයත් ශාකයකි. (පළොල් උද්භිද විද්‍යා මූලාශ්‍රවල දේශීය ශාකයක් ලෙස හඳුනාගෙන තිබුන ද ලංකාවේ ජනාවාස ආශ්‍රිතව

මිස ස්වභාවික වනාන්තර තුල හමු නොවන හෙයින් විදේශීය ශාකයක් දැයි උද්භිද විද්යාඥයින් සැල පල කර ඇත)

ලංකාවේදී පළොල් ශාකය සොයා ගැනීමට අපහසු විට එ් වෙනුවට භාවිතා කිරීමට කිරීමට සුදුසුම ශාකය එම උද්භිද ගණයටම අයත් දුනුමඩලා බවයි විද්වතුන්ගේ අදහස.

එය ඉන්දියාවේ පවා පළොල් වෙනුවට භාවිතා කරන ශාකයකි. එහෙත් මෙරට දේශීය සහ ආයුර්වේද වෛද්යවරුන්ද ඇතුළුව වෙදකමට සම්බන්ධ බොහෝ පිරිසක් Fernandoa adenophylla නම් විදේශීය ශාකයක් පළොල් ලෙස භාවිතා කිරීම කණගාටුදායක කරුණකි.

තොටිල ශාකයට පෙනුමෙන් සමාන, කහ පැහැති මල් සහ විශාල කරල් හැදෙන මෙය විසිතුරු ශාකයක් ලෙස මෙරටට හඳුන්වා දෙන්නට ඇතැයි විශ්වාස කෙරේ. එය කිසිදු පිළිගත් මූලාශ්රයක පළොල් වෙනුවට භාවිතා කිරීමට සුදුසු යැයි නිර්දේශ කර නැත.

ආදේශක ලෙස භාවිත කළ හැකි දේශීය ශාක තිබියදී දසමූල අරිෂ්ටය, දසමූල ක්වාතය වැනි ප්රකට ඖෂධවල පවා ප්රමුඛ උපාදානයක් වන පළෙ◌ාල් සඳහා මෙවැනි වැරදි ශාකයක් භාවිතා කිරීම දේශීය වෛද්ය ප්රතිකාරවල ගුණාත්මක භාවය අඩු වීමට ප්රබල ලෙස බලපානු ඇත.

මෙම වැරදි භාවිතය කෙතරම් දුර දිග ගොස් ඇත්දැයි කිවහොත් විහාරස්ථානවල අටවිසි බෝධීන්වහන්සේලා රෝපණය කිරීමේදී පවා මෙම විදේශීය ශාකය යොදා ගෙන තිබෙනු දැක ගත හැකිය.

යොදාගත හැකි රෝග අවස්ථා

- ශුක්ර දුර්වලතා, මධුමේහ, වාත රෝග, ප්රමේහ, කරප්පන්, ඇස් දැවිල්ල, වණ, පිළිකා, ආගන්තුක මූල රෝග, කිලාස, උන්මාද, අම්ලපිත්ත, උදර වේදනා, පිලිස්සුම්. කැස්ස ආදී රෝග සඳහා ප්රතිකාර කිරීමේදී පළොල් ශාකයේ කොල, දලු, පොතු, මුල්, මල්, සුඹුලු ආදිය යොදා නිපදවූ ඖෂධ භාවිතා කරයි.
- පළොල් වේදනාස්ථාපන, ශක්තිජනක, කුසගිනි වඩවන, වණ රෝ◌්පණය කරන, අක්මාව උත්තේජනය කරන, වාජීකරණ, මුත්රකාරක, හෘදයට හිතකර ආදී ගුණයන් රැසක් සහිතයි.

- දසමූල අරිෂ්ටය වැනි දසමූල යෙදෙන ඖෂධ, පාටලී තෛලය ආදිය පළොල් යොදා නිපදවයි.
- අම්ලපිත්ත හෙවත් ගැස්ට්‍රයිටිස් රෝගයට පළොල් පොතු කෂාය බොන්නට දෙයි.
- ශුක්‍ර දුර්වලතාවයට සහ ඉක්කාවට මල් කල්කය සේවනය කළ යුතුය.
- පිළිස්සුම්වලට පලොල් දලු යුෂ ආලේප කරයි.
- මධුමේහයට පළොල් කොළ සුවඳැල් හාල් සමඟ කොටාගත් පිටි තම්බා උදය හවස තෙ දිනක් කෑමට ගත යුතුය.
- උදර වේදනාවට මුල් කෂාය දෙයි.
- තදබල කැස්සට පළොල්මල් යුෂට මී පැණි දමා බීමට දෙයි.
- පළොල් මුල් එළකිරෙන් අඹරා එම කිරෙන්ම දියකොට සීනි දමා දිනපතා බීමට දීම හා උතුරට වැඩුනු මුලක් ගෙන දෙහි ඇඹුලින් අඹරා එළකිරි දමා බීම මව්කිරි වර්ධවන ප්‍රතිකාරයකි.

# ගම්මිරිස්

## *Piper nigrum*

## Piperaceae



**ශාකයේ ස්වාභාවය**

ගම්මිරිස් පර්ව අසලින් ඇතිවන මුල් ආධාරයෙන් ශාකමත වැඩෙන බහු වාර්ෂික වැල් ශාකයකි.

කෙඳි සහිත කඳ අර්ධ කාෂ්ඨීමය ස්වභාවයක් ගනී. කඳ පර්ව අසලදී සන වී ශඛා ඇති කරයි.

සිනිඳු මතුපිටක් සහිත සරල පත්‍ර ඒකාන්තරව පිහිටයි. පත්‍රයක් දිගින් සෙ.මි.8-18 සහ පළලින් සෙ.මි. 3.5-10 දක්වා වැඩේ.

පත්‍ර හැඩය බොහෝ විට අණ්ඩාකාර වන අතර කලාතුරකින් ඉලිප්සාකාර විය හැකිය.

පුෂ්ප මංජරිය සෙ.මි. 12 පමණ දිග පහලට එල්ලෙන ශූකියකි. මෙම පුෂ්ප මංජරිය වගා කිරීම සඳහා වැඩි දියුණු කරන ලද ප්‍රභේදවල සෙ.මි. 20 ක් හෝ ඊට වැඩි විය හැකිය. මල් ඉතා කුඩාය.

ඵලය මි.මි.4 වන ගෝලාකාර බදරියකි. අමු ඵල (ගම්මිරිස් ඇට) කොළ පැහැති වන අතර ඉදෙන විට තැඹිලි පැහැයටත්, පසුව රතු පැහැයටත් හැරේ.

- ඉන්දියාවට දේශීය වන ගම්මිරිස් බොහෝ කලකට පෙර අප රටට හඳුන්වාදී වගාකර ඇත. ලංකාවේ වනාන්තරවල ස්වභාවිකව හමුවන වල් ගම්මිරිස් (Piper sylvestre) නමින් හඳුන්වන දේශීය ගම්මිරිස් විශේෂයක් හමුවන අතර එහි ප්‍රකට ඖෂධීය භාවිතාවන් ගැන තොරතුරු හමු නොවෙයි.
- භාවිතයේදී කළු ගම්මිරිස් සහ සුදු (එළ) ගම්මිරිස් යනුවෙන් වර්ග දෙකක් හමුවෙයි.

- ❖ වැල්වලින් නෙලා ගන්නා ගම්මිරිස් පිට පොත්ත සමඟ වියළා ගැනීමෙන් කළු ගම්මිරිස් සාදා ගනී.
- ❖ නෙලා ගන්නා පැසුණු හෝ ඉදුණු ගම්මිරිස් පිට පොත්ත ඉවත්කර වියළා ගැනීමෙන් සුදු ගම්මිරිස් සාදා ගත හැකිය.
  - ❖ එහිදී ඉදුණු ගම්මිරිස් ජලයෙන් සොදා පොත්ත ඉවත්කර ගැනීමෙනුත්, පැසුණු අමු ගම්මිරිස් ජලයේ ගිල්වා පොත්ත මෙලෙක් වන්නට තබා හෝ යන්ත්‍රානුසාරයෙන් ඉවත්කර ගැනීමෙනුත් සුදු ගම්මිරිස් සාදා ගත හැකිය.
  - ❖ ගම්මිරිස් වර්ග Piperaceae උද්භිද කුලයට අයත් ශාක විශේෂයන් ය.

යොදාගත හැකි රෝග අවස්ථා

- සන්යාස, අපස්මාර, සුදුකබර, කිලාස, පාමා, ආම, ශුක්ල, දත් කැක්කුම, සෙම්ගෙඩි, ග්‍රන්ථිශෝථ, ස්නායු දුර්වලතා, කුසගිනි මදිකම, අජීර්ණ, අක්මා රෝග, අධ්මාන, කෘමි රෝග, ප්‍රතිශ්‍යා, කැස්ස, ඇදුම, පීනස, මුත්‍රඅඩස්සිය, පුරුෂයින්ගේ ලිංගික දුර්වලතාවයන්, රජෝරෝධ, කුෂ්ඨ, අපතානක, ප්‍රවාහිකා, රක්ත අර්ශස්, ප්‍රමේහ, බරවා, අංශභාග, සන්ධි ඉදිමුම්, උදර්ද, ගුල්ම, අරුචි ආදී රෝගාබාධ රැසක් සඳහා ප්‍රතිකාර කිරීමට ගම්මිරිස් ශාකයේ ඇට, මුල් සහ කොළ භාවිතා කරයි.
- ගම්මිරිස් උෂ්ණකාරක, ශ්ලේෂ්මලහර, ස්නායු සහ අක්මාව උත්තේජනය කරන, දීපන, පාචන, දහදියගන්නවන, කුෂ්ඨ නසන, විෂනාශක, ගර්භ ස්‍රාවයන් ජනනය කරන ආදී ගුණයන් රැසක් සහිතයි.

යෝග

- චූර්ණ, වටිකා, ක්වාථ, අරිෂ්ට ආදී ඖෂධ රැසක් නිපදවීමට ගම්මිරිස් යොදා ගනී.
- කැස්සට ගම්මිරිස් චූර්ණය ගිතෙල්, සීනි, මී පැණි සමඟ දෙයි.
- අපතානකයට ඇඹුල් දීකිරිවලට ගම්මිරිස්, වදකහ චූර්ණය ස්වල්පයක් දමා කෑමට ගත යුතුය.
- ප්‍රවාහිකාවට ගම්මිරිස් චූර්ණ උණුවතුරට දමා සාදාගත් පානය ටික ටික පෙවිය යුතුය.
- රසධාතු වර්ධනයට ගම්මිරිස් චූර්ණය දමා කකාළ එළකිරි රාත්‍රියට පානය කළ යුතුය.
- ගම්මිරිස් චූර්ණය කස්තුරි සමඟ බීමෙන් නින්ද ඇති වේ.
- ප්‍රතිශ්‍යාවට හටගත් අවස්ථාවේම ගම්මිරිස් චූර්ණය, උක් හකුරු, දීකිරි සමඟ කෑමෙන් සුවය ලැබෙයි.
- කුෂ්ඨවලට මනොසීල, හිරියල් සහ ගම්මිරිස් යොදා පිළියෙල කළ තෛලය ආලේප කරයි.

- සෙම්ගෙඩිවලට ගම්මිරිස්, ඉඟුරු, සුදුලූණු තලා සාදාගත් කුඩා පොට්ටනියෙන් උගුර තැවිය යුතුය.
- හිසේ ඇතිවන පණු දද කැවිලිවලට  ගම්මිරිස් රතුලූණු සමඟ අඹරා ආලේප කරයි.
- කුසගිනි මදිකමට  ගම්මිරිස් රතුපැහැ වනතුරු බැද, චූර්ණකොට වරකට මදටිය ඇට ප්‍රමණයේ 5-6 දක්වා ගත යුතුය.
- ආහාර දිරවීමට ගම්මිරිස්, ඉඟුරු, තිප්පිලි, කළුදුරු සමව ගෙන සහිඳලුණු සමඟ කොටා තේ හැඳි 1/2-1 දක්වා ප්‍රමාණයක් කෑමට පසු උණුවතුරින් ගත යුතුය.
- සෙංගමාලයට  ගම්මිරිස් සහ පැණිතොර්ර කොළ කොටා හොඳින් වතුර සමඟ මිශ්‍රකර දවසට දෙවරක් බීමට ගත යුතුය.
- උගුර බැරැන්ඩියට සහ දත් කැක්කුමට ගම්මිරිස් චූර්ණය ජලය සමඟ 1:8 අනුපාතයට දියකර කට සේදිය යුතුය.
- මුත්‍ර පිටනොවීමට හා මුත්‍රගල් සඳහා ගම්මිරිස් ඇට චූර්ණය හා පුස්කර කබලේ බැද තුඹිලිවතුරට මිශ්‍රකර පානය කළ යුතුය.
- හිසරදයට ගම්මිරිස් චූර්ණය රොර්ස වතුරෙන් අඹරා නලලේ ආලේප කරයි.
- ගම්මිරිස් බුලත් සමඟ සැපීමෙන් මුඛ දුර්ගන්ධය, මුඛයේ වණ, උගුරේ වණ, විදුරුමස් වේදනාව, උගුර බැරැන්ඩිය ආදිය සුව වෙයි.
- සුදු හෙවත් එළ ගම්මිරිස් යොදා Hubbai Sahfa නමින් බරවා රෝගයට ප්‍රතිඵලදායී ඔසුවක් නිපදවයි. මෙහිදී එළ ගම්මිරිස්, එළකිරිවල දින 3ක් පොඟවා (දිනපතා අලුත් එළකිරි මාරු කරමින්) පසුව ඉඟුරු ඉස්මෙන් අඹරා සාදාගත් ගුලි එක බැගින් දිනකට තුන් වරක් දෙනු ලැබේ.

❖ ගම්මිරිස් වටිනා ඖෂයක් මෙන්ම ලොව පුරා ආහාර පිසීමේදී ඒවාට සැර, සුවඳ සහ රස එකතු කිරීමට යොදන ප්‍රමුඛ පෙලේ පිසුම්කාරක ද්‍රව්‍යයක් ලෙස ඉතා ප්‍රකට ය. එමෙන්ම ගම්මිරිස් අපේ රටට විදේශ විනිමය රැගෙන එන ප්‍රධාන සුළු අපනයන භොගයක්ද වේ.

# ඇට්ටේරියා

## *Murraya paniculata*

## **Rutaceae**



**ශාකයේ ස්වාභාවය**

ඇට්ටෙරියා අලංකාර පඳුරක් ලෙස වැඩෙන කුඩා දේශීය ශාකයකි. දිළිසෙන සුලු කොළ පොඩිකළ විට සුවඳක් නික්මේ.

අතු පහලට එල්ලා වැටෙන ස්වභාවයකි. කඳ අඳුරු සුදු පැහැයක් ගනී.

බහු අක්ෂමය පුෂ්ප මංජරියක හට ගන්නා පෙති පහක් සහිත සුදු පැහැති මල් ඉතා අංකාරවත් වන අතර මිහිරි සුවඳකින් යුක්ත ය. පොකුරක මල් කීපයක් දරයි.

ඇට්ටේරියා මල වයඹ පළාත් පුෂ්පය ලෙස නම් කර ඇත.

- ❖ ඇත් දළ පැහැයක් ගන්නා මෙම ලීය කෘතිම ඇත් දළ සෑදිමට මෙන්ම බස්තම් රුක්කලා ආදිය සඳහාත් බහුලව භාවිතා කරයි.
- ❖ ඇට්ටේරියා අත්ත තෙල් මැතිරීම, ගුරුකම් වැඩ ආදිය සඳහා යොදා ගන්නා අතර තෙල් වර්ග සුවඳවත් කිරීමට මෙම මල් භාවිතා කරයි.
- ❖ ගෙවතු අලංකරණය සඳහා විසිතුරු ශාකයක් ලෙසද වැවිය හැකි ඇට්ටේරියා ශාකය Rutaceae කුලයට අයත් ය.

**යොදාගත හැකි රෝග අවස්ථා**

- ඉදිමුම්, කුෂ්ඨ, සුදුකබර, වමනය, පණු අමාරු, වණ, මුත්‍ර ආබාධ, අජීර්ණය, අතීසාරය, උණ, ඉක්කා, කැඩුම් බිඳුම්, අක්ෂි රෝග, සර්ප විෂ, ආදී රෝග අවස්ථාවන් සඳහා ප්‍රතිකාර කිරීමේදී ඇට්ටේරියා ශාකයේ කොළ, දළු, පොතු, මුල් අැතුළු පංචාගයම යොදා ගනී.
- ඇට්ටෙරියා ගර්භස්‍රාවයන් ජනනය කරන, අරුචිය නසන කුසගිනි වඩවන ගුණ සහිතයි.

යෝග

- දේශීය කැඩුම් බිඳුම් වෙදකමේදී ඇට්ටෙරියා කොළ සහ පොතු අමුවෙන් භාවිතා කරන බව සඳහන් වේ.
- එහිදී වේදනා සමනය කිරීමට මුලේ පොත්ත අඹරා ආලේප කරයි.
- උලුක්කු හග්න ශෝතවලට කොළ, පොතු, අමුකහ ලුණු සමඟ කොටා මැල්ලුම් සකසා භාවිතා කරයි.
- හන්දි ඉදිමුමට ඇට්ටේරියා කොළ සහ යුෂ, එඬරු ඇට, අබ, තල අඹරා පත්තුව ලෙස යොදා ගනී.
- වාත රෝගවලදී වේදනාව නැසීමට ඇට්ටෙරියා පොතු වෙනත් ඖෂධ සමග යොදයි.
- සර්ප විෂට ප්‍රතිකාර කිරීමේදී නශ්‍ය කිරීමට ඇට්ටේරියා දළු යුෂ  යොදා ගනී.
- උළුක්කු, හග්න, ශෝථවලට ඇට්ටෙරියා කොළ පොතු අමුකහ සහ ලුණු සමග කොටා මැල්ලුම් සකසා ලෙස භාවිතා කරයි.
- වාත භංග චූර්ණයේ මෙම කොළ සහ පොතු අංගය.

# බේත් එඬරු

## *Ricinus communis*

## **Euphorbiaceae**



**ශාකයේ ස්වාභාවය**

තෙල් එඬරු සහ බෙහෙත් එඬරු යනුවෙන්ද හඳුන්වන එඬරු මීටර් 3.5 ක් පමණ උසට වැඩෙන වාර්ෂික හෝ බහු වාර්ෂික ශාකයකි.

ඇතැම් විට බෙහෙවින් අතු බෙදෙමින් පඳුරක් අකාරයට වර්ධනය වේ. මැද සිදුරක් සහිත දුර්වල කඳෙහි ළපටි කොටස් අළු පැහැතිය.

දිගු නටුවක් සහිත සරල පත්‍ර ඒකාන්තරව පිහිටයි. ඇඟිලි ආකාරයෙන් බෙදී ඇති පත්‍රයේ දාරය දැති වැනි කඩතොළු සහිතයි.

එ්කාක්ෂ පුෂ්ප මංජරියක හට ගන්නා මල් ළා කහ පැහැතිය. ඵලය තුනට බෙදුනු ස්ඵෝටීකාවකි.

ඵලාවරණයේ කටු වැනි ව්‍යුහ දක්නට ලැබේ. ඵලයක් තුල දිලිසෙන සුලු බීජ තුනක් පිහිටයි.

වෙදකමට සම්බන්ධ මූලාශ්‍රවල තෙල් එඬරු ශාකයේ ප්‍රභේද කිහිපයක් ගැන සඳහන් වේ.

සුලබව හමුවන වර්ගය සුදු එඬරු ලෙසත් එහිම මහ එඬරු සහ හීං එඬරු ලෙස උප ප්‍රභේද දෙකක් ඇති බවත් දක්වා ඇත.

හීං එඬරු ශාකයේ තෙල් හා මුල් ඖෂධ පිණිස ගන්නා බව සඳහන් කර ඇත.

මෙයට අමතරව පත්‍ර, කඳ සහ ගෙඩි රතු පැහැයට හුරු ප්‍රභේදයක් ඇති අතර එය රත් එඬරු යනුවෙන් හඳුන්වයි.

මහ එඬරු සහ රත් එඬරු ශාකවල සියළු කොටස් ඖෂධ පිණිස භාවිතා කරයි. එඬරු ශාක ඇතැම් මූලාශ්‍රවල එරඬු නමින්ද හඳුන්වා ඇත.

තෙල් එඬරු ශාකයට අමතරව Jatropha උද්භිද ගණයට අයත් එඬරු නාමය සහිත ශාක විශේෂ කීපයක්ද මෙරටින් හමුවෙයි.

ඒ අතර මයුරපාද එඬරු (Jatropha multifida), හීං එඬරු (Jatropha gossypiifolia) සහ වැට එඬරු (Jatropha curcas) නම් විශේෂ තුනක් වෙයි.

හීං එඬරු සහ මයුරපාද එඬරු ශාකවල දේශීය භාවිතාවක් ගැන ප්‍රකට තොරතුරු හමු නොවන අතර වැට එඬරු ගැන වෙනම ලිපියක් පල කිරීමට අදහස් කර ඇත.

❖ එඬරු වර්ග Euphorbiaceae උද්භිද කුලයට අයත් ශාක විශේෂයන්ය.

**යොදාගත හැකි රෝග අවස්ථා**

- වාත රෝග, වාතරක්ත, ඉදිමුම්, ගුල්ම රෝග, කැස්ස, ඇදුම, පණු රෝග, අර්ශස්. පාන්ඩු රෝග, කරකැවිල්ල, ආහාර අරුචිය, ආමවාත, කාන්තාවන්ගේ ගර්භාශ සහ ඔසප් රෝග, මුත්‍ර අඩස්සිය, අක්මා සහ ප්ලීහා රෝග, අණ්ඩ වෘද්ධිය, කටිශූල, ගෘධ්‍රසි, කුෂ්ඨ රෝග ආදියට ප්‍රතිකාර කිරීමට තෙල් එඬරු ශාකයේ කොළ, දළු, මුල්, පොතු, ගෙඩි, ඇට සහ ඇටවලින් සිඳ ගන්නා තෙල් භාවිතා කරයි.
- එඬරු වාතය හරණය කරන, ශුක්‍ර ශෝධය කරන, ඉදිමුම් නසන, වේදනා ස්තාපනය කරන, ස්වේද ජනක ආදී ගුණ රැසක් සහිතයි. එඬරු යොදා නිපදවන ඒරණ්ඩ නාමය සහිත තෛල, ක්වාත, ප්‍රලේප ආදී ඖෂධ රැසක්ද ඇත.

**යෝග**

- කාන්තාවන්ගේ මාස් ශුද්ධිය අපහසුවකින් තොරව සිදු වීමට එඬරු කොළ තම්බා යටි බඬේ එලීම සිදු කරයි.

- මව්වරුන්ගේ කිරි තදවීම නිසා පයෝදර ඉදිමුනු විට එඬරු කොළ තලතෙලින් අඹරා රත්කර මඳ උණුසුමෙන් ආලේප කිරීමෙන් හා විනාකිරෙන් අඹරා ආලේප කිරීමෙන් කිරි වැගිරී සුවය ලැබෙයි.

- එමෙන්ම එඬරු කොළ තම්බා ගත් ජලයෙන් හෝ කොළවලින් පයෝදර තැවීමෙන් සුවසේ කිරි එරේ.

- ඇසට හුණු වැටුන විට එඬරු තෙල් බිංදුවක් ඇස තුලට ගැල්වීමෙන් දැවිල්ල පහව ගොස් සුවය ලැබෙයි.

- බඩවැලේ වේදනා ඇති විට එඬරු තෙල් ඉඟුරු යුෂ සමඟ පානය කිරීමෙන් වහා සුවය ලැබේ.

- වාතය අධික වාතරක්තයේදී වේදනාව සමනය කිරීමට එඬරු ඇට මද එලකිරෙන් තම්බා අඹරා ආලේප කරයි.

- රාත්‍රියට ඇස් පෙනීම දුර්වල විට එඬරු දළු ගිතෙලින් මලවා කෑමට ගත යුතුය.

- ස්ථූලතාවයට ළපටි එඬරු මුල් හොඳින් සෝදා පිරිසිදු කර රාත්‍රියෙහි මී පැණිවල ගිල්වා තබා උදෑසන මුල් ඉවත්කර පානය කළ යුතුය.

# මුවකිරිය

*Benincasa hispida*

**Cucurbitaceae**



**ශාකයේ ස්වාභාවය**

සෝමලතා යනුවෙන්ද හඳුන්වා ඇති මුවකිරිය පඳුරක් හෝ අධාරක ශාකයක එතෙමින් ඉහලට වර්ධනය වන කිරි සහිත වැලකි.

මාංසල කොළ පැහැති සිලින්ඩරාකාර කඳේ පත්‍ර නොපිහිටයි. පතනශීලී ශල්ක තිබිය හැකිය.

සුදු හෝ ළා කහ පැහැයට හුරු නිර්වෘත්ත පුෂ්ප කඳේ ගැට අසල තනි තනිව හට ගනී. ඒවා ඇතැම් විට පොකුරක් ආකාරයට දර්ශනය වේ. ඵලය ස්ෆෝයිකාවකි.

- ❖ මුවකිරිය ශාකයේ උප විශේෂ කීපයක් ඇති බව අන්තර්ජාල මූලාශ්‍රවල සඳහන්ව ඇත.
- ❖ ඇතැම්හු හඳුනා ගැනීමේදී මෙම ශාකය සහ නවහන්දි (Rhipsalis baccifera) ශාකය පටලවා ගනු දක්නට ලැබේ.
- ❖ නවහන්දි ගල් පර්වත හෝ විශාල ශාකමත සිට පහලට එල්ලා වටෙන අපි ශාකයක් වන අතර මුවකිරිය පොළවෙහි සිය ඉහලට වර්ධනය වන පඳුරක් හෝ වැලකි.
- ❖ විසිතුරු ශාකයක් ලෙස ගෙවතු අලංකරණයට ද යොදා ගත හැකි වටිනා දේශීය ඖෂධ පැළෑටියක් වන මුවකිරිය Asclepiadaceae උද්භිද කුලයට අයත් ශාක විශේෂයකි.
- ❖ පොළව කණ මැදිරියා මුවකිරිය ලෙසත්, අහස කණ මැදිරියා උඩවැඩියා ලෙසත් පැරණි බෙහෙත් වදුළුවල දක්වා ඇත. ඇතැම් අය අහස කණ මැදිරියා ලෙස මුවකිරිය හඳුන්වයි.

යොදාගත හැකි රෝග අවස්ථා

- මුවකීරිය දේශීය කැඩුම් බිඳුම් වෙදකමේ සහ කල් ගතගවූ අස්ථි ප්‍රදාහ අවස්ථාවන්හි බහුලව යොදා ගන්නා ඖෂධයකි.
- එමෙන්ම ජලභීතිකාව, ශාරීරික දුබලතා, මානසික රෝග, කැස්ස, ඇදුම, ආහාර අරුචිය, අජීර්ණ, හෘද රෝග, අක්මා රෝග, අර්ශස් ආදියට ප්‍රතිකාර කිරීමට මෙම සම්පූර්ණ ශාකයම භාවිතා කරයි.
- මුවකීරිය රසායන, බලකාරක, නිද්‍රාකාරක, වමනකාරක, මෘදු විරෙචක, මුත්‍රකාරක, අහාර දිරවීම ක්‍රමවත් කරන,මව්කිරි වඩවන, පිත ස්‍රාවයවීම උත්තතේජනය කරන, මදනකාරක ආදී ගුණයන් රැසක් සහිතයි.

යෝග

- අස්ථිභග්න හා ප්‍රදාහිත අවස්ථාවන්ට මුවකීරිය සම්පූර්ණ ශාකයම ගෙන අමුකහ, ලුණු දමා කොටා මලවා බඳී.
- වාතරෝග සඳහා මුවකීරිය යොදාගෙන වේදුපෑම සිදුකරයි.
- කැඩුම් බිඳුම් වෙදකමේදී තෙල් වර්ග සහ මැල්ලුම් සෑදීමට මුවකීරිය ශාකය භාවිතා කරයි.
- වාතමෘත්‍ය තෛලය සහ අශීතිවාත තෛලය මුවකීරිය යොදා නිපදවන ඖෂධයන් ය.
- වේද ග්‍රන්තයන්හි සඳහන් ඉතා ප්‍රභල රසායනික ඖෂධයක් වන සෝම පානය සෑදීම සඳහා සෝමලතා නම් පැළෑටියක් භාවිතා කර ඇති බව සඳහන් වේ. සෝමලතා සම්පූර්ණ ශාකයේ සාරයට බාර්ලි සහ එළඟිතෙල් දමා උණුකර සාදා ගන්නා තරලමය ඖෂධය සෝම පානය නම් වේ.

  සෝමලතා පර්යාය මූවකීරිය ශාකයට ද යෙදී තිබුනත් එහිදී භාවිතා කළ සෝමලතා ශාකය, මුවකීරිය ශාකය මීට පෙර අයත්ව තිබූ උද්භිද ගණයටම අයත් Sarcostemma brevistigma නම් ශාකයක් බව දැන ගන්නට ඇත. (මුවකීරිය ශාකයේ පෙර තිබූ උද්භිද නාමය Sarcostemma viminale නම් වේ) එම පැලෑටිය ඉන්දියාවේ දක්නට ලැබුන ද මෙරටදී හමු නොවෙයි. කෙසේ වෙතත් මෙම ශාක දෙකේ ගුණ කර්ම බෙහෙවින් සමාන හෙයින් ප්‍රතිනිධි ලෙස භාවිතා කිරීමේ හැකියාව ඇති බව සඳහන්. ඇතැම් ග්‍රන්ථවල සෝම පැළෑටියේ පර්යාය නාමය මුවකීරිය ශාකයට ද යෙදී ඇති හෙයින් සෝම පානය සෑදීම සඳහා භාවිතා කළේ මූවකීරියම බවට ද මතයක් පවතී.

# මලිත

## *Woodfordia fruticosa*

## **Lythraceae**



**ශාකයේ ස්වාභාවය**

මලිත්ත යනුවෙන්ද හඳුන්වන මලිත මීටර් 1-5 පමණ උසට වැඩෙන කුඩා ශාකයක් හෝ පඳුරකි. සිනිඳු හෝ බූව සහිත ආරුක්කු හැඩැතිව විහිදී යන කඳක් පිහිටයි.

බෙදුණු කුඩා අතු රැසක් දක්නට ලැබේ. පොත්ත තුනී වන අතර පොතු ගැලවී යන ස්වභාවයකි. දිග සෙ.මී. 14 සහ පළල සෙ.මී. 4 දක්වා වැඩෙන සරල පත්‍ර සම්මුඛව පිහිටා තිබේ. පත්‍ර හැඩය අණ්ඩාකාර-ලන්සාකාර හෝ ලන්සාකාර ය. පත්‍ර යටිපස ඝන වෙල්වට් වැනි දෘඪ බූවක් හෝ ඇතැම් ස්ථානවල සිනිඳු බූවක් දක්නට ලැබේ.

පුෂ්ප මංජරියක හට ගන්නා මල් දීප්තිමත් රතු පැහැතිය. ඵලය සෙ.මී. 2 පමණ දිග ස්ඵෝටිකාවකි.

❖ මලිත Lythraceae උද්භිද කුලයට අයත් දේශීය ශාක විශේෂයකි.

**යොදාගත හැකි රෝග අවස්ථා**

- ශරීරදාහ, රක්තස්රාව, කුෂ්ඨ ලාඳුරු වැනි චර්ම රෝග, රක්තකාස, ප්‍රවාහිකා, අතීසාර, මධුමේහ, රක්ත පිත්ත, හිසේ වේදනා, ගුදභ්‍රංශ, අර්ශස්, ඉදිමුම්, ඇදුම, පෙනහලු රෝග, උන්මාද, ස්නායු රෝග, ස්වේත ප්‍රදර, රක්ත ප්‍රදර, රක්ත අර්ශස් ආදී රෝග සඳහා ප්‍රතිකාර කිරීමට මලිත ශාකයේ මල් සහ කොළ භාවිතා කරයි.
- මලිත දාහ සමනය කරන, ශෝධන, සන්ධානීය, ගර්භස්ථාපන, රත්පිත් සමනය කරන, පණුවන් නසන ආදී ගුණ සහිත බව සඳහන්.
- මලිත මල්වල පැසවීමේ ක්‍රියාකාරිත්වයක් ඇති හෙයින් කෂාය, ආසව, අරිෂ්ට ආදී බෙහෙත් ද්‍රව්‍ය නිපදවීමේදී ඒවා කල් තබාගැනීමට මලිත මල් එකතු කරයි.
- මෙම ඖෂධවල මධ්‍යසාර යම් ප්‍රමාණයක් අඩංගු වන්නේ මේ හේතුව නිසා ය.

යෝග

- ධාතක්‍යාදී තෛලය සහ ධාතක්‍යාදී චූර්ණය මලිත යොදා නිපදවන ඖෂධ දෙකකි.
- අතීසාරයට මලිත මල් චූර්ණය මී පැණි සමඟ දෙයි.
- බඩවැල්වල රෝග, පාචනය, අතීසාරය, අභ්‍යන්තර රුධිර වහනය වැනි රෝග ඇති විට මලිත මල් චූර්ණය දීකිරි සමඟ යොදා ප්‍රතිකාර කරයි.
- වණ සහ පිළිකාවන්ට මලිත මල් කුඩු තුවාල මතට ඉසීමත්, මලිත මල් යුෂ ඖෂධීය දියරක් ලෙසත් භාවිතා කරයි.
- ගුදයේ ලේ නහර ඉදිමීම, අක්මා රෝග ආදියට වියළන ලද මලිත මල් වලින් සෑදූ කෂාය යොදා ගනී.
- ශ්වේත ප්‍රදර සහ අධික ඔසප් වීමට මලිත මල් කුඩුකර මී පැණි සමඟ ගැනීමට නියම කර ඇත.
- ගින්නෙන් පිළිස්සුන විට මලිත මල් චූර්ණය තලතෙලින් අනා ආලේප කළ යුතුය.
- මලිත කොළ ස්වරසය නලලේ ආලේප කිරීමෙන් පිත් උණ සහ හිසරුදාව සමනය වෙයි.
- සර්ප විෂට ළපටි මලිත කොළ යුෂ බිංදු කිහිපයක් නස්‍ය කිරීම, මලිත කොළ යුෂ දෂ්ට ස්ථානයේ ආලේප කිරීම කළ යුතුය.
- වණ සේදීමට මලිත මල් තැම්බූ ජලය භාවිතා කරයි.
- ලේ යන අර්ශස් තත්වයක් ඇති විට මලිත මල් තැම්බූ ජලයෙහි මඳ උණුසුමින් වාඩිවී සිටිම ගුණය.

❖ සංස්කෘතෙන් ධාතකී යන්නට ප්‍රම්රබව මලිත භාවිතා කරතත් එ් සඳහා මයිල ද භාවිතා කළ හැකි බව ද, ඇතැම් විට වර්ග දෙකකම එකක් ලෙස සලකා ඇති බව ද පැරණි පොත් පත්වල සඳහන්ව ඇත.

❖ ඇතැම් මතයකට අනුව මලිත සහ මයිල වෙනමම කර්යයන් සඳහා භාවිතා කළ යුතු වර්ග දෙකක් ලෙස සලකා ඇති අතර මලිත වෙනුවට මයිල යොදා ගැනීම සාවද්‍ය භාවිතයක් ලෙස සලකා ඇත.

❖ මෙම බෙදීම නොවිසඳුනු ගැටළුවක් ලෙස වෛද්‍ය ශේස්ත්‍රයේ තවමත් පවතින බව පෙනෙන්නට තිබේ. කෙසේ වෙතත් උද්භිද විද්‍යාත්මකව සැලකූ කළ මලිත සහ මයිල වෙනස්ම උද්භිද කුල දෙකකට අයත් ශාක විශේෂයන් දෙකක් බව කිව යුතුය.

# බෝඹු

## *Symplocos cochinchinensis*

## Symplocaceae




**ශාකයේ ස්වාභාවය**

බෝඹු මීටර් 12 ක් දක්වා උසට වැඩෙන, ඇතැම් විට පඳුරක් ලෙස ද වර්ධනය වන දේශීය ශාක විශේෂයකි.

ඇතැම් අවස්ථාවල නොමේරූ කොටස්වල සියුම් බූවක් දැකගත හැකිය.

පත්‍ර පුළුල් සිට පටු දක්වා වන ඉලිප්සාකාර හැඩයෙන් යුක්ත ය. පත්‍ර දාරය දැති සහිත, තරංගීමය හෝ කඩතොළු සහිත වේ. පත්‍රයක් සෙ.මී 6 සිට 17 දක්වා දිගින් යුක්ත විය හැකිය.

පුෂ්ප මංජරිය බොහෝ විට සංයුක්ත ශූකියකි. එහි හට ගන්නා සුදු පැහැති මල් අලංකාරවත්ය.

කොළ පැහැති ගොලාකාර ඵලය ඉඳුණු විට කළු පැහැයක් ගනී. මෙම විශේෂයේම ප්‍රභේදයක් ලෙස සලකන, ඖෂධ සඳහා භාවිතා කරන තවත් ශාකයක් ඇති අතර එය වල් බෝඹු නමින් හඳුන්වා ඇත.

**යොදාගත හැකි රෝග අවස්ථා**

- ❖ බෝඹු Symplocaceae උද්භිද කුලයට අයත් ශාක විශේෂයකි
- ❖ බෝඹු ආයුර්වේදයේ ප්‍රකට ඖෂධයක් වන "ලෝඹු" නැමැති ශාකයේ සහෝදර විශේෂයක් ලෙස සලකන අතර එය ලෝඹු සඳහා සුදුසුම ප්‍රතිනිධිය ලෙස භාවිතා කළ හැකි බව වෘද්ධ වෛද්‍ය මතයකි.
- ❖ කේරලයේ වෛද්‍යවරු ලෝඹු ලෙස භාවිතා කරනුයේ දේශීය බෝඹු ශාකය බැවින් ඒ අනුව ලාංකේය ව්‍යවහාරයද නිවැරදිය.

- තැළුම්, ගෙඩි වණ, විද්‍රධි, ඇස් රෝග, සන්ධිගත රෝග, කැඩුම් බිඳුම්, අතීසාරය, පේශි දාහය, මස්කුණුවීම ආදී රෝග සඳහා ප්‍රතිකාර කිරීමට ප්‍රධාන වශයෙන් බෝම්බු ශාකයේ කොළ සහ සුඹුලු භාවිතා කරයි.

යෝග

- මස් තැළුනු කල බෝම්බු ශාකයේ සුඹුලු අඹරා උපනාහයක් ලෙස යෙදීමෙන් වේදනාව පහ වේ.
- ඇස් තැළුමට සුඹුලු කොටා පොට්ටනි බැඳ ඇස තැවීම සිදු කරයි.
- සන්ධිගත රෝග සඳහා බෝම්බු කොළ, කොදිඹුලා කොළ, දිය මිදෙල්ල කොළ, කහ ලුණු දමා කොටා එඬරු තෙලෙන් මලවා බඳී.
- වල් බෝම්බු ශාකයේ අමු කොළ, සුඹුලු අඹරා බැඳීම සන්ධිභග්නවලට ප්‍රතිකාරයකි.
- වල් බොම්බු කොළ කෂාය කර පානය කිරීමෙන් මුත්‍ර ගල් පහව යයි.
- මීට පෙර පරම්පරාවේ ගැමියන් සහ බෞද්ධ භික්ෂූන්වහන්සේලා දත් පිරිසිදු කිරීමට දැහැටි කූරු ලෙස භාවිතා කළේ බෝම්බු කොටුය.
- එම පුරුද්ද අද ද ගම්බදව විරලව දැකගත හැකිය.

❖ දේශීය බෝම්බු ශාකය ලෝධ්‍ර ගණයට අයත් බැවින් ලොත් හෙවත් ලෝධ්‍ර පොතු සොයා ගැනීමට නොහැකි අවස්ථාවල ඒ වෙනුවට බෝම්බු පොතු භාවිතා කිරීමට නිර්දේශ කර ඇත.

❖ මෙරට පැරණි දේශීය වෛද්‍යවරුන් ලෝධ්‍ර පොතු වෙනුවට ලුණුවරණ පොතු ද භාවිතා කර ඇති බව පැරණි වට්ටෝරුවලින් පෙනීයන බව සඳහන්.

# සෙනෙහෙ කොළ
*Senna alexandrina*
**Fabaceae**



**ශාකයේ ස්වාභාවය**

සෙනෙහෙකොළ මීටර් 3 ක් පමණ උසට වැඩෙන පඳුරු අාකාර කුඩා බහු වාර්ෂික ශාකයකි.

සම පක්ෂවත් සංයුක්ත පත්‍ර ඒකාන්තරව පිහිටා තිබේ. පත්‍රක් දිගින් සෙ.මී. 5-16 පමණ විය හැකිය. සංයුක්ත පත්‍රයක පත්‍රිකා යුගල් 9 දක්වා පිහිටයි. පත්‍රිකාවක් දිගින් සෙ.මී. 5 දක්වා සහ පළලින් සෙ.මී. 1 දක්වා වර්ධනය වන අතර පත්‍ර හැඩය ඉලිප්සාකාර හෝ අණ්ඩාකාර වේ.

ඒකාක්ෂ පුෂ්ප මංජරිය අග්‍රස්ථීය හෝ කක්ෂීය විය හැකිය. මල් පොකුරක දීප්තිමත් කහ පැහැති මල් 10-30 අතර සංඛාවක් පිහිටයි.

නොපැලෙන කරලක් වන ඵලය තුල පැතලි හැඩැති බීජ 4-10 සංඛාවක් පිහිටා තිබේ.

සෙනෙහෙ කොළ Fabaceae උද්භිද කුලයට අයත් දේශීය ශාක විශේෂයකි.

**යොදාගත හැකි රෝග අවස්ථා**

- වටපණු රෝග, චර්ම රෝග, ළදරුවන්ගේ මලබද්ධය, අර්ශස්, අක්ෂි රෝග, හිස් හොරි ආදියට ප්‍රතිකාර කිරීම සඳහා සෙනෙහෙ ශාකයේ වියළි කොළ සහ කරල් භාවිතා කරයි.

- සෙනෙහෙකොළ ලේඛනීය, විරේචක, පිත සහ රුධිරය පිරිසිදු කරන, අනුලෝමන, වාත අනුලෝමන, පණුවන් බැහැර කරන, සමට හිතකර ආදී ගුණයන් සහිතයි.
- ධාත්‍රී චූර්ණය සෙනෙහෙකොළ යොදා නිපදවන ඖෂධයකි.

යෝග

- වටපණු රෝගයට සෙනෙහෙ ඇට සහ ඇසළ ඇට අඹරාගත් ප්‍රලේපය යොදා ප්‍රතිකාර කරයි.
- චර්ම රෝග සඳහා සෙනෙහෙ කොළ පොල් විනාකිරෙන් අඹරා ආලේප කළ යුතුය.
- ළදරු විරේචනයට සෙනෙහෙ කොළ පාණ්ඨය කිරි දෙන මවට පානය කිරීමට දිය යුතුය.
- රළු කෝෂ්ඨයක් සහිත අයකුගේ මලබද්ධය සඳහා පත්‍ර චූර්ණය හෝ පාණ්ඨය අල්ප මාත්‍රාවෙන් යොදයි.
- තීක්ෂණ විරේකයට අති මාත්‍රාවෙන් පත්‍ර චූර්ණය හෝ පාණ්ඨය යොදා ගනී.
- සුඛ විරේචනයට සෙනෙහෙ කොළ පාණ්ඨය සීනි හෝ සූකිරි සමඟ බොන්නට දෙයි.
- ගැමියන් බඩ විරේක වීමට සෙනෙහෙ කොළ අරළු සමඟ තම්බා පානය කරයි.
- සෙනෙහෙ කොළ තම්බා ගත් වතුරෙන් හිස සේදීමෙන් හිස් හොරි මදර්ධනය වන අතර හිස කෙස් වර්ධනය වේ.
- සෙනෙහෙකොළ අධි මාත්‍රාවෙන් යෙදීමෙන් අන්ත්‍රවල ශ්ලේෂ්මම පටලවලට හානි විය හැකි බැවින් අභ්‍යන්තරව යෙදීමේදී වෛද්‍ය උපදෙස් ඇතිව භාවිතා කළ යුතුය.
- සෙනෙහෙ කොළ භාවිතා කිරීමෙන් පසු ඇතැම් විට උදර වේදනා ඇති විය හැකි බවත්, එහිදී එනසාල්, කොත්තමල්ලි, කරාබු වැනි ඖසුවක් අල්ප මාත්‍රාවෙන් දිය යුතු බවත් සඳහන් කර ඇත.

# දොඹ

## *Calophyllum inophyllum*

## Rutaceae



**ශාකයේ ස්වාභාවය**

දොඹ මීටර් 20 පමණ උසට සහ සෙ.මී. 50 පමණ විශ්කම්භයක් සහිතව වැඩෙන මධ්‍යම ප්‍රමාණයේ සදාහරිත ශාකයකි.

සිනිඳු දිළිසෙන සුලු මතුපිටකින් යුත් තරමක් විශාල සරල පත්‍ර සම්මුඛව පිහිටා තිබේ. පත්‍ර අග්‍රය රවුම් හෝ තීව්‍ර ය. පත්‍ර හැඩය පළල් ඉලිප්සාකාර හෝ ප්‍රත්‍යණ්ඩාකාර-ඉලිප්සාකාර වේ. පත්‍රයක් දිගින් සෙ.මී. 20 සහ පළලින් සෙ.මී.12 ක් දක්වා වැඩේ.

කක්ෂීයව හට ගන්නා පුෂ්ප මංජරිය සංයුක්ත ඒකාක්ෂයකි. එහි හට ගන්නා සෙ.මී. 3 පමණ විශ්කම්භයකින් යුත් සුදු පැහැති මල් අලංකාරවත් ය. එය මී මැස්සන් ප්‍රිය කරන මල් වර්ගයක් ලෙස සැලකේ.

ඵලය කොළ හෝ කහ පැහැති තන්තුමය ගෝලාකාර අෂ්ටිලයකි. එක් ඵලයක් තුල විශාල තනි බීජයක් පිහිටා තිබේ.

❖ දොඹ Clusiaceae උද්භිද කුලයට අයත් දේශීය ශාක විශේෂයකි.

**යොදාගත හැකි රෝග අවස්ථා**

- වණ, කුෂ්ට, අසාධ්‍ය ප්‍රමේහ, කරප්පන්, උදර්ද, කිලාස, වාත රෝග, අක්ෂි රෝග, හිසරුදා, හතිය, පපුවේ සෙම බැඳීම, ආමවාත, සන්ධි වේදනා, කැඩුම් බිඳුම්, අතීසාර, ප්‍රවාහිකා, මලබද්ධය, මුත්‍ර අඩස්සිය, රක්ත අර්ශස් ආදී රෝග

සඳහා ප්‍රතිකාර කිරීමට දොඹ ශාකයේ කොළ, පොතු, මුල්, මල්, ඇට, මද, තෙල් සහ මැලියම් භාවිතා කරයි.

- දොඹ මලභේදක, මුත්‍රකාරක, රෝචක, අධිමානහර, ධාතු ඌෂ්ණහර, වණරෝපන, කෘමිනාශක, පෙනහැල්ලට හිතකර ආදී ගුණයන් සහිතයි.

යෝග

- අභිෂ්‍යන්ද්‍ය නම් අක්ෂි රෝගයට පිරිසිදු කරගත් දොඹ කොළ තම්බා ඇස් සේදීම සහ මල් ජලයෙහි බහා තබා ඇස් සේදීම සිදු කරයි.

- සන්ධිවල වාත වේදනාවන්ට සහ ඉදිමුම් ආදියට ඇට අඹරා ආලේප කරයි.

- දොඹ තෙල් ආලේප කිරීමත්, මුල් තම්බා සේදීමත් වණ සඳහා ප්‍රතිකාරයන් ය.

- අතීසාර, ප්‍රවාහිකා සහ රක්ත අර්ශස් යන රෝග සඳහා ප්‍රතිකාර කිරීමට පොතු කසාය යොදා ගනී.

- දොඹ දලු තම්බා ඇස් සේදීමෙන් අපද්‍රව්‍ය ඉවත්වී ඇස පිරිසිදු වේ.

- දියමැටියන් කෑමෙන් කකුල්වල ඇඟිලි අතර වණ වූ විට දොඹ ඇට පුලුස්සා පොල්තෙල් සමඟ අනා ආලේප කළ යුතුය.

- එය වියගසට ගවයින්ගේ කර තුවාල වූ විට ද යොදන ප්‍රතිකාරයකි.

- ඇසෙහි කුඩා යමක් ඇණුන විට දොඹ දලු, බෝඹු දලු, පඹ දලු තම්බා ඇස සේදීමෙන් ඇණුන දේ ඉවත්ව යයි.

- පැරැන්නන් වාත වේදනා සමනය කර ගැනීම සඳහා දොඹ තෙල් ආලේප කර ඇත.

දොඹ ඇට මඳ කොටා, පැසෙහි බහා මිරිකා දොඹ තෙල් ලබා ගනී. දොඹ තෙල් දැව ආරක්ෂකයක් ලෙස ද භාවිතා කළ හැකිය. දොඹ දැව වටිනාකම අතින් ද ඉහල අගයක් ගන්නා ශාකයකි. නිවාස, නැව්, බෝට්ටු, කරත්ත තට්ටු, සිල්පර කොට, දුම්රිය මැදිරි, කරත්තවල ප්‍රධාන කඳ (බෝන් ලීය), නැව්වල කුඹගස, ආයුධවල මිටි ආදිය සෑදීමට දොඹ ලී යොදා ගනී. දොඹ තෙල් සිඳීමෙන් පසු ඉතිරිවන මුරුවට හොඳ කාබනික පොහොරක් ලෙස භාවිතා කළ හැකි ය.

# කහට

## *Careya arborea*

## **Lecythidaceaeceae**




**ශාකයේ ස්වාභාවය**

කහට, මීටර් 20 ක් දක්වා වර්ධනය වන, නියඟයට හොඳින් ඔරොත්තු දෙන මධ්‍යම ප්‍රමාණයේ ශාකයකි.

රළු, ඉතා සණකම් පොත්ත අළු දුඹුරු පැහැතිය. තරමක් විශාල සරල පත්‍රයක් සෙ.මී 30 දක්වා වර්ධනය වේ. අඳුරු කොළ පැහැති පත්‍ර තලය දිළිසන සුලු ය.

පොකුරු වශයෙන් හට ගන්නා විශාල මල් අලංකාරවත් ය. මල් පිපෙන කාලයේදී කොළ මුලුමනින්ම පාහේ හැලී යයි.

ගැමියන් මල් පිපෙන අවස්ථාවේ පවතින ළපටි කහට ඵලය රසවත් ව්‍යංජනයක් සහ මැල්ලුමක් ලෙස සකසා ආහාරයට ගනී.

ගෝලාකාර පරිනත ඵලය සෙ.මී. 8 පමණ විශ්කම්භයකින් යුක්ත ය. එය වල් ඌරන් වැනි වන සතුන්ට ආහාරකි.

- කහට ශාකය Lecythidaceae කුලයට අයත්ය.

**යොදාගත හැකි රෝග අවස්ථා**

- මුඛ රෝග, ප්‍රතිශ්‍යා, වණ, ශ්වේත ප්‍රදර, රක්ත ප්‍රදර, සර්ප විෂ, ලේ වහනය නැවැත්වීමට, ප්‍රමේහ ආදී රෝග අවස්ථා සඳහා ප්‍රතිකාර කිරීමේදී ප්‍රධාන වශයෙන් කහට පොතුද අමතරව දළු, මල්, ගෙඩි ආදිය භාවිතා කරයි.
- වගපුල් යන්න ප්‍රකටව යෙදෙනුනේ තිප්පිලි සඳහා වුවත් මෙරට ඇතැම් වෙද පරම්පරාවල් වගපුල් ලෙස කහට ගෙඩි භාවිතා කරයි.

- යටිපතුල් තුවාල වූ විට කහට පොතු තම්බා බැඳීම, මුඛ රොගවලදී කහට පොතු තැම්බූ වතුරින් කට සේදීම, වණ සේදීමට සහ මස ලියලවීමට කහට පොතු හෝ දළු තැම්බූ වතුරින් සේදීම, බාහිර ලේ වහනය නැවත්වීමට කහට දළු අඹරා තුවාලය මත ඇතිරීම, සර්ප විෂට කහට පොතු චූර්ණය දීම ආදිය සරල ප්‍රතිකාරයන්ය.
- බිබිලි මතුවන උණට කහට පොතු කෂාය ගුණදායකය.
- දරු ප්‍රසූතියෙන් පසු මව නාවන වතුරට කහට කොළ එක් කිරීමට පැරැන්නන් පුරුදුව උන්හ. එමෙන්ම මවක් දරුවන් ලැබූ අලුත කහට පොතු තැම්බූ වතුරින් යෝනී ප්‍රදේශය සේදීම සිදු කරයි.
- එමගින් දරුවන් ලැබීමේදී ඇතිවූ තුවාල ආදීය සුවවී අපහසුතාවයන් මඟ හැරී යයි. ගැමියන් එවැනි මව්වරුන්ට කහට මල් යොදා සාදා ගන්නා ශක්තිජනක පානයක් ද පිළියෙල කර දෙයි.
- කාන්තාවන්ට වැලඳෙන ස්වේත ප්‍රදර සහ රක්ත ප්‍රදර රෝග අවස්ථාවන් හිදී කහට පොතු චූර්ණය මදටිය ඇට 6-12 අතර ප්‍රමාණයක් ගිතෙල් මී පැණි සමඟ දීමෙන් ගුණ වේ.

යෝග

- හරකුන්ගේ කුර රෝග, ගෙඩි ආදිය සුව කිරීමට ගැමියෝ කහට පොතු යොදා ගනිති.
- අතීතයේදී කහට පොතු තම්බාගත් ජලය වර්ණකාරයක් ලෙස භාවිතා කර ඇත.
- රෙදි, පැදුරු, පාපිසි වැනි දෑ මෙමඟින් වර්ණ ගන්වා ඇත.
- අද ද ආරණ්‍ය සම්ප්‍රදායේ භික්ෂුන්වහන්සේලා සිවුරු පඬු පෙවීමේදී කහට පොතු තැම්බූ වතුර භාවිතා කරයි.
- කහට ලීයේ අරටුව නොදිරා කලක් පවතින නිසා කරත්ත රෝදවල වක් අතු සෑදීමට ද, සිල්පර කොට සඳහා ද, තුවක්කු මිටි සෑදීම සඳහා ද භාවිතා කරයි.

# අංකෙන්ද

## *Acronychia pedunculata*

## Rutaceae




**ශාකයේ ස්වාභාවය**

අංකෙන්ද සිනිඳු පොත්තක් සහිත මධ්‍යම ප්‍රමාණයේ ශාකයකි. ළපටි ශාඛා සිනිඳු හෝ මඳ බූවක් සහිත ය.

සරල පත්‍ර දිළිසෙන සුලුය. පත්‍ර තලය ඉලිප්සාකාර සිට උප ආයත හෝ උප ආයත අණ්ඩාකාර වේ. අංකෙන්ද කොළ අඹ කොළවලට තරමක් සමාන සුවඳකින් යුක්ත ය.

පුෂ්ප මංජරියක හට ගන්නා මල් කොළ පැහැයට හුරු සුදු පාටකි. මල් හට ගැනීම පෙබරවාරි සිට අප්‍රේල් දක්වා ලෙස සඳහන්ව තිබුන ද, මහනුවර ප්‍රදේශයේ මැයි ජූනි මාසවල ද මල් දැකගත හැකි විය.

කහ පැහැයට හුරු ක්‍රීම් පැහැයකින් යුතු ඵලය නෙපෙැලෙන ගෝලාකාර අෂ්ටිලයකි.

❖ අංකෙන්ද Rutaceae කුලයට අයත් ශාකයකි.

**යොදාගත හැකි රෝග අවස්ථා**

- කැඩුම් බිඳුම්, උපතින් ඇතිවන අස්ථි ආබාධ, ඉදිමුම්, ආමවාතය නිසා ඇති වන සන්දි ඉදිමුම්, තැලීම්, ළදරු රත රෝගය (රත ගාය) ආදී රෝග අවස්ථා සඳහා ප්‍රතිකාර කිරීමේදී අංකෙන්ද කොළ, පොතු, මුල් ආදිය යොදා ගනී.
- ආමවාතය (ආතරයිටිස්) නිසා ඇතිවන ඉදුමුම් සඳහා අංකෙන්ද කොළ පොතු භාවිතාකර සාදාගත් පත්තුව ආලේප කරයි.

යෝග

- දරුණු තැලීම් ආදිය සිදුවූ විට අංකෙන්ද කැඳ පානය නිර්දේශ කර ඇත.
- අංකෙන්ද ඉදිමුම් නසන, රුධිරය පිරිසිදු කරන, වණ රොපණය කරන ආදී ගුණ සහිතයි.

❖ කිතුල් කර්මාන්තයෙදී තෙලිජ්ජ පැසී රා බවට පත්වීම වැලැක්වීමට කොළ ද, පැණි උකු බවට පත්ව වඩාත් ඉක්මනින් ඝන වී වැලි හකුරු බවට පත්වීමට අංකෙන්ද පොතු ද යොදා ගැනේ.

❖ ගවයින්ට වැලදෙන ගෙඩි, තුවාල, ඉදිමුම් චර්ම රෝග හා කුර ලෙඩ ආදියේ දී කොහොඹ තෙල් හා දෙල් කිරි ආදිය සමඟ අංකෙන්ද ගසේ කොටස් තලා මිරිකා ගත් යුෂ ඔසු වශයෙන් භාවිතා කරන බව සඳහන් වේ.

# නියඟලා

## *Gloriosa superba*

## **Rutaceae**




**ශාකයේ ස්වාභාවය**

ලියනඟලා යනුවෙන්ද සිංහලෙන් හඳුන්වනු ලබන නියඟලා ශාකය පොළවෙහි හෝ අධාරක ශාකයක් මත මීටර් 4 - 5 පමණ වර්ධනය වන බහුවාර්ෂික වැලකි.

පැහැදිළි නටුවක් රහිත, කෙලවර තීව්‍ර වන පත්‍රයක් සෙ.මී 15 පමණ දිගට වර්ධනය වන අතර පළල සෙ.මී 5 පමණ වේ.

ඇතැම් පත්‍රවල කෙලවර පහුරක් ආකාරයට නිර්මාණයවී තිබීම විශේෂත්වයකි. එය ආධාරකයකට සම්බන්ධ වීමට උපකාර වෙයි.

නියගලා වැලෙහි හට ගන්නා රතු කහ තැඹිලි මිශ්‍ර පැහැයන්ගෙන් යුක්ත මල් ඉතා අලංකාරවත් ය. මල් මේරීමත් සමඟ රතු වර්ණට හැරෙයි.

නියඟලා අල දවල්ට විෂ සහිත බවටත්, මල් රැට විෂ සහිත බවටත් ජනප්‍රවාදයෙහි පැවති මතය මෑතකාලයේදී පර්යේෂණාත්මකව තහවුරු කරන ලද බව දැන ගන්නට ඇත.

- මලෙහි වචිත්‍රත්වය සහ අලවල පවතින විෂ සහිත බව නිසා වඩාත් කතාබහට ලක්වන නියඟලා ශාකය Colchicaceae කුලයට අයත් ය.

- උද්භිද විද්‍යාත්මකව නියඟලා ද්වීලිංගික ශාකයක් වුවත් අලයෙහි ස්වරූපය අනුව වෙදකමේදී ස්ත්‍රී සහ පුරුෂ ලෙස වර්ග කිරීමකට ලක් කර ඇත.

❖ ස්ත්‍රී අලය වටකුරු හැඩයෙන් යුක්ත බවත් පිරිමි අලය නඟුලක් වැනි (L) හැඩයකින් යුක්ත බවත් පොතපතෙහි සඳහන් වේ.

**යොදාගත හැකි රෝග අවස්ථා**

- ලාදුරු, උපදංශ, කල්ගිය වණ තුවාල, උදුගොව්වා කැම නම් චර්ම රෝගය, සර්ප විෂ ගංඩමාල, ඉදිමුන්, අර්ශස්, ගෝනුසු විෂ ආදි රෝග අවස්ථාන්හිදී බාහිර වශයෙන් යොදනු ලබයි.
- නියඟලා අල විෂ සහිත බැවින් විෂ මරා ඖෂධ සඳහා භාවිතා කළ යුතුය. ඒ සඳහා හොඳින් සෝදා පෙති කපා ගත් අල ගව මුත්‍රයේ පැය 24 බහා තබා ඉන්පසු උණුවතුරෙන් සොදා වියළා ගත යුතු ය.
- දරුන් බිහිවීම හෝ වැදෑමස වැටීම ප්‍රමාදවී වේදනා ගෙනදෙන අවස්ථාවන්හිදී නියඟලා අල අඹරා දෙපතුලෙහි හෝ යටිඩෙහි ගැව්ට වහා ප්‍රසූතිය හා වැදෑමස වැටීම සිදු වේ.
- නියඟලා පාචන ව්‍යුහය, රක්ත සංවහන ව්‍යුහය, ශ්වසන ව්‍යුහය, ප්‍රජනන ව්‍යුහය ආදීයේදී වඩාත් ක්‍රියාකාරී බව සඳහන් වේ.

**යෝග**

- සිරුරේ ඇනුන කටුවක් වැනි යමක් ඉවත් කිරිමේදි අල ගලගා යෙදිමෙන් එය ඉවතට ඇදී එයි.
- උදුගොව්වන් කැම නම් චර්ම රෝගයේදී නියඟලා අලයක් දෙහි ඇඹුලින් ගලගා අදාල ස්ථානයේ ආලේප කරයි.
- කිසිවෙකුට අනර්ථයක් කිරීමේ අදහසින් හෝ වශී කර ගැනීමේ අදහසින් කැමට සැලැස්වූ යමක් විෂවූ විට, එම විෂ ඉවත් කිරීමට ආතුරයාගේ උසට සරිලන නියඟලා වැලක් ගෙන යාතුකර්මයක් සිදු කරයි.
- නියඟලා මාත්‍රනුකූලව වෙනත් ඔසු සමග යෙදීමෙන් ඉතා විශිෂ්ඨ ගුණ ලැබෙන හෙයින් දිගු කලක් ජීවත්වීමේ හැකියාව, කාර්යක්ෂමතාව, ශරිර ශක්තිය හා ආහාර දිරවීමේ හැකියාවද වැඩි දියුණු වන බව සඳහන්.
- අධි මාත්‍රව දිවි තොර කරන හෙයින් මාත්‍රව දැන අභ්‍යන්තර රෝගයනට යෙදිය යුතු ය.
- නියඟලා අනවශ්‍ය ලෙස ශරීගත වීමෙන් බඩේ කැක්කුම හා විවිධ අපහසුතාවයන්ට ගොදුරු විමටත්, මරණය පවා සිදුවීමටත් ඉඩ තිබේ. එවැනි අවස්ථාවලදි වැල් පෙනල කොළ යුෂට උළුහාල් හා සුදු හඳුන් දමා උණුකර පෙරා ගිතෙල් සමග දිම හොඳය. එමෙන්ම පොල් කිරිවලට කළුදුරු කුඩු හා දෙහි ඇඹුල් දමා රත්කර දීමත් ඒ සඳහා ප්‍රතිකාරයකි.

# තිරස්තවාලු

## *Operculina turpethum*

## **Convolvulaceae**




**ශාකයේ ස්වාභාවය**

මෙම වැලේ කඳ දාර තුනකින් යුත් තුන්හුලස් රූපාකාරයකින් යුත් නිසා තිරස්තවාලු යන නම යෙදී ඇත.

සංස්කෘතෙයෙන් ත්‍රිවෘත් යනුවෙන් ද සිංහලෙන් තිරුස්සවාලු සහ තිරස්සවාලු යනුවෙන්ද හඳුන්වන මෙය නිබාතීය හෝ කෝණික හැඩයෙන් යුත් බහු වාර්ෂික වැල් ශාකයකි.

වැලේ බොහෝ කොටස් අකාෂ්ඨීය වන අතර මඳ වශයෙන් රො◌්මීය වේ. ඒකාන්තරව පිහිටන පත්‍ර වක්‍රාකාර, අති අණ්ඩාකාර, ලන්සාකාර ආදී විවිධ හැඩයන් ගනී. සෙ.මී. 5-15 පමණ දිගුවන පත්‍රයක පත්‍ර දාරය සම්පූර්ණ හෝ දන්තුර සිට මඳ වශයෙන් බෙදුණු ස්වරූපයක් දක්වා වෙනස් විය හැකිය. පත්‍ර උඩු පෘෂ්ඨය සිනිඳු රොමීය වන අතර යටි පෘෂ්ඨය බූව සහිත වේ.

බහු අක්ෂ පුෂ්ප මංජරියෙහි මල් එකක් හෝ කීපයක් හටගනී. විශාල මණිපත්‍ර සහිත සුදු පැහැති මල් හැඩයෙන් ඝණ්ටාකාර සිට පුනීලාකාර දක්වා වේ.

ඵලය පැතලි ගොලාකාර ස්ඵෝටිකාවකි. බීජ තද කහ පැහැතිය.

- ❖ තිරස්තවාලු Connvolvulaceae උද්භිද කුලයට අයත් ශාක විශේෂයකි.

යොදාගත හැකි රෝග අවස්ථා

- කඵපිත්ත රෝග. අධිමාන, අර්ශස්, කෘමි අපහණය, සෙංගමාලය, උදර රෝග, ආමවාත, වාතරක්ත, උදාවර්තවාත, තිව්‍ර මලබද්ධයධ සහිත උණ, කල්ගිය මලබද්ධය, බරවා, පිත්ත පාණ්ඩුව, විසර්ප, ගුල්ම, සර්ප විෂ, අක්ෂි රෝග ආදියට ප්‍රතිකාර කිරීමේදී තිරස්තවාලු ශාකයේ මුලේ පොතු, දඬු , කොළ ආදිය භාවිතා කරයි.
- තිරස්තවාලු පිත සමනය කරන, කඵ නසන, වාතය වඩන, රේචන, ශෝතහර ආදී ගුණ සහිතයි.
- ත්‍රිවෘත් චූර්ණය, මණිභද්‍ර මෝදකය තිරස්තවාලු අඩංගු නිශ්පාදිත ඖෂධ වේ.

යෝග

- කාමලාවට ත්‍රිවෘත් චූර්ණය, ගෝක්ෂුර චූර්ණය සමඟ යොදයි.
- අර්ශස්වලදී ත්‍රිඵලා කෂාය සමඟ භාවිතා කරයි.
- උණට තිරස්තවාලු චූර්ණය සීනි මී පැණි සමඟ දෙයි.
- බරවා සහ වාතරක්තවලදී ත්‍රිවෘත් ත්‍රිපල් සහ ඉඟුරුපියලි චූර්ණය යොදා ප්‍රතිකාර කරයි.
- පිත්තෝදරයට එළකිරි සමඟ ත්‍රිවෘත් චූර්ණය ද පිත්ත පාණ්ඩුවට සීනි සමඟ ද භාවිතා කරයි.
- ඇස් රෝගවලදී තිරස්තවාලු මී පැණි සමඟ බාහිරින් ආලේප කරයි.

❖ තිරස්තවාලු මුල් ගලවාගත යුත්තේ චන්ද්‍රයා පුර පක්ෂයේ පවතින කාලවලදී බව පැරණි පොතපතෙහි සඳහන් වේ.
❖ මෙම මුල් සේදීමෙන් ගුණ හානිවන බව පැරණි වෛද්‍යවරු දැනසිටි නිසා ඔවුන් මෙම මුල් ගලවා රෙදිවලින් පිසදමා මැද නාරටිය ඉවත් කර හොඳින් වියළා භාජනවල බහා තබා ගනිමින් ප්‍රයෝජනයට ගත්හ. තිරස්තවාලු මුල් චූර්ණය සෑදීමේදී මුලෙහි මැද නාරටිය ඉවත් කොට කැබලි කර කිරෙහි බහා තම්බා වියළා ලත යුතුය.
❖ අළුත් අවස්ථාවේ භාවිතා කිරීම වඩාත් ප්‍රතිඵලදායක බව සඳහන්.

# කොබෝලීල

*Bauhinia sp.*

**Fabaceae**



**ශාකයේ ස්වාභාවය**

බෞද්ධ සූත්‍ර පිටකයෙහි ඇතැම් අවස්ථාවල පරසතු යනුවෙන් හඳුන්වා ඇත්තේ ද කොබෝලීල ශාකය යි. "ඔබ රමණීය සිත්කලු පරසතු නම්වූ කොබොලීල මල් රැගෙන ගී ගයමින් දිව මල්දම් ගොතමින් සතුටු වෙහි." යනුවෙන් ඛුද්දක නිකායට අයත් විමාණ වස්තුවෙහි සඳහන් වේ.

ගිනිකොන දිග ආසියාව නිජබිම ලෙස සැලකෙන කොබෝලීල ශාක ඉන්දියාවට දේශීය වන අතර ඇතැම් විශේෂ මෙරටට හඳුන්වාදී වගා කර ඇත.

මෙලෙස මෙරට වගාකර ඇති Bauhinia විශේෂ රැසක් ඇතත් වෙදකමට සම්බන්ධ මූලාශ්‍රවල දැක්වෙන්නේ ඉහත සඳහන් වර්ග ගැන පමණි.

සිනිඳු දුඹුරු පැහැති පොත්තක් සහිත මධ්‍යම ප්‍රමාණයේ ශාකයක් වන මෙහි සරල ඒකාන්තර පත්‍ර හෘදයාකාර හැඩයකින් යුක්ත ය. පත්‍රයේ කොටසක් ඛන්ඩිකා දෙකකට බෙදී පවතී.

පුෂ්ප මංජරියක ගට ගන්නා විශාල අලංකාරවත් මල් සුවඳවත් ය. සුදු, දම් හා ළා රතු පැහැති මල් හට ගනී.

මෙම උද්භිද ගණයට අයත් දේශීය ශාක විශේෂ දෙකක් ඇති අතර ඉන් එක් වර්ගයක් කහ පැහැති මල් හට ගන්නා කහ කොබෝලීල හෙවත් කහ පෙතන් (Bauhinia tomentosa) ය. අනෙක් දේශීය ශාකය මයිල (Bauhinia racemosa) වන අතර ඇතැම් අවස්ථාවල මයිල ශාකය ද සුදු කොබෝලීල ලෙස හඳුන්වා ඇතත් එහි ඖෂධීය භාවිතාවන් ගැන පොතපතෙහි වෙනමම සඳහන් කර ඇත.

එකම ගණයේ ශාක විශේෂ වුවද මයිල මල් අනෙක් Bauhinia විශේෂවලට සාපෙක්ෂව බෙහෙවින් කුඩාය.

පෙබරවාරි සිට අප්රේල් කාලයේ කොබෝලීල ශාකවල මල් හට ගනී. ඵලය පැලෙන සුළු කරලකි. කරලක් තුල බීජ 6-15 පිහිටා තිබිය හැකි ය.

❖ ගෙවතු සහ උද්යාන අලංකරණය සඳහා ද මාර්ග දෙපස සෙවන සඳහා ද වැවිය හැකි කොබෝලීල ශාක Fabaceae කුලයට අයත්ය.

යොදාගත හැකි රෝග අවස්ථා

- වණ සේදීමට, වණ රෝපණයට, අතීසාර, ප්රවාහිකා, ගුද භ්රංශ, රක්තඅර්ශස්, රක්ත පිත්ත, ඇදුම, ක්ෂය රෝගය, රකත ප්රදර, පණ්ඩු රෝග, ගණ්ඩමාල රෝගය, කුෂ්ට, මලබද්ධය ආදී රෝගාබාධ බොහෝමයක් සඳහා ප්රතිකාර කිරීමට කොබෝලීල ශාකයේ පොතු, කොළ, මුල්, මල් ඇතුළු පංචාංගයම භාවිතා කරයි.
- පොදුවේ ගත්කල කොබෝලීල වර්ග සියල්ලම ගුණයෙන් සමාන ලෙස සලකා ඇතත් රතු කොබෝලී ගලගණ්ඩ රෝගයට විශේෂයෙන් ගුණදායක බව සඳහන් කර ඇත.

යෝග

- වණ සේදීමට කොබෝලීල පොතු තැම්බූ ජලය භාවිතා කරයි.
- අර්ශස් රෝගයට ඉතා සියුමව සකසා ගත් මෙම මුල් චූර්ණය මෝරු සමග දෙයි.
- ගණ්ඩමාල රෝගයට ප්රතිකාර ලෙස කොබෝලීල පොතු චූර්ණය හෝ කෂාය බීමට දීම සහ පොතු අඹරා ආලේප කරයි.
- මෙම පොතු තම්බා එම වතුරින් කට සේදීම මුඛ රෝග සඳහා ප්රතිකාරයකි.
- කොබෝලීල මල් සීනි සමඟ ලිප තබා පැසවූ මිශ්රණය මල බද්ධයට ඉතා හොඳ මෘදු විරේකයකි.
- සර්ප විෂට ප්රතිකාරයක් ලෙස කොබෝලීල පංචාංගය පොල් විනාකිරි සමඟ කෑ මුඛයේ ගෑම සිදු කරයි.

# මස්බැද්ද
## *Gymnema sylvestre*
## Apocynaceae

ති



**ශාකයේ ස්වාභාවය**

ප්‍රාදේශීයව මස්බැද්ද යනුවෙන් හඳුන්වනු ලබන ශාක විශේෂ කීපයක් ඇතත් Gymnema sylvestre ශාකය ප්‍රධාන වශයෙන් මස්බැද්ද ලෙස සලකා ඔසු පිණිස භාවිතා කරයි.

මෙය ආධාරක ශාකයක් මත වැඩෙන කාෂ්ඨීය වැලකි. පත්‍ර ඇතුළුව වැලෙහි බොහෝ කොටස් ද, විශේෂයෙන් ළපටි ශාඛා ද බූව සහිතය. සරල ඒකාන්තර පත්‍ර පුළුල් ලෙස අණ්ඩාකාර සිට අණ්ඩාකාර ලන්සාකාර වේ.

පුෂ්ප මංජරිය ඡත්‍රයක් වැනි බහු අක්ෂයකි. මල් ළා කහ පැහැතිය. බූමණියක් සහිත බීජ සුළඟ මඟින් ව්‍යයාප්ත වේ.

දේශීය වෛද්‍යවරු හීන් මස්බැද්ද සහ මහ මස්බැද්ද යනුවෙන් ප්‍රභේද දෙකක් හඳුනාගෙන ඇත. හීං මස්බැද්ද කොළ තරමක් අඳුරු පැහැති වන අතර කොළ සාපේක්ෂව කුඩාය.

❖ මස්බැද්ද Apocynaceae කුලයට අයත් ශාකයකි.

**යොදාගත හැකි රෝග අවස්ථා**

- මෑතකාලීනව දියවැඩියාව සඳහා ප්‍රත්‍යයක්ෂ ඖෂධයක් ලෙස මස්බැද්ද ශාකය වඩාත් කතාබහට ලක්විය.
- දියවැඩියාවට එරෙහි ගුණයන් ඇත්තේ මස්බැද්ද කොළවල බවත් ශාකයේ අනෙක් කොටස්වල එවැනි ගුණයක් නැති බවත් පර්යේෂණ මගින් තහවුරු කර ඇති බව සඳහන් වේ.

- දියවැඩියාවට අමතරව විශේෂයෙන් මුත්‍ර සමඟ සීනි පිටවීම, ග්‍රන්ථි ඉදිමුම්, අක්මා රෝග, ප්ලීහා රෝග, මුත්‍ර රෝග, ප්‍රතිශ්‍යා, ඇදුම, ක්ෂය රෝගය, හෘද දුර්වලතා, ආදියට ප්‍රතිකාර කිරීමේදී මස්බැද්ද ශාකයේ කොළ, මුල්, ඇට ආදිය භාවිතා කරයි.

යෝග

- දියවැඩියාවට සහ මුත්‍ර සමඟ සීනි පිටවීමට (මධුමේහයට) මස්බැද්ද පත්‍ර චූර්ණය යොදයි.
- මස්බැද්ද බීජ චූර්ණය ප්‍රතිශ්‍යා සහ ක්ෂය රෝගයට ප්‍රතිකාරයකි.
- ඇදුම රෝගය සඳහා වියළාගත් මුලේ පොතු පිලිස්සූ දුම ආග්‍රහණය කිරීම සහ උණුට කොළ කෂාය දීම සිදු කරයි.
- මුලේ පොතු අක්ෂි රෝග සඳහා ද භාවිතා කරයි.
- එමෙන්ම ගෙඩි ඉහිරීමට මස්බැද්ද කොළ පොතු, ගඳපාන කොළ, කහ, ලූණු දමා කොටා මලවා බැඳීම සහ ලූණුවරණ කොළ පොතු සහ මස්බැද්ද කොළ පොතු කහ, ලූණු දමා කොටා මලවා බැඳීම ආදී ප්‍රතිකාර රැසක්ද අත් වෙද පොත්වල සඳහන් කර ඇත.

- ❖ මස්බැද්ද කොළ සැපීමෙන් දිවෙහි රසඥතාවය යම් කාලයකට වෙනස්වී යාම මෙම ශාකය ගැන දන්නා අයගේ අත්දැකීමකි.
- ❖ වඳ බව නැති කරන ඖෂධ යෝග කිහිපයකට මස්බැද්ද භාවිතාකරන බව දේශීය වෛද්‍යවරු ප්‍රකාශ කරති.
- ❖ වැරදීමකින් බුලත් විට කන හුණු කැවුණහොත් මස්බැද්ද කොළ කිහිපයක් හපා එම යුෂ ගිලීමෙන් හුණු සම්පූර්ණයෙන් විෂ ඉවත් වන බව කියැවේ.
- ❖ Gymnema sylvestre ශාකයේ ශක්තිමත් කාෂ්ඨීය වැල දඩයක්කරුවන් මස් බැඳගෙන යාම සඳහා භාවිතා කළ නිසා මස්බැද්ද ලෙස හැඳින්වූ බවත් වැල් කැප්පෙටියා ශාකයේ, ශරීරයේ ඉරීගිය මාංශපේෂී යථා තත්වයට පත් කිරීමට සමත් ගුණයන් පවතින හෙයින් එය මස්බැද්ද ලෙස හඳුන්වා ඇති බවත්ය.

# කීකිරිඳිය
## *Eclipta prostrata*
## Asteraceae



**ශාකයේ ස්වාභාවය**

තෙතමනය සහිත ස්ථානවල සුලභව හමුවන කීකිරිඳිය පැලෑටිය පොළවට සමාන්තරව මීටර් භාගයක් දක්වා දිගට වැඩෙන දුර්වල කඳක් සහිත දේශීය ශාකයකි.

භූමිය මතුපිටට ඇලී වර්ධනය වන රතු පැහැති කඳේ ගැටවලින් පොළවට මුල් ඇදේ. පත්‍ර සහ කඳ සියුම් බූවක් සහිතය. පත්‍ර ඉලිප්සාකාර සිට ලංසාකාර විය හැකිය. පත්‍රයක් සෙ.මී 5 දක්වා දිගු වන අතර මි.මී 15 දක්වා පළලට වර්ධනය වේ. පත්‍ර දාරය සම්පූර්ණ හෝ මඳ වශයෙන් දන්තුර වේ.

සුදු පැහැති සංයුක්ත පුෂ්පයෙහි කුඩා පුෂ්පිකා රාශියකි. ඵලය චර්මලයකි. කේෂ කලාපයේ සහ හිසේ නිරෝ්ගීභාවයට අදාලව වඩාත් ප්‍රකට කීකීරිඳිය ශාකය Asteraceae කුලයට අයත් ය.

**යොදාගත හැකි රෝග අවස්ථා**

- හිස කෙස් වර්ධනය කිරීමටත්, අකලට කෙස් හැලී යාම වැලැක්වීමටත් සමත් ගුණයන් සහිත බැවින් කේෂ කලාපයේ සහ හිසෙහි රෝග සඳහා කීකිරිඳිය සුලභව භාවිතා කරයි.
- එමෙන්ම පාණ්ඩු, පීනස, ඇදුම, ක්ෂය රෝගය, හෘද රෝග, යාකෘත් රෝග, ප්ලීහා රෝග, උදරාබාධ, සෙංගමාලය, අම්ලපිත්ත හෙවත් ගැස්ට්‍රයිටීස්, පණු රෝග, වණ, අක්ෂි රෝග, මුත්‍ර දැවිල්ල ආදී රෝග අවස්ථා රැසකට ප්‍රතිකාර කිරීමේදී මෙම සම්පූර්ණ පැළෑටියම භාවිතයට ගනී.

යෝග

- භෘංගරාජ චූර්ණය, භෘංගරාජ තෛලය කීකිරිදිය යොදා නිපදවන ඖෂධයන් ය.
- බොහෝ විට කීකිරිදිය අමු අවස්ථාවේදී භාවිතයට ගතයුතු වීම විශේෂත්වයකි.
- කීකිරිදිය ස්වරස (අමු යුෂ) කෙස්වල ගැල්වීමෙන් අකලට හිසකෙල් හැලී යාම නවතී.
- එම ස්වරසය හිසෙහි ගැල්වීමෙන් හිසෙහි වේදනාවන් සමනය වේ.
- මුත්ර දැවිල්ලට ස්වරස තේ හැඳි එකක් ජලයට දියකර බීම, ඇට යොදා සකසා ගත් කිරි කෂාය දීම ගුණදාකය.
- කීකිරිදිය ස්වරස එළු කිරි සමඟ බීමෙන් ගබ්සාවීම් වලක්වා ගත හැකිය.
- කීකිරිදිය බටු දළු යුෂ මී පැණි සමග දීමෙන් සෙම සහිත කැස්ස සුව වේ.
- මෙම කොළ මලවා කෑම පණු රෝග සඳහා ප්රතිකාරයකි.
- කෘමි දෂ්ඨන ආදීයෙදී බාහිරව යුෂ ගැල්වීම හෝ ප්රලේපය තැවරීම සුදුසු ය.
- කීකිරිදිය චූර්ණය උක් හකුරු සමග කෑම අම්ලපිත්තයට ගුණ වේ.
- පාණ්ඩුව රෝගයේදී කීකිරිදිය යොදා සකසා ගත් නොයෙක් ඖෂධ යෙ ාෙග යෙදීමෙන් රක්තාණු වර්ධනය වීම සහ රුධිරය පිරිසිදු වීම සිදු වේ.
- කීකිරිදිය ඇට චූර්ණය රසායන වාජීකරණ ගුණයෙන් යුක්ත ය.
- කීකිරිදිය ව්යංජනයක් ලෙස සකසා ආහාරයට ගැනීමෙන් නේත්රාබාධ ඇති නොවන බව ගැමියෝ කියති.
- පෙර කළ ගැමි කතුන් කළුවන් නිරෝගී දිගු වරලසක් සඳහා ස්නානයට පෙර කීකිරිදිය යුෂ හිස ගැල්වීමට අමතක නොකලේය. මෙම යුෂද කාල වර්ණය.

# කොතලහිඹුටු

## *Salacia reticulata*

## **Hippocrateaceae**



**ශාකයේ ස්වාභාවය**

කොතලකෙමිය යනුවෙන්ද හඳුන්වන කොතලහිඹුටු පඳුරක් ලෙස වැවෙන දැඩි කඳක් සහිත කාෂ්ඨීය වැලකි.

කඳ අළු පැහැයට හුරු සුදු පැහැතිය.

ඉලිප්සාකාර හෝ අණ්ඩාකාර හැඩයක් සහිත පත්‍ර සම්මුඛව පිහිටයි. පත්‍රයක දිග සෙ.මි. 12 ක් සහ පළල සෙ.මි. 5.5 ක් දක්වා වර්ධනය වේ.පත්‍රයේ උඩ පෘෂ්ඨය දිලිසෙන ස්වභාවයක් ගනී. යට පෘෂ්ඨය ළා පැහැති වන අතර සියුම් නාරටි සහිත කැපී පෙනෙන ජාලාභ නාරටි වින්‍යාසය වෙනත් Salacia විශේෂ වලින් වෙන්කර හඳුනා ගැනීම පහසු කරයි.

කක්ෂීය පුෂ්ප මංජරියක හට ගන්නා මල් කොළ පැහැයට හුරු කහ පැහැතිය. ඵලය රළු පොත්තක් සහිත ගෝලාකාර අෂ්ටිලයකි.

ඉදෙන විට දීප්තිමත් රෝස පාටට හුරු තැඹිලි පාටක් ගනී. එය අගනා පළතුරකි. ඵලයෙහි නටුව සම්බන්ධ වන ස්ථානයේ ඉහලට පිහිටන නෙරුම ද කොතල හිඹුටු අනෙක් හිඹුටු වර්ගවලින් වෙන්කර හඳුනා ගැනීමට උපකාරී වෙයි.

කොතලහිඹුටු ශාකය පහසුවෙන්ම හඳුනා ගත හැකි තවත් ප්‍රකට ලක්ෂණයක් වන්නේ කඳේ හරස්කඩේ ඇති පැහැදිලිව පෙනෙන වලයාකාරව පිහිටන අලංකාර වෛරම් ය. මේවා නිසා කොතලහිඹුටු කඳ වට්කාකමින් ඉහල කො ්ප්ප, ජොග්ගු වැනි භාණ්ඩ නිපදවීමටද භාවිතා කරයි.

- ❖ වඳවීයාමේ තර්ජනයටද ලක්වී ඇති වටිනා දේශීය ශාකයක් වන කොතලහිඹුටු Hippocrateaceae උද්භිද කුලයට අයත් ය.

යොදාගත හැකි රෝග අවස්ථා

- කොතලහිඹුටු දියවැඩියා රෝගය සඳහා සාර්ථකව යොදා ගත හැකි බව පර්යේෂණාත්මකව තහවුරු කර ඇත.
- එමෙන්ම විෂමේහ, ආමවාත, චර්ම රෝග, ප්‍රමේහ, ව්‍රණ ආදියට ප්‍රතිකාර කිරීමේදී කොතලහිඹුටු ශාකයේ මුල්, පොතු හා වැල භාවිතා කරයි.
- කොතලහිඹුටු ව්‍රණ ශෝධනය කරන, රුධිරය පිරිසිදු කරන ගුණයන් සහිතයි.
- දේශීයව විෂමේහ, මධුමේහ, ශර්කරාමේහ ඇතුළු මේහ රෝග  රෝග සඳහා කොතලහිඹුටු බහුලව භාවිතා කර ඇති බවත්, මේහ චිකිත්සාවේ එන ඖෂධ යෝග බොහෝමයක යෙදී ඇති බවත් සඳහන්.
- විශේෂයෙන් මේහ රෝගීන්ගේ පිපාසය නැති කිරීමට යොදා ගෙන ඇත.

යෝග

- කොතලහිඹුටු පමණක් තම්බා පානය කිරීමෙන් දියවැඩියාව පාලනය කර ගත හැකි වේ.
- දියවැඩියාවේ ඉදිරි අවස්ථාවක් වන මධුමේහයට ප්‍රතිකාර කිරීමේදී කොතලහිඹුටු කලං 12 කෂායද, කොතලහිඹුටු වෙනත් ඖෂධ සමඟ යෙදූ යෝගද භාවිතා කරයි.
- ව්‍රණ චිකිත්සාවේදී කොතලහිඹුටු මුලේ පොතු යෙදූ පත්තු සහ මැල්ලුම් යොද ගනී.

- ❖ කොතලහිඹුටු මුල් වැඩි ප්‍රමාණයක් දිනපතා තම්බා පානය කිරීමෙන් රුධිරයේ සීනි මට්ටම අසාමාන්‍ය ලෙස පහත වැටිය හැකි බවත්, ඒ හේතුවෙන් ක්ලාන්තය, ඇස් නිලංකාර වීම වැනි කම්පන ලක්ෂණ සහ ඇතැම් විට මරණය පවා සිදු විය හැකි බව දක්වා ඇත.
- ❖ ඒ නිසා දියවැඩියාවට කොතලහිඹුටු භාවිතා කරන්නේ නම් රුධිරයේ සීනි මට්ටම ගැන නිරන්තර අවධානයෙන් පසු වීම අතිශයින් වැදගත් වේ.

# ජයපාල

## *Croton tiglium*

## **Euphorbiaceae**




**ශාකයේ ස්වාභාවය**

ජන වහරේ ජාපාල යනුවෙන් ප්‍රකට ජයපාල මීටර් 7 ක් පමණ උසට වැඩෙන කුඩා දේශීය ශාකයකි.

සිනිඳු කඳෙහි පොත්ත දුඹුරු පැහැතිය. ළපටි අතුවල තාරකාකාර බූවක් පිහිටා තිබේ.

දිගු නටුවක් සහිත සරල පත්‍රවල පිහිටීම සාමාන්‍යයෙන් ඒකාන්තර වන අතර කඳෙහි අග්‍රස්ථයට වන්නට සුළු වශයෙන් සම්මුඛ විය හැකිය. පත්‍රයක් දිගින් සෙ.මී. 15 හා පළලින් සෙ.මී. 8 දක්වා වර්ධනය වේ. පත්‍ර හැඩය අණ්ඩාකාර හෝ අණ්ඩාකාර-ලන්සාකාර ය. තියුණු අග්‍රයක් සහිත පත්‍රවල පත්‍ර දාරය ඇතැම්විට කඩතොලු සහිත ය.

පුෂ්ප මංජරිය අග්‍රස්ථ හෝ කක්ෂීය වේ. මල් ළා කහ පැහැතිය. ඵලය ස්ඵෝටිකාවකි. ඒ තුල ඉලිප්සාකාර-තුන්තල හැඩයෙන් යුත් අළු පැහැයට හුරු දුඹුරු පැහැති බීජ පිහිටා තිබේ.

❖ ජයපාල Euphorbiaceae උද්භිද කුලයට අයත් ශාකයකි.

**යොදාගත හැකි රෝග අවස්ථා**

- ජයපාල ඉතාම උග්‍ර විරේචක ද්‍රව්‍යයක් ලෙස ඉතා ප්‍රකටය. ජාපාල ගහක් යට සිටියත් බඩ බුරුල්වන්නේ යැයි ගැමියන් කියන්නේ නිකමට නොවේ.
- දේශීය වෛද්‍ය ග්‍රන්ථවල සහ ඖෂධ වට්ටෝරුවල "නෙරුවාල" යනුවෙන් හඳුන්වා ඇත්තේ ද ජයපාල ය.

- දේශීය ගුළි කල්කවල බොහෝ විට පත්තියම් පංගුව හා විරේක පංගුව ලෙස එකම බෙහෙත කොටස් දෙකකට අඹරා ගැනෙන අතර විරේක පංගුවට නිරතුරුව යෙදෙනුයේ ජයපාල ය.
- පිරිමින්ගේ ලිංගික අප්‍රාණිකත්වය, කුසගිනි මදිකම, අජීර්ණ, විබන්ධ, කෘමි රෝග, ජලෝදර, මොළයේ ලේ වහනයවීම්, සංන්‍යාස, විෂ ශරීරගත වීම, සර්ප විෂ, උඳුගොව්වා කෑම, ආමවාතය, ග්‍රන්ථිගත රෝග, ඉදිමුම් ආදියට ප්‍රතිකාර කිරීම සඳහා ප්‍රධාන වශයෙන් ජයපාල ශාකයේ බීජ සහ බීජ තෛලයත්, අමතරව කොළ, පොතු, මුල් හා දඬුත් භාවිතයට ගනී.
- ජයපාල හෝමියෝපති වෛද්‍ය ක්‍රමයේ ඖෂධ නිපදවීම සඳහා ද භාවිතා කරන ඔසුවකි.
- කුඩා කුමාර ගුලිය, වලිප්පු ගුළිය, මාන්දම් වජ්‍රකාන්ති ගුළිය, මාන්දම් සන්නි ගුළිය, පිප්පල්යාදී ගුළිය ආදී ජයපාල යොදා නිපදවන ඔසු රැසක්ද ඇත.

යෝග

- සර්ප විෂට ජයපාල ඇට දෙහි ඇඹුලෙන් අඹරා ඇස්වලට අඳුන් යොදයි.
- උඳුගොව්වන් කෑමට ඇට දෙහි යුෂින් ගලගා අදාල ස්ථානයේ ආලේප කරයි.
- ජලොදර සහ සංන්‍යාසයට විරේකය සඳහා යොදා ගනී.
- පිරිමින්ගේ ලිංගික අප්‍රාණිකත්වයට විෂ ඉවත්කරගත් ජයපාල ගිතෙලින් බැද අඹරා ලිංගයේ ආලේප කරයි.
- ආමවාත, ග්‍රන්ථිගත ආබාධ, ඉදිමුම් ආදියට ප්‍රතිකාර කිරීමේදී බීජ තෛලය බාහිර අලේපනය සඳහා යොදා ගනී.

❖ ජයපාල උග්‍ර විරේචක සහ විෂ සහිත ද්‍රව්‍යයක් බැවින් ඖෂධ සඳහා භාවිතා කිරීමට පෙර විෂ ඉවත්කර ශෝධනය කර ගැනීම අනිවාර්ය කටයුත්තකි.

❖ පිරිසිදු අළුත් ගොම දියකරගත් ජලය හා ගව මුත්‍ර දෙහි යුෂ පිළිවෙලින් එකිනෙකින් තම්බාගෙන පිට පොත්ත හා ඇතුලේ මොටෙයියාද ඉවත්කර ගිතෙල්වල බහා තබා එයින්ම බැදගත යුතුය. මෙහිදී බැදීමට මැටි බඳුනක් යොදා ගැනීමට නිර්දශ කර ඇත.

➢ ජයපාල ශරීරගත වීමෙන් ජලය මෙන් වන තුරු බොහෝ වාරයක් මලපහ පිටවීම, වමනය, මුඛයේ අම්හිරිතාව, අන්ත්‍රවල වණ ඇතිවීම, කෙල වැගිරීම, මුඛය වියළීම, ඇස් ගිලීයාම, ක්ලාන්තය, අධික දහදිය දැමීම, මස්පිඩුවල ගැස්ම,

සිරුරෙන් අධික තාපයක් පිට වෙන්නා සේ දැනීම, ඇසේ දෘෂ්ටිය අඳුරු වීම ආදී සංකූලතාවයන් මෙන්ම ඇතැම්විට මරණය ද සිදුවිය හැකිය.

- මෙවැනි විටෙකදී එළකිරි තැඹිලි වතුර, අලුපුහුල් යුෂ, කූරතම්පලා යුෂ, බිත්තර සුදු මද, කෝපි, මුංඇට තැම්බූ ජලය යන මේවා දීම ගුණදායක ය.
- විෂ දුරුකිරීම සඳහා වදකහ පුලුස්සාගත් අළු, සියඹලා රොඩු දැවූ අළු යන මේවා සමව ගෙන ජලයට දියකර බාගයට සිඳුවා පැය දෙකකට වරක් පෙවිය යුතුය. එවිට වමනය සහ විරේචකය නවතී. පසුව සුදුලූණු කලං 3 ක්ගෙන වතුර පතක් දමා තම්බා පෙරා මී පැණියෙන් දිය යුතුය.

- ජයපාල ඖෂධිය ද්‍රව්‍යක් ලෙස භාවිතා වනවාට අමතරව පැරැන්නන් විවිධ සාමාජීය අවශ්‍යතාවයන් සඳහා යොදා ගෙන ඇත. එහිදි විවිධ කෙම් ක්‍රම සඳහා මෙන්ම සතුරන් මර්ධනයටද, කිතුල් මල් කැපීමේදී මල් බෙහෙත් තැබීම ආදිය සඳහා ද භාවිතා කර ඇත.

# කරඳ

## *Pongarnia pinnata*

## Fabaceae



**ශාකයේ ස්වාභාවය**

කරඤ්ජ නම් ප්‍රකට පර්යාය නාමයක්ද සහිත කරඳ ජලාශ්‍රිත පරිසර පද්ධති ආශ්‍රිතව සුලභව හමුවන තරමක් විශාල දේශීය ශාකයකි.

අළු පැහැති පොත්ත සිනිඳු ය. පැසුණු ලීය කහ පැහැයට හුරු සුදු පැහැති ය. අසම පක්ෂවත් සංයුක්ත පත්‍ර ඒකාන්තරව පිහිටයි. පත්‍රිකා යුගල වශයෙන් පිහිටා තනි පත්‍රිකාවකින් කෙලවර වේ. පත්‍ර නටුව සෙ.මී. 12.5 පමණ දිගු විය හැකි අතර පත්‍රිකා 5-9 අතර සංඛ්‍යාවක් පිහිටයි. දෙපැත්තම දිළිලෙස සුලු පත්‍රිකා හැඩයෙන් අණ්ඩාකාර හෝ ලංසාකාර ය.

ඒකාක්ෂ පුෂ්ප මංජරියක හට ගන්නා රෝස පැහැති මල් අලංකාරවත් ය. අප්‍රේල් මාසයේදී මල් හට ගනී.

ඵලය ඕවලාකාර-ආයත හැඩයෙන් යුත් නොපැලෙන කරලකි.

❖ සෙවන සඳහා ද වැවිය හැකි කරඳ ශාකය Fabaceae කුලයට අයත් ය.

**යොදාගත හැකි රෝග අවස්ථා**

- දන්ත රෝග, ග්‍රහණී රෝග, ප්‍රමේහ, ගුල්ම, ඉරුවාරදය, ආමවාතය, පණු රෝග, රුධිර දෝෂ, වණ, වාතරක්ත, කුෂ්ඨ ආදී රෝගයන්ට ප්‍රතිකාර කිරීමට මහුල්කරඳ ශාකයේ මුල්, මුලේ පොතු, කඳේ පොතු, කොළ, දලු, ඇට ආදිය භාවිතා කරයි.
- කරඳ ඉදිමුම් සහ වේදනාවන් නසන, අක්මාව උත්තේජනය කරන, රුධිරය පිරිසිදු කරන ආදී ගුණයන් සහිතයි.

යෝග

- කරඤ්ජාදී චූර්ණය, කරඤ්ජාදී තෛලය, චිත්‍ර කරඤ්ජාදී තෛලය, කරඳ පොතු ප්‍රලේපය, කරඳ දලු තුලසී ප්‍රලේපය ආදී කරඳ යොදා නිපදවන ඖෂධ රැසකි.
- කුෂ්ඨ සඳහා කරඳ ඇට හා කෙළිඳ ඇට අඹරා ආලේප කරයි.
- ලේ පිටවන අර්ශස් රෝගයට කරඳ දලු අඹරා ආලේප කළ යුතුය.
- කල්ගිය වණ සඳහා කරඳ කොළ තම්බා සෝදා ඉන් පසු කරඳ කොළ අඹරා ආලේප කළ යුතුය.
- කරඳ කොළ තම්බා ගත් වතුරින් නෑමෙන් සන්ධි වේදනාවන් පහව යයි.
- කිටිභ රෝගයට කරඳ ඇට තෙල්, හුණු, දෙහි ඇඹුල් බාහිරව ආලේප කළ යුතු බව දක්වා ඇත.

- කළකට පෙර බෞද්ධ භික්ෂූන්වහන්සේලා සහ ගැමියන් දත් මැදීමට දැහැටි කූරු ලෙස සුලභව භාවිතා කළේ කරඳ කෝටුය. දැහැටි ලෙස භාවිතා කළ තවත් ශාකයක් වන්නේ බෝඹු ය.
- තොවිල් වලදී කරඳ ප්‍රයෝජනයට ගනී.
- සිංහල අවුරුදු චාරිත්‍රවලදී හිසතෙල් ගෑම සඳහා කරඳ කොළ භාවිතා කරයි.
- කරඳ ඇටවලින් ලබා ගන්නා තෙල්වල කෘමි නාශක සහ විෂබීජ නාශක ගුණ ඇති බව සඳහන්. මෙම තෙල් හම් පදම් කිරීමට, සබන් වර්ග සෑදීමට, ලිහිසිකාරකයක් ලෙස සහ පහන් දැල්වීම ආදියට භාවිතා කළ හැකිය.
- කරඳ ලීය වටිනා දැවයක් නොවුන ද කරත්තවල ගොන්නු බඳින ලීය සඳහාත්, නඟුල්, කරත්ත රෝද ආදිය සෑදීමටත් යොදා ගනී.
- කරඳ ගසට දකුණු පසින් තුඹසක් ඇති විට ඒ අසන්නයේ නොගැඹුරු පොළවේ ජල නිධියක් ඇති බව ඉපැරණි භූමි ලක්ෂණ විශේෂඥයින්ගේ අදහසකි.
- කරඳ මල් දැකීම සශ්‍රිකත්වයේ පෙරනිමිත්තක් බව පැරණි පොත පතෙහි දක්වා ඇත.
- ඖෂධ සඳහා භාවිතා කරන පූතිකරඤ්ජ නම් ශාකයක් ගැන පොත්පත්වල සඳහන් කර ඇතත් එය මතභේදාත්මක ශාකයක් බව සඳහන්. පූතිකරඤ්ජ යනු කුඹුරු වැල් (Caesalpinnia bonduce) ද ගල් කරඳ (Humboldtia laurifolia) ශාකය ද යන්න තවම නිශ්චිතව විසඳා නැති ගැටළුවකි. පෙර කළ "මඟුලේ යන්නා" යන රහස් නාමයෙන් හඳුන්වා ඇත්තේ ද මඟුල් කරඳ ශාකයයි.

# කැටකැල
## *Bridelia retusa*
## **Phyllanthaceae**



**ශාකයේ ස්වාභාවය**

මෙය කැටකාල, කැටැකැල යනුවෙන්ද හඳුන්වන මධ්‍යම ප්‍රමාණයේ දේශීය ශාකයකි.

ඇතැම් ශාකවල කඳෙහි පොළවට ආසන්නව තියුණු නොවන කටු දැකගත හැකිය. ඇතැම් විට ගස කුඩා කාලයේදී පැවති කටු පරිනතියත් සමඟ අභාවයට යයි.

කටු සහිත වර්ගය කටු කැල ලෙසත් කටු රහිත වර්ගය කැටකැල ලෙසත් ප්‍රභේද හෝ විශේෂ දෙකක් හඳුනාගත හැකිය.

පොත්ත ළා කහ-අළු පැහැතිය. මලකඩ වැනි බූවක් ළපටි ශාඛා මතුපිට දැකගත හැකිය. සරල පත්‍ර ඒකාන්තරව පිහිටයි. පත්‍ර මතුපිට දීප්තිමත් කොළ පැහැති වන අතර යටි පැත්තෙහි සුදු පැහැති සියුම් බූවක් ඇත

පතනශීලී පුෂ්ප ක්‍රමවත්, ඒකලිංගික කොළ පැහැ මිශ්‍ර රතු හා දම් මඬලකි. මල් පිපීම ජූනි, ජූලි මාස වලදී සිදුවේ.

ඵලය අෂ්ටිලයකි. පොකුරු වශයෙන් දක්නට ලැබෙන කහ පැහැති ගෙඩි ඉදුනු පසු රෝස පැහැයක් ගනී.

පැණිරස මුසු කසට රසයෙන් යුත් ඉදුණු ගෙඩි කෑමට ගත හැකිය.

දැවමය වටිනාකමක්ද සහිත කැටකැල ශාකය Phyllanthaceae කුලයට අයත් ය.

යොදාගත හැකි රෝග අවස්ථා

- කැටකැල පොතු සහ කොළ දේශීය වෙදකමෙහි, විශේෂයෙන් කැඩුම් බිඳුම් හා ගෙඩි වණ වෙදකමේ බහුලව භාවිතා කරනු ලැබේ.
- භග්න චිකිත්සාවෙහි අස්ථි සංධානය සඳහා බෙහෙවින් උපයෝගී කරගන්නේ කැටකැල පොතුය. ඒ කසට හා ස්ථම්භන ගුණයෙන් යුක්ත බැවිනි.

යෝග

- කැඩුණු ඇට සන්ධි ගන්වා කැටකැල පොතු තබා බැඳීමෙන් ඇට පෑහිම හෙවත් අස්ථි සන්ධානය වහා සිදුවේ.
- කැටකැල පොතු, මුල්, කොළ සමඟ අමුකහ සහ ලුණු දමා කොටා තලතෙලින් මළවා බැඳීමෙන් බිඳී ගිය අස්ථි ඉක්මනින් පෑහීම සිදුවේ.
- සන්ධි වූ තැන කටු සවිවීමට කැටකැල පොතු, කහට පොතු, හික් පොතු, මාදං පොතු සහ කඩොල් පොතු යුෂට පොල් පැණි දමා පත්තු සිඳ ආලේප කරයි.
- කැටකැල පොතු, කැලිය පොතු, කඩොල් පොතු, දෙමට පොතු, පලු පොතු, තරණ දලු කොටා මිරිකා යුෂ ගෙන පැණි සිඳ ආලේප කිරීම සන්ධි පැනීමෙදී සිදුකරන ප්රතිකාරයකි.
- එමෙන්ම කුෂ්ඨ රෝග, රතගාය, ගඩු, අභිඝාත, ආදියට ප්රතිකාර කිරීමේදීද කැටකැල පොතු භාවිතා කරයි.
- කුෂ්ඨ රෝගවලදීකැටකැල දලු අඹරා ආලේප කිරීම සිදු කරයි.
- වැටීම් තැලීම් ආදියේදී ඉලයේ ඇතිවන වේදනා වලදී බටහිර පැත්තේ පොත්තක් පහලට ගලවා යුෂ ගෙන කකරා පැණි පදමට ගෙන ශරීර උෂ්ණත්වයට පමණ ගෙන ආලේප කිරීම ප්රත්යක්ෂ ප්රතිකාරයක් බව සඳහන් වේ.
- රතගායට කැටකැල පොතු, කැකුණ පොතු, මදටිය පොතු, රම්මානිස්ස කොළ පැන් සිඳ හීනටි බත් අඹරා ආලේප කිරීම, ගඩුවලට කැටකැල පොතු, කැබැල්ල පොතු කොටා යුෂ ගෙන පැණි සිඳ ගඩුවල ආලේප කිරීම ආදී ප්රතිකාර රාශියක් සඳහා කැටකැල දේශීය වෙදකමේදී භාවිතයට ගැනේ.

# නෙල්ලි
## *Phyllanthus embilica*
## Euphorbiaceae



**ශාකයේ ස්වාභාවය**

බෙහෙත් නෙල්ලි යනුවෙන්ද ජන ව්යයවහාරයයේ හඳුන්වන නෙල්ලි මීටර් 15 පමණ උසට වැඩෙන දේශීය ශාකයකි.

පතනශීලි හෙවත් කලකදී කොළ හැලී යන ශාකයක් වන මෙහි පිට මෙහි පොත්ත ගැලවී ඉවත් වන ස්වභාවයක් ගනී.

එ්කාන්තරව පිහිටන සංයුත්ත පත්රයක් සෙ.මී. 20 දක්වා දිගගට වර්ධනය වේ. එක ගෘහි හෙවත් ස්ත්රි සහ පුරුෂ මල් එකම ශාකයේ පිහිටයි.

පුෂ්ම මංජරියක පුරුෂ මල් රාශියක් සහ ස්ත්රි මල් 1-2 ක් වන සේ මල් හටගනී. පිරිමි මල් සුදු පැහැති වන අතර ගැහුණු මල් දුඹුරු පාටට හුරු අඳුරු පැහැයක් ගනී.

ඵලය බදරියක් හෝ වියළෙන විට පැලී යන ස්ඵෝටිකාවකි. පංච රසයෙන් යුත් වටිනා පළතුරක්ද වන නෙල්ලි Euphorbiaceae උද්භිද කුලයට අයත් ශාක විශේෂයකි.

**යොදාගත හැකි රෝග අවස්ථා**

- ප්රමේහ, කැරකිල්ල, හිසරුදා, මද සරු භාවය, මුඛ රෝග, රත්පිත, අක්ෂි රෝග, පිත් වමන, පීනස, මලබද්ධය, බඩ පිපුම, කේෂ රෝග, මුත්ර රෝග, ස්වනස අපහසුතා, පාණ්ඩු. ගුල්ම අරුචි ආදී රෝග සඳහා ප්රතිකාර කිරීමට නෙල්ලි ශාකයේ කොළ, පොතු. මුල්, මල්, ගෙඩි, ඇට මද ආදිය භාවිතා කරයි.
- නෙල්ලි ශාකයේ එක් එක් කොටස් විවිධ ගුණයන්ගෙන් යුක්ත බව සඳහන්.
- ඒ අනුව වියළි නෙල්ලි භග්න සන්ධානය කරන, ඇසට හිතකර, පිත, සෙම, පිපාසය, විෂ නසන ගුණ සහිතයි.

- අමු නෙල්ලි හිසකෙස් වැඩීමට, විරේචනයට හිතකර සහ අරුචිය, රත්පිත, ප්‍රමේහ, විෂ, උණ, වමනය, මලබද්දය, ඉදිමුම්, රක්ත දෝෂ ආදිය නසන ගුණ සහිත බව සඳහන්.
- නෙල්ලි ඇටමද ප්‍රදර රෝග, වමනය, වාතය, පිත, උණ, ඇදුම, කැස්ස නසන ගුණයන්ගෙන් යුක්ත ය.
- නෙල්ලි මුල වමන, අරුචි, තුන්දොස් කෝප, මලබද්ධය නසන ගුණ සහිත බව දක්වා ඇත.
- ත්‍රිඵලා චූර්ණය, ච්‍යවනප්‍රාශාවලේහය, ධාත්‍රි රසායනව වැනි නෙල්ලි යොදා නිපදවන ඖෂධ රැසකි.
- අරළු, බුළු සහ නෙල්ලි යොදා නිපදවන ත්‍රිඵලා චූර්ණය ජීර්ණ පද්ධතිය මනා සෞඛ්‍යයකින් පවත්වාගෙන යෑමට බෙහෙවින් උපකාර වන ඖෂධයකි.

යෝග

- මලබද්ධයට  නෙල්ලි මුල් හා ගෙඩි මඳ කෂාය කර බීමට දෙයි.
- වමන, කුෂ්ඨ ආදී චර්ම රෝගයන්ට නෙල්ලි කෂායට සීනි හා කිර දමා පානය කළ යුතුය.
- විසූචිකා නම් ජීර්ණ පද්ධතියට සම්බන්ධ රෝගයේදී නෙල්ලි දලු අඹරා මෝරුවෙන් අනා කෑමට ගත යුතුය.
- මුඛයේ ඇති වන තුවාල සඳහා නෙල්ලි කොළ කෂායෙන් කට සේදීම හෝ එම කෂාය මුඛයේ ටික වේලාවක් රඳවාගෙන සිටිම කළ යුතුය.
- නෙල්ලි කොළ තම්බා දෙනෙත් සේදීමෙන් දෙනෙත්වලට අපූරු සුවයක් ලැබේ.
- ප්‍රමේහයට නෙල්ලි මුලේ අමු සුඹුලක් ගෙන කස පැණියෙන් සෝදා කොටා යුෂ ගෙන ඊට කහකුඩු මී පැණි මිශ්‍ර කර දවසට දෙවරක් පානය කිරීමට නියම කර ඇත.
- කැස්ස, ඇදුම සහ ක්ෂය රෝගයට නෙල්ලි යුෂ පානයක් ලෙස හෝ නෙල්ලි ගෙඩි පළතුරක් ලෙස කෑමට ගැනීම ගුණදාකය.
- මුත්‍ර අඩස්සියට සහ පිත්තජ ප්‍රමේහයට මෙන්ම මුත්‍ර දෝෂවලටද නෙල්ලි යුෂ පානය කිරීම ගුණය.
- මුත්‍ර අඩස්සිය ඇති විට නෙල්ලි උණු වතුරෙන් අඹරා යටිබඩේ ගෑ විට පහසුවෙන් මුත්‍ර පිට වෙයි.
- ශ්වේත ප්‍රදරයට ප්‍රතිකාර ලෙස නෙල්ලි පිටි, නෙල්ලි යුෂ යන දෙකෙන් එකක් මී පැණි සමඟ දීම හෝ නෙල්ලි ඇට ඇල් වතුරින් අඹරා සීනි මිපැණි සමඟ දීම සිදු කරයි.
- නෙල්ලි, රසකිඳ කල්කය මොරුවෙන් දීම අර්ශස් රෝගයට ප්‍රතිකාරයකි.

- අක්මාවේ මේදය තැන්පත් වීමෙන් පීඩා විඳින අයට නෙල්ලි යුෂ තේ හැන්දක් දින 25ක් පමණ සෑම උදෑසනකම පානය කිරීම බෙහෙවින් ප්‍රතිඵලදායක බව සඳහන්.

❖ නෙල්ලි රසායන ගුණයෙන් යුක්ත හෙයින් තරුණ බව සහ කාය ශක්තිය පවත්වාගෙන යෑමට උපකාරී වෙයි.

❖ නෙල්ලි ආහාරයට ගැනීමෙන් සම පැහැපත්වීම, හිසකෙස් ගැලවීම සහ පැසීම වැළැක්වීම, අහාර ජීර්ණය ක්‍රමවත් වීම, මලබද්ධය ඇති නොවීම ආදී ප්‍රතිලාභ රැසක් අත් විඳිය හැකිය.

❖ එමෙන්ම නිරක්තිය හෙවත් ලේ හිගකම මගහරවා ධාතු ශක්තිය වැඩි කරයි.

❖ නෙල්ලි, බඩගින්න වඩවන, මල ඇති කරන ආහාරයක් ලෙස සැලකෙන අතර අක්මාවේ ක්‍රියාකාරිත්වය උත්තේජනය කරන, හදවතට හිතකර ,රක්තපාතය වලක්වන ඔසුවක් ලෙස සැලකේ.

❖ විකිරණවලින් වන හානි වලක්වාගැනීමේ ගුණයක් නෙල්ලිවල ඇති බව පර්යේෂ මඟින් සනාථ කර ඇත.

❖ අක්මාවට, වකුගඩුවලට වන හානි නෙල්ලි ස්‍රාවයෙන් වලක්වා ගත හැකි බවත්, සිරුරට එක්වන විෂ සහිත ලවණවලට විරුද්ධව ක්‍රියා කිරීමට හැකියාවක් ඇති බවත් සඳහන්.

# සෙනෙහෙ කොළ

*Senna alata*

**Fabaceae**



**ශාකයේ ස්වාභාවය**

නිවර්තන ඇමරිකාව ජන්මභූමිය ලෙස සැලකෙන ඇත්තෝර මීටර් 5 පමණ උසය වැඩෙන කුඩා ශාකයක් හෝ පඳුරකි.

කඳෙහි මඳ බූවක් දක්නට ලැබේ. විශාල සංයුක්ත පත්‍රයක් සෙ.මී. 30-60 දක්වා වර්ධනය වෙයි. සංයුක්ත පත්‍රයක පත්‍රිකා යුගල 6-14 සංඛ්‍යාවක් පිහිටයි. පත්‍රිකා හැඩය ආයත සිට ප්‍රත්‍යණ්ඩාකර - ආයත ය. පත්‍රිකාවක් දිගින් සෙ.මී 5-15 හා පළලින් 2-7 දක්වා වැඩේ.

පුෂ්ප මංජරිය අග්‍රස්ථීය හෝ කක්ෂීය ඒකාක්ෂයකි. එහි කහ හෝ තැඹිලි පාට මල් රාශියක් හට ගනී.

ඵලය දිග සෙ.මී. 10-15 පමණ වන කරලකි. රොම්බසාකාර බීජ ළා හෝ තද දුඹුරු පැහැතිය.

❖ ඇත් තෝර Fabaceae උද්භිද කුලයට අයත් ශාකයකි.

**යොදාගත හැකි රෝග අවස්ථා**

- ඇත්තෝර ප්‍රධාන වශයෙන් දද කුෂ්ඨ ඇතුළු සමේ රෝග සහ පණු රෝග සඳහා ගුණදායක ඔසුවක් ලෙස ප්‍රකටය.
- එමෙන්ම ගුල්ම රෝග, අර්ශස්, වණ, වාතරක්ත, සන්ධිවාත, අක්මා රෝග, උදරාබාධ, ඉදිමුම්, මලබද්ධය ආදී රෝග සඳහා ද ප්‍රතිකාර කිරීමට මෙම ශාකයේ කොළ, මුල් සහ ඇට භාවිතා කරයි.

- ඇත්තෝර කප සහ වාතය සමනය කරන , විෂබීජ නාශක, පණුවන් නසන, අක්මාව ශක්තිමත් කරන, විරේචක ආදී ගුණ සහිතයි.

යෝග

- කුෂ්ඨ, දද, ආසාත්මිකතාවයන් සඳහා ඇත්තොර බීජ ලේපය හෝ පත්‍ර ස්වරසය යොදා ප්‍රතිකාර කරයි.
- දදවලට ඇත්තොර කොළ යුෂ ආලේප කිරීම හෝ කොළ මිටියක් ලෙස ගෙන කපා කැපූ පැත්ත දදයේ ඇතිල්ලීම සිදු කරයි.
- ඇත්තෝර කොළ යුෂට දෙහි ඇඹුල් කලවම්කර අව්වේ කකාරා ගා පැයකට පමණ පසුව නෑමෙන් අලුහම් සුව වේ.
- පණුකැවිළි හා දදවල ඇත්තෝර කොළ, දෙහි ඇට මද, සුදුළු‍ැණු සමව ගෙන දෙහි ඇඹුලෙන් අඹරා ගෑම හෝ බැඳීම සිදු කරයි.
- මී මැසි සහ බඹර විෂට කොළ යුෂ බීම හෝ ආලේපය ගුණය.
- ඇත්තොර කොළ මැල්ලුම ඉඳහිට අනුභව කිරීමෙන් පණුවන් මල මාර්ගය හරහා ඉවත්වී ගොස් පණු රෝග, විශේෂයෙන් කිරිපණු රෝගය සුව වෙයි.
- එමෙන්ම කොළ ගිතෙලින් මලවා කෑමද කිරිපණු රෝගය සඳහා ගුණදායකය.
- වැඩිපුර කෑමට ගැනීමෙන් උදර වේදනාව සහ විරේචනය සිදු විය හැකිය.
- වාතරක්ත, ගෘධ්‍රසි සහ රක්තවාත රෝගවලදී, රෝගයෙන් පීඩාවට පත් ස්ථානයට ඇත්තෝර කොළ තබා බැඳීමෙන් වේදනාම සමනය වේ.
- ගඳ සහිත වණවලට එඬරු තෙලින් තම්බා ගත් කොළ වණයට තබා බැඳීමෙන් සුවය ලැබෙයි. නූ
- තන ලොකයේ සම ආරක්ෂා කර ගැනීම සහ රුව රැක ගැනීම සඳහා භාවිතා කරන සබන් වර්ග, තෙල් වර්ග වැනි රූපලාවන්‍ය නිෂ්පාද සඳහා ඇත්තොර බහුලව භාවිතා කරයි.

# ඔලිඳ
## *Abrus precatorius*
## **Fabaceae**



**ශාකයේ ස්වාභාවය**

ඔලිඳ මීටර් 6 පමණ දිගට අධාරක ශාකයක් මත පැතිරී වැවෙන බහුවාර්ෂික වැලකි.

සෙ.මී. 5 සිට 12 දක්වා දිගු විය හැකි සංයුක්ත පත්‍ර ඒකාන්තරව පිහිටයි. පත්‍රයක සම්මුඛව පිහිටන පත්‍රිකා යුගල් 5 සිට 15 දක්වා සංඛාවක් තිබිය හැකි ය.

පුෂ්ප මංජරිය සංයුක්ත ඒකාක්ෂයකි. ද්වී ලිංගික මල් ළා දම් පැහැතිය.

ඵලය පැතලි කරලකි. මේරූ කරල පුපුරා බීජ විසිරී යයි. එක් කරලක් තුල බීජ 12 දක්වා සංඛාවක් තිබිය හැකි ය.

දිලිසෙන සුලු ඕවලාකාර හැඩැති බීජවල එක් පසක් කළු පැහැති වන අතර අනෙක් පස දීප්තිමත් රතු පැහැයෙන් යුක්ත ය.

බීජය සම්පූර්ණයෙන්ම කළු පැහැති ප්‍රභේදයක් ඇති අතර එය කළු ඔලිඳ සහ ඇතැම්විට පැණි ඔලිඳ නමින් ද හඳුන්වයි. මෙම උද්භිද ගණයටම අයත් Abrus melanospermus නම් උද්භිද නාමයෙන් හඳුන්වන සුදු පැහැති මල් සහ සුදු පැහැති බීජ හට ගන්නා ඔලිඳ වර්ගයක් ඇති අතර ඒවා එළ ඔලිඳ නම් වේ.

- ඔලිඳ විශේෂ Fabaceae උද්භිද කුලයට අයත් ශාක විශේෂයන් ය.
- ඔලිඳ වර්ග සමඟ පටලවා ගන්නා ශාකයක් වන්නේ වැල්මී ය.
- ඔලිඳ වර්ගවල කොළ, දඬු සහ විශේෂයෙන් මුල් පැණි රසින් යුක්තය.

- ඉහත සඳහන් කළ සම්පූර්ණයෙන්ම කළු පැහැති බීජ හට ගන්නා කළු ඕලිඳ සහ පැණි ඕලිඳ යන නම්වලින් හඳුන්වන ප්‍රභේදයේ මෙම පැණිරස ස්වභාවය තරමක් වැඩිය.
- එම නිසා ගැමියන් පමණක් නොව ඇතැම් වෛද්‍යවරු ද මෙම කළු ඕලිඳ ශාකය වැල්මී නමින් හඳුන්වා හෝ වැල්මී වෙනුවට ඖෂධ සඳහා භාවිතා කරනු දක්නට ලැබේ. එය වැරදි භාවිතයක් බව අවධාරණය කළ යුතුය.
- වැල්මී යනු Glycyrrhiza glabra නම් උද්භිද නාමයෙන් හඳුන්වන ශාකය වන අතර එය ලංකාව තුල හමු නොවෙයි.
- ආරෝහකයක් ලෙස නොව පඳුරක් ලෙස වැවෙන වැල්මී කලාතුරකින් ඔසු උයනක හෝ දේශීය වෛද්‍යවරයකු ලඟ තිබීමේ ඉඩකඩක් ඇති මුත් මෙරට ඇති බවක් වාර්ථා වී නැත.

යොදාගත හැකි රෝග අවස්ථා

- සමේ රෝග, පිත්තාශ රෝග, වණ, කෘමි රෝග, කුෂ්ට, විෂ, සෙම් රෝග, අක්ෂි රෝග, මුඛ රෝග, උණ, කැස්ස, ඇදුම, මුත්‍ර අඩස්සිය, පිටගැස්ම, ජලභීතිකාව, උදරගත රෝග, ජීර්ණ පද්ධතියේ දෝෂ, සයටිකා, අකලට හිසකෙස් වැටීම, අර්ශස් ආදී රෝග රැසකට ප්‍රතිකාර කිරීමට විශේෂයෙන් ඕලිඳ ශාකයේ කොළ, මුල්, ඇට ආදියත් පොදුවේ පංචාංගයමත් භාවිතා කරයි.
- එළ ඕලිඳ විශේෂයෙන් සර්ප විෂ, වකුගඩු ආබාධ සහ ස්නායු රෝග සඳහා භාවිතා කරන බව සඳහන්.
- ක්වාථ, තෛල, ඝෘත, ලේප, රසායන ආදී වශයෙන් යෙදන ඖෂධ යෝග රැසකද ඕලිඳ ඇතුත්ව ඇත.
- ඕලිඳ හෘදය සහ ගර්භාෂය උත්තේජනය කරන, රුධිරය පිරිසිදු කරන, වාතය සහ පිත සමනය කරන, වාජීකරණ, කුෂ්ඨ නසන, වණ රෝපණය කරන, මුත්‍රකාරක ආදී ගුණයන් රැසකින් සමන්විතයි.
- ඕලිඳ ඇටවල අබ්රින් (Abrin) නැමැති විෂ රසායනිකයක් අඩංගු වන හෙයින් සම්මත ක්‍රමයන්ට අනුව විෂ ශෝධනය කර ඖෂධ සඳහා භාවිතා කළ යුතු වේ.

  ඕලිඳ ඇට විනාකිරෙන් හෝ එළකිරෙන් තම්බා ගැනීම, උතුරන වතුරෙහි බහා පැය කීපයක් තම්බා ගැනීම එවැනි ශෝධන ක්‍රම දෙකකි. තවත් මතයකට අනුව ඕලිඳ මුල් ද විෂ සහිත බව සඳහන්.

යෝග

- මුත්‍ර අඩස්සියට ඕලිඳ කොල කොටා තැඹිලි ගෙඩියක බහා රැයක් පින්නෙහි තබා උදයට මිරිකා පානය කළ යුතුය.
- අක්ෂිරෝගවලදී ඕලිඳ කොළ කොටා මඳ උණුසුමින් ඇස මතුපිට තැවීම ගුණය.

- දරු ප්‍රසූතිය පහසු කිරීමට ඔලිඳ මුල් ක්වාතය යොදා ගනී.
- වණවල මස් දලු ආ විට  ඔලිඳ ඇට ප්‍රලේපය යෙදීමෙන් මල් දල්ල කැපී යයි.
- කොළ අඹරා සීනි සමඟ චූෂණය (උරාබීම) මඟින් උගුර බැරුන්ඩිය සමනය වෙයි.
- ගෘධ්‍රසී, නාඩි ශූල හා සුදුකබර රෝගයන්ට බීජ අඹරාගත් ප්‍රලේපය යොදා ප්‍රතිකාර කරයි.
- උඳුගොව්වා කැමට අදාල ස්ථානයේ සේපාලිකා කොළයකින් පිරිමැද අඹරා ගත් ඔලිඳ කොළ ආලේප කළ යුතුය.
- මුඛය වණවූ විට ඔලිඳ කොළ ක්වාතය මුඛයේ තබාගෙන සිටීමෙන් සුවය ලැබෙයි.
- වාජීකරණයට ඔලිඳ කිරි කෂාය ප්‍රතිඵලදායක ය.
- ඔලිඳ කොළ යුෂට නිවුඩු හාල් යොදා පිස ගන්නා කොළ කැඳ හෘද රෝග, ඇස් රෝග ආදියට ගුණදායක ය.

❖ ඔලිඳ ඇට චූර්ණය වැඩිපුර භාවිතා කිරීම නිසා විෂ අවස්ථාවක් ඇති වුව හොත් කූරතම්පලා යුෂ සීනි සමඟ දීමෙන් විෂ නැසෙන බව සඳහන්.

❖ ඔලිඳ ඇට ඇතැම් රටවල මාල වර්ග වැනි විසිතුරු භාණ්ඩ නිපදවීම සඳහා සුලබව භාවිතා කරයි.

❖ සිංහල අවුරුදු සමයෙහි ඔලිඳ ඇටවලින් ඔලිඳ කොලොම්බ යොදාගෙන සිදුකරන ඔලිඳ කෙලිය පෙර කළ මෙරට ජනප්‍රිය ගැමි ක්‍රීඩාවකි.

# නික

## *Vitex nigundo*

## Verbenaceae




**ශාකයේ ස්වාභාවය**

වාත රෝග සඳහා බහුලව භාවිතා කරන ප්‍රකට ඖෂධයක් වන නික මීටර් 8 ක් දක්වා උසට වැඩෙන කුඩා ශාකයක් හෝ පඳුරකි.

පරිනත ශාකයෙහි පොත්ත රතු දුඹුරු පැහැති වන අතර තුනී පටලමය පටි ලෙස පොතු ගැලවී යයි. ළපටි අතු සුදු පැහැති බූවක් සහිතය. පහලින් පිහිටන අතු පොළව සමඟ ස්පර්ෂවූ විට මුල් අදී. පත්‍රිකා 3 ක් හෝ 5 ක් සහිත සංයුක්ත පත්‍ර සම්මුඛව පිහිටා තිබේ. නික කොළ තීක්ෂණ සුවඳකින් යුක්ත ය.

බහු අක්ෂමය පුෂ්ප මංජරියක හට ගන්නා නිල්, දම්, රෝස හෝ සුදු පැහැති කුඩා මල් සුවඳවත් ය. දම් හෝ කළු පැහැති මාංසල ඵලය තුල බීජ 4 පමණ පිහිටයි.

- ❖ නික Verbenaceae උද්භිද කුලයට අයත් ශාකයකි.
- ❖ ඇතමුන් මෙම උද්භිද ලක්ෂණම පිහිටන දම් හෝ දුඹුරු පැහැයට හුරු කොළ සහිත නික ශාකයක් කළු නික ලෙස හඳුන්වයි. එහෙත් එය නික (Vitex negundo) ශාකයේම ප්‍රභේදයක් මිස කළුනික නොවේ.
- ❖ කළුනික ශාකයේ උද්භිද නාමය Litsea iteodaphne වන අතර එය දවුල්කුරුඳු ශාකයට තරමක් සමාන සරල පත්‍ර සහිත Lauraceae කුලයට අයත් ශාකයකි. එම නිසා කළුනික සොයන අය වෙත්නම් ඔවුන් තවත් නික (Vitex) විශේෂයක් සෙවීම නිශ්ඵලය කාර්යයක් බව කිව යුතුය.

## යොදාගත හැකි රෝග අවස්ථා

- වාත රෝග, ඉදිමුම්, ආමවාතය හෙවත් ආතරයිටිස්, ගෘධ්‍රසී, නාසාරන්ධ්‍ර ශෝථය, නාග විෂ, දද කුෂ්ඨ, ඇස් රෝග, කර්ණ රෝග, ප්ලීහාව ඉදිමීම ආදී රෝග සඳහා ප්‍රතිකාර කිරීමේදී නික ශාකයේ කොළ, පොතු, මුල්, මල්, ගෙඩි ආදිය භාවිතා කරයි.
- නික වාතය සහ වේදනාවන් සමනය කරන, ඉදිමම් නසන, ආර්තවය ජනනය කරන, මුත්‍රකාරක, කුෂ්ඨ සහ පණු රෝග නසන, වණ ශෝධනය සහ රෝපණය කරන ගුණ සහිතයි.
- නිර්ගුණ්ඩියාදී තෛලය, නිර්ගුන්ඩි කෂාය නික යොදා නිපදවන ඖෂධයන්ය.

## යෝග

- වාත රෝග අවස්ථා සහ වේදනාවන්ට නික මුල් හෝ මුලේ පොතු යෙදූ කෂාය දීම සහ නික කොළ පොට්ටනියෙන් තැවීම සිදු කරයි.
- ආමවාතය නිසා හටගත් ඉදිමුම් සඳහා නික කොළ කොටා මලවා මඳ උණුසුමින් බැඳීම හා මුල් හෝ කොළ කෂාය යොදා ප්‍රතිකාර කරයි.
- ගෘධ්‍රසියට කොළ කෂාය දෙයි.
- දද, වණ සහ චර්ම රෝගවලට කොළ තම්බා සේදීම, යුෂ ආලේප කිරීම, ගෙඩි ස්වරසය ප්‍රලේප කිරීම, මල් ප්‍රලේපය තැවරීම ආදිය ගුණදායකය.
- නික කොළ තම්බාගත් ජලය ඇස් රෝගවලදී ඇස් සේදීමටත්, චර්ම රෝගවලදී අදාල ස්ථානය සේදීමටත් භාවිතා කරයි. නික පත්‍ර ස්වරසය කල්ගතවූ පණුවන් සහිත වණ යෙදීමට යොදා ගනී. වණ නිසා හටගත් ඉදිමුම් සහ ගෙඩි ඉහිරවීමට නික මල් ප්‍රලේපය යොදයි. කොළ යුෂ යොදා සිඳ ගත් තෙල් කණේ රෝගවලදී භාවිතා කරයි.
- නික කොළ තැම්බූ වතුරින් නෑම සහ ඇඟ තැවීම අලුත දරුවන් ලැබූ මව්වරුන්ට මෙන්ම වාත රෝ්ගවලින් පෙලෙන අයට ඉතාමත් ගුණදායකය.
- නික මුල් කලං 12 කෂාය හන්දිපත් වේදනා, අතපය රුදා, තුනටිය අමාරු වැනි රෝග පීඩාවලින් පෙළෙන අයට මහඟු ඔසුවකි.
- නික, පාවට්ටා, එඬරු කොළ, ඉඟුරු, සුදුළූනු කොට්ට පොල් සමව ගෙන පොට්ටනි බැඳ තම්බා මඳ රස්නෙන් ඇඟ තැවීමෙන් තුනටිය වේදනා, හන්දි අමාරු සහ ඉදිමුම්වලට සහනදායී ප්‍රතිකාරයකි.
- දරුවකු බිහි කළ මවක් ප්‍රසූතියෙන් පසුව අධික උණ වේදනාවකින් පීඩා විඳින විට අඟු, කොහොඹ, කරපිංචා නැටි, ආඩතෝඩ, සුදුළූනු, නික මුල්, ඉඟුරු කළං එකයි මංචාඩි 14 බැගින් ගෙන පත 8 එකට සිඳුවා කෂායක් සාදා උදේ භාගයයි සවස භාගයයි බීමට දීම ප්‍රත්‍යක්ෂ ප්‍රතිකාරයකි.
- ඇඟ සීතල කරන උණටත් මේ කෂාය ගුණදායක ය. කුඩා දරුවන්ගේ කටේ දත් එන කාලයේදී ඇති වන වේදනාවන් සහ නොසන්සුන් බවට නැගෙනහිර දිශාවට වැඩුණු අත්තක් ඇති සුදු මල් පිපෙන නික ශාකයක මුල් කැබැල්ලක් සුරයක් සේ දරුවගේ බෙල්ලේ එල්ලීම අතීතයේ බහුලව භාවිත කළ කෙම් ක්‍රමයකි.